සේවක අර්ථසාධක අරමුදල
ஊழியர் சேமலாப நிதியம்
Employees' Provident Fund

# 2019

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

ප්‍රකාශනය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01

මුද්‍රණය: සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම

# අන්තර්ගතය
# உள்ளே
# CONTENTS

1 - 110
සිංහල

111 - 216
தமிழ

217 - 321
English

322 - 332
සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය
புள்ளிவிவர இணைப்பு
Statistical Appendix

## සේවක අර්ථසාධක අරමුදල

# වාර්ෂික වාර්තාව

# 2019

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන රුපියල් ට්‍රිලියන 2.5 ක් ඉක්මවූ වත්කමක් පාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල විසින්, එහි වත්කම් පදනමෙහි අඛණ්ඩ වර්ධනය 2019 වසරේ දී ද තවදුරටත් පවත්වා ගන්නා ලදී. එසේම, අරමුදල විසින් සිය සාමාජිකයන් වෙත සපයන සේවාවන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ සාමාජිකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීමට මෙන්ම අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට සමත් විය. ඒ අනුව, අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකම 2018 වසර අග වාර්තා වූ රුපියල් බිලියන 2,289 ට සාපේක්ෂව 2019 වසර අගදී රුපියල් බිලියන 2,540 ක් දක්වා සියයට 11.0 කින් වර්ධනය විය. වර්ෂය තුළ දී, සේවක අර්ථසාධක අරමුදල එහි සුරක්ෂිතභාවය සහ වර්ධනය පවත්වා ගනිමින් එහි සාමාජිකයන්ට ඵලදායී සේවාවන් රැසක් සමඟ ඉහළම විශ්‍රාම ප්‍රතිලාභ සපයන ලදී.

සේවක අර්ථසාධක අරමුදල විසින් සිය අරමුදල් කළමනාකරණ කාර්යයන් සාර්ථක ලෙස මෙහෙයවමින් රුපියල් බිලියන 259 ක ආදායමක් උපයා ගැනීමට 2019 වසරේ දී සමත් විය. ඒ අනුව, අරමුදලේ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 2,549 ක් දක්වා ළඟා විය. එසේම, වෙළෙඳපොළ පොලී අනුපාතවල පැවති ඉහළ උච්චාවචනයන් යටතේ වුව ද සේවක අර්ථසාධක අරමුදලට සිය සාමාජිකයන් හට සියයට 9.25 ක ආකර්ෂණීය ප්‍රතිලාභ අනුපාතයක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

# පටුන

කොටස අ

## ආයතනික භාරකාරත්වය


මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය 1
කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය 3
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 5
නියාමන රාමුව 7
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ කාර්යභාරය 8
කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය 9


කොටස ආ

## ආයතනික විශ්ලේෂණය


දැක්ම හා මෙහෙවර 12
ගමන්මගෙහි මංසළකුණු 14
මූල්‍ය තොරතුරු - 2019 17
මෙහෙයුම් තොරතුරු - 2019 21
ආර්ථික සමාලෝචනය - 2019 23
සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2019 29


කොටස ඇ

## මූල්‍ය ප්‍රකාශ


ආදායම් හා වියදම් ප්‍රකාශනය 43
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 44
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 45
ලැබීම් හා ගෙවීම් ගිණුම 46
ආයෝජන ප්‍රකාශනය 47
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 48
හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයින්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය 49
මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් 50


කොටස ඈ


## විගණකාධිපති වාර්තාව 103


කොටස ඉ

## සංඛ්‍යා සටහන් හා අතිරේක තොරතුරු


1. ආයෝජන, කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභ (1990 - 2019) 325
2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1990 - 2019) 326
3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1990 - 2019) 327
4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශනය (1990 - 2019) 328
5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1990 - 2019) 329
6. සංක්ෂිප්ත ආදායම් හා වියදම් ගිණුම් ප්‍රකාශනය (1995 - 2019) 330
7. පැහැදිලි කිරීම 333

'අ' කොටස

# ආයතනික භාරකාරත්වය











# මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ./අරමුදල) 2019 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයට අයත් තම සාමාජිකයින්ට සියයට 6.4 ක ආකර්ශනීය මූර්ත ප්‍රතිලාභ අනුපාතිකයක් ලබා දෙමින් සතුටුදායක ප්‍රගතියක් සහිත තවත් වසරක් සනිටුහන් කිරීමට සේ.අ.අ. ට හැකි විය. 2018 වර්ෂය අවසන් වනවිට සේ.අ.අ. විසින් රුපියල් බිලියන 2,540.4 කට අධික වත්කම් සහ මිලියන 19.0 ක සාමාජික ගිණුම් කළමනාකරණය කරනු ලබන අතර, එය රටේ සමස්ත මූල්‍ය පද්ධතියෙහි වත්කම් ප්‍රමාණයෙන් සියයට 12.6 ක් නියෝජනය කරනු ලබයි. එමෙන්ම, සලකා බලනු ලබන වර්ෂය තුළදී සේ.අ.අ. විසින් පිළිවෙලින් රුපියල් බිලියන 30.9 ක හා රුපියල් බිලියන 259.0 ක ශුද්ධ සාමාජික දායක මුදල් හා ආයෝජන ආදායම් උත්පාදනය කරනු ලැබූ අතර, එය අරමුදලේ සමස්ත වත්කම් වල සියයට 11.0 ක වර්ධනයක් පෙන්නුම් කිරීමට දායක විය.

පෙර වසරේ පැවති සියයට 3.3 හා සැසඳීමේදී 2019 දී සියයට 2.3 ක් වූ දළ දේශීය නිෂ්පාදිතයක් සහිතව ශ්‍රී ලංකාවේ ආර්ථිකය මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලදී. මෙම අඩු වර්ධනයට ප්‍රධාන වශයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා සංචාරක ක්ෂේත්‍රයට ඇති වූ බලපෑම සහ 2019 දී කෘෂිකාර්මික අංශයට බලපෑ අහිතකර කාලගුණික තත්ත්වය හේතු විය. කෙසේ වෙතත්, රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන, කර්මාන්ත අංශයේ වර්ධනයට ඉවහල් විය. 2019 වසරේ දී දේශීය හා ගෝලීය ප්‍රවණතා වලට ප්‍රතිචාර දක්වමින් විවිධ ආයෝජන ගෙවීම් හමුවේ යම් තාවකාලික විචලතාවක් පෙන්නුම් කළ ද ජංගම ගිණුමේ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් විනිමය අනුපාතිකය සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.

මේ අතර, ප්‍රධාන ණය ශ්‍රේණි ගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉදිරි දැක්ම 2019 වසරේ දී පහත හෙළනු ලැබුව ද, ණය ශ්‍රේණිගත කිරීම පවත්නා මට්ටමේම තහවුරු කරන ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ, ප්‍රතිපත්ති පොලී අනුපාතික වසර තුළ දී දෙවතාවකින්, සමස්තයක් ලෙස පදනම් අංක 100 කින් පහත වැටීම නිසා, වෙළෙඳපොළ පොලී අනුපාත 2019 වසරේ දී පහත වැටුණි. කොවිඩ් -19 තත්ත්වය හමුවේ පසුබෑමට ලක් වූ ආර්ථික තත්ත්වයන් යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින්, එතැන් සිට 2020 සහ 2021 වර්ෂ පුරාවට ද එය පවත්වා ගෙන යනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ සිට රජයේ සුරැකුම් පත් ඵලදා අනුපාතික සැළකිය යුතු ලෙස පහළ යෑමක් පෙන්නුම් කළ අතර, රජයේ අරමුදල් අවශ්‍යතා ඉහළ යා හැකි යැයි වූ අපේක්ෂාව හේතුවෙන් 2019 වසරේ අවසාන කාලයේ දී භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික වල යම් ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2019 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය, මිල ඉපැයුම් අනුපාතය සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව ගත් කළ යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ ද, එස් ඇන්ඩ් පී 20 දර්ශකය පහත වැටුණු අතර, 2019 වසර තුළ ද, 2018 වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවද, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙන් විදේශ විනිමය අඛණ්ඩව ගලා යාම සිදු විය.

2019 වර්ෂය තුළ පැවති අභියෝගකාරී මෙහෙයුම් පරිසරය සහ ගෝලීය ආර්ථිකයේ පැවති විචලතාවයන් මධ්‍යයේ වුවද, අරමුදලේ ආයෝජන මත සමස්ත ප්‍රතිලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව පදනම් අංක 32 කින් වර්ධනය විය (2019 වර්ෂයේ සියයට 10.69 ක් සහ 2018 වර්ෂයේ සියයට 10.37 ක්). තවද, යාවත්කාලීන කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය හඳුන්වා දීම හරහා ස්ථාපිත වූ මනා අභ්‍යන්තර පාලනයන් සමඟ, සේ.අ.අ. විසින් ව්‍යාපාර කොටස් වල ආයෝජන කටයුතු නැවත ආරම්භ කරන ලදී. ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගත් කළ, රුපියල් බිලියන 222.8 ක ශුද්ධ ආදායමක් ඉපයීමට සේ.අ.අ. සමත් වූ අතර, සාමාජික ගිණුම් ශේෂයන් මත සියයට 9.25 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ප්‍රකාශයට පත් කිරීමට අරමුදලට හැකි විය. එවැනි කැපී පෙනෙන හා තිරසාර කාර්යසාධනයක්, සේ.අ.අ. මෙහෙයුම් යාන්ත්‍රණය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි, කම්කරු දෙපාර්තමේන්තුවෙහි සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි අඛණ්ඩ දායකත්වය සහ සහයෝගය නොමැතිව සාක්ෂාත් කර ගත නොහැකි වනු ඇත.

අරමුදලේ සාමාජිකයන් සඳහා තෘප්තිමත් විශ්‍රාම ගැන්වීමේ මෙහෙවර සඳහා සිය කැපවීම ලබා දුන් කම්කරු දෙපාර්තමේන්තුවේ සහ සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයන්ගේ සේවය අගය කිරීමට, මුදල් මණ්ඩලය වෙනුවෙන් මම මෙය අවස්ථාවක් කර ගනිමි. සේ.අ.අ. සේවායෝජකයින් මෙන්ම සාමාජිකයින් විසින් වඩා ඉහළ විශ්‍රාම දිවියක් සඳහා ඉපැයූ දායක මුදල් කළමනාකරණය කිරීම පිළිබඳව අඛණ්ඩව විශ්වාසය ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි තබා තිබීම සම්බන්ධව සේ.අ.අ. හි සියලුම සාමාජිකයින් වෙත මුදල් මණ්ඩලයේ කෘතඥතාව මෙසේ පළ කරමි.

**දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්**
අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල් මණ්ඩලයේ සභාපති

# කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය



බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව එක්ව සේවක අර්ථසාධක අරමුදල විසින් 2019 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් නිකුත් කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් 2019 වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය නිකුත් කරනුයේ හදපිරි සතුටිනි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුත් ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් සුවබර විශ්‍රාම දිවියක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමය වශයෙන් තවදුරටත් අප සේවාවන් පුළුල් කිරීමට 2019 වර්ෂය තුළ ද හැකි වූ බව මෙම විශ්ලේෂණාත්මක වාර්තාව තොරතුරු සපයයි. සේවාලාභීන් වෙත වඩා පහසු ප්‍රවේශ අවස්ථා ඇතිවන පරිදි ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය ප්‍රාදේශීය කාර්යාල මට්ටමට ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබීම සේවාලාභී තෘප්තිය වැඩි දියුණු කිරීමට ඉවහල් වනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙසේ සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යාවස්ථාපිත වගකීම් නිසි පරිදි ඉටු කරමින් සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගනිමින් කටයුතු කිරීම සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත මාගේ කෘතඥතාව පළ කරමි.

සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව, සේව්‍ය සේවක දෙපාර්ශවයටත්, පරිපාලන හා මූල්‍ය ආයතන වල නිලධාරීන්ටත්, මෙම විෂය ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන ශිෂ්‍යයන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ටත් ප්‍රයෝජනවත් වාර්තාවක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

## 2019.12.31 දිනට

### සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

| අංශය | තනතුර | නම |
|---|---|---|
| | කම්කරු කොමසාරිස් | කේ.එල්.කේ. පෙරේරා මයා |
| ගෙවීම් | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | එල්.එම්. හේවාවිතාන මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | ඩී.පී.ඩී. සද්ධාසේන මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | පී.එම්.ඩබ්. ගමගේ මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | එන්.කේ.ජේ. ගුණරත්න මිය |
| අයකිරීම් | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ආර්.එම්.ඒ. සුගන්ධිකා මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | ඒ.එච්.එල්. පද්මිණී 'මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | ඩබ්.එම්.සී. ප්‍රියදර්ශනී 'මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | ඩී.එම්. හේවාවිතාන මිය |
| 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් | සහකාර කම්කරු කොමසාරිස් | එච්. තිරාණගම මයා |
| | සහකාර කම්කරු කොමසාරිස් | කේ.ආර්. මෙත්මා රණසිංහ මිය |
| පරිගණක | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | එම්.එන්.එච්. ධර්මවීර මයා |
| | සහකාර කම්කරු කොමසාරිස් | එන්. නවජීවනා 'මිය |
| පාලන | සහකාර කම්කරු කොමසාරිස් | ජේ.ඒ.එම්.ඕ. විජයරත්න මිය |
| මධ්‍යම ලිපිගොනු | සහකාර කම්කරු කොමසාරිස් | ජේ.ඒ. අනුෂා චන්ද්‍රසේකර මිය |
| මියගිය සාමාජික ප්‍රතිලාභ ගෙවීම් | සහකාර කම්කරු කොමසාරිස් | ඩී.එම්.එස්.යූ. දසනායක මිය |
| සැපයුම් හා ප්‍රවර්ධන | සහකාර කම්කරු කොමසාරිස් | බී.ඒ.එම්.ඒ. බාලසූරිය මිය |

### සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| අංශය | තනතුර | නම |
|---|---|---|
| අධිකාරී/සේ.අ.අ. කාර්යාලය | අධිකාරී | ඒ.පී.යූ. තිලකරත්න මයා |
| | අතිරේක අධිකාරී | ජේ.ඩී.එස්.ජේ. නානායක්කාර මයා |
| | අතිරේක අධිකාරී | එස්.සී. ගුණධීර 'මිය |
| | අතිරේක අධිකාරී | ජේ.එම්. අමීර් මයා |
| | නියෝජ්‍ය අධිකාරී | ඩබ්.එල්.එස්.ඩබ්. ජයසුන්දර මිය |
| | නියෝජ්‍ය අධිකාරී | එස්.එම්.එල්. සිරිවර්ධන මිය |
| | නියෝජ්‍ය අධිකාරී | එච්.එස්. වික්‍රමසූරිය මයා |
| | නියෝජ්‍ය අධිකාරී | ඩී.පී.ඒ.එන්.ඩී. පෙරේරා මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (ආයතනික සේවා) | එම්.ඩබ්.කේ.එස්. සිරිවර්ධන මිය |
| ආයතනික සේවා හා පරිපාලන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එස්.ඩී.එච්. ද එස්. ජීවකරත්න මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එම්.එස්. විදානගේ මයා |
| රැස්කිරීම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.ඩබ්. විමල් ශාන්ත මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඒ.ඒ. විමල් ගාමිණී මයා |
| නැවත ලියාපදිංචි කිරීමේ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.බී.එන්.ඒ. සමරනායක 'මිය |
| ජංගම දායක මුදල් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.බී.එන්.ඒ. සමරනායක 'මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.පී.ඩී. කවිරත්න මිය |
| | සහකාර අධිකාරී | කේ.එච්. ගුණසේකර මිය |

| | | |
|---|---|---|
| ගිණුම්ගත දායක මුදල් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ජී.බී.එන්.ඒ. සමරනායක මිය |
| විද්‍යුත් දායක මුදල් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එම්.වී.ඩබ්. ද සොයිසා මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ආර්.ඒ.සී.සී. රූපසිංහ මිය |
| අරමුදල් කළමනාකරණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එල්.පී.එස්. පෙරේරා මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්.එස්.එච්. කුමාරසේන මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | කේ.යූ.බී. තෙන්නකෝන් මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩී.පී. උඩුගමකෝරාල මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එල්.ඩී.එස්.ආර්. ගුණසේකර මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | වී. ප්‍රභාකරන් මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | යූ.පී. ජයසිංහ මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී .සෙන්තිල්මරන් මිය |
| | සහකාර අධිකාරී | ඩබ්.ඒ.ඩබ්.එන්. වන්නිආරච්චි මයා |
| | සහකාර අධිකාරී | ඩබ්.ඒ.ඒ.එස්. සුමනදාස මයා |
| ගිණුම් හා සැසඳීම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එම්. දිසානායක මිය |
| | සහකාර අධිකාරී | ඩබ්.ඒ.එන්.ඩී. ඩයස් මිය |
| | සහකාර අධිකාරී | ඒ.කේ. චතුරංග මයා |
| | සහකාර අධිකාරී | එම්.පී.එස්. කල්‍යාණ මයා |
| වාර්තා කළමනාකරණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩී.වයි.එස්. මහගෙදරවත්ත මිය |
| | සහකාර අධිකාරී | පී.කේ.ඩී.පී.එස්. දසනායක මිය |
| වාර්තා සංශෝධන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | කේ.එම්.ජී.සී. බණ්ඩාර මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | කේ.පී.එම්. පෙරේරා මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඊ.එම්.එස්. ඒකනායක මයා |
| නිවාස ණය අංශය | සහකාර අධිකාරී | එම්.කේ.එන්.ඩී. ධර්මදාස මයා |
| ප්‍රතිලාභ පාලන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්.පී.ඒ.සී. ද සිල්වා මිය |
| | සහකාර අධිකාරී | පී.වී.එම්. සිරිවර්ධන මිය |
| ප්‍රතිලාභ ගෙවීම් අංශය | සහකාර අධිකාරී | ජී.පී.එන්.එම්. පෙරේරා මිය |
| | සහකාර අධිකාරී | පී. ප්‍රේමසිරි මයා |
| මහජන සම්බන්ධතා, විමසීම් කවුළුව සහ ඇමතුම් මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.ඩබ්. විමල් ශාන්ත මයා |

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./අරමුදල) යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. විශ්‍රාම ප්‍රතිලාභ නොලබන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවානියුක්තිකයින් වෙත අනිවාර්යය දායක මුදල් ගෙවීමක් සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධි විධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. පනත අනුව මුදල් මණ්ඩලය විසින් තමන් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගිනි.

අරමුදලට ලැබිය යුතු අනිවාර්ය අවම මාසික දායක මුදල් ප්‍රමාණය සේවානියුක්තිකයෙකුගේ දළ ඉපැයීම් වලින් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික ඉපැයීම් වලින් සියයට 12 ක අවම ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 08 ක ප්‍රමාණයක් සේවකයා (සාමාජිකයා) විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ. තම සේවානියුක්තිකයන් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ තොරතුරු නියමිත කාලසීමාව තුළ සේ.අ.අ. වෙත එවීමට සේවායෝජකයා බැඳී සිටී.

අරමුදලෙහි විශ්‍රාමික සාමාජිකයන් හට තම වයස, (පිරිමින් වයස අවුරුදු 55 හා කාන්තාවන් වයස අවුරුදු 50) සම්පූර්ණ වීම මත ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය. එයට අමතරව ස්ථිරව රට හැර යාම, පූර්ණ දුබලතාවයට පත්වීම, විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම (කාන්තාවන් සඳහා පමණි) සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු මත ද සාමාජිකයින්ට ඔවුන්ගේ සේ.අ.අ. ගිණුම් වලින් අරමුදල් ඉවත් කර ගැනීම සඳහා අයදුම් කළ හැකිය. තවද, මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් එම සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන පහකින් නිවාස ණය ලබා ගැනීමට ද අරමුදල පහසුකම් සපයා ඇත. තවද, 2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත අනුව නිවාස ඉදිකිරීම් හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේ අරමුණින් ගිණුම් ශේෂය රු. 300,000 වැඩි සහ සේවා කාලය වසර 10 කට වැඩි දැනටමත් දායක මුදල් ගෙවමින් පවතින සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් උපරිමය රු. මිලියන 2 කට යටත්ව, සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ආදායම් රැස්කිරීම.

සාමාජික ගිණුම් පවත්වාගෙන යාම සහ සාමාජිකයන් වෙත ගිණුම් ප්‍රකාශයන් නිකුත් කිරීම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය, ගරු කම්කරු අමාත්‍යවරයාගේ හා ගරු මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා පොදු ගිණුම් පවත්වාගෙන යාම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබා ගැනීම සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික, ඇපකර ලෙස නිකුත් කිරීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු ඇමතිවරයාට සහ ගරු මුදල් ඇමතිවරයාට ඉදිරිපත් කිරීම.

සාමාජික ගිණුම් ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමින් නැවත ලියාපදිංචි කර ගැනීම.

කම්කරු කොමසාරිස් විසින් සියයට 30 ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

සාමාජික ගිණුම්, සාමාජික නම් සහ ජාතික හැඳුනුම්පත් වල ඇති වැරදි සංශෝධනය කිරීම.

## කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය

සේවායෝජකයන් හා සේවා නියුක්තියන් අරමුදල සඳහා ලියාපදිංචි කිරීම.

දායක මුදල් නොගෙවන සේවාදායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම.

සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදු කිරීම සඳහා ගෙවීම් නියෝග ලබා දීම.

අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය.

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගතිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

‘ආ’ කොටස

# ආයතනික විශ්ලේෂණය



## අපගේ දැක්ම

"සමෘද්ධිමත් විශ්‍රාම දිවියක්
සාමාජිකයන් වෙත
ලබා දීමට හැකිවන අයුරින්
කලාපයේ වඩාත් විශ්වාසදායී
විශ්‍රාම අරමුදල බවට පත්වීම"

## අපගේ මෙහෙවර

"නව්‍ය හා විචක්ෂණශීලී කළමනාකරණය තුලින් ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා කාර්යක්ෂම සේවාවක් සාමාජිකයන් වෙත ලබාදීම"



# ගමන්මගෙහි මංසලකුණු

**1958**

1958 අංක 15 දරන සේ.අ.අ. පනත බලාත්මක කිරීම.

සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් සේවකයා විසින් 4% ක් සහ සේවායෝජකයා විසින් 6% ක් ලෙස ස්ථාපිත කිරීම.

**1971**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 4% සිට 6% දක්වා සහ 6% සිට 9% දක්වා වැඩි කිරීම.

**1981**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 8% සහ 12% දක්වා තවදුරටත් වැඩි කිරීම.

**1988**

අනුමත ණය දෙන ආයතනවලින් නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ගේ සේ.අ.අ. ඇපයක් ලෙස යොදා ගැනීමට පහසුකම් සැලසීම.

**1996**

සේ.අ.අ. පරිගණක පද්ධතිය වන AS 400 පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී ස්ථාපනය කිරීම (මහ බැංකු බෝම්බ පිපිරීමෙන් පසු).

**1998**

ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සැමරුම නිමිත්තෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති ප්‍රදර්ශනයේ දී පළමුවරට දුරස්ථව 'සාමාජික ශේෂ ප්‍රකාශ' නිකුත් කිරීම.

**1999**

සේ.අ.අ. ආපසු ගෙවීමේ බලය පැවරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම.

කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මංගත සන්නිවේදන සම්බන්ධතාවය ඇති කිරීම.

ඉලෙක්ට්‍රොනිකව තීරණ ලිපි කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මාරු කිරීම ඇරඹීම.

දිස්ත්‍රික් කම්කරු කාර්යාල ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමඟ ඉලෙක්ට්‍රොනිකව සම්බන්ධ කිරීම ඇරඹීම.

**2000**

සේ.අ.අ. හිමිකම් පෑමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම.

අර්ධ වාර්ෂික සාමාජික ශේෂ ප්‍රකාශනයන් නිකුත් කිරීම.

**2001**

දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත සේ.අ.අ. ගෙවීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම.

සේ.අ.අ. දෙපාර්තමේන්තුව

# කම්කරු දෙපාර්තමේන්තුව

**2002**

සේ.අ.අ. දායක මුදල් විද්‍යුත් දායක ක්‍රමය යටතේ රැස්කිරීම ඇරඹීම.

**2006**

පොදු ලෙජර, ආයෝජන සහ තොග මොඩියුල සමඟ SAP පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීම.

**2007**

සේ.අ.අ. නිල වෙබ් අඩවිය ත්‍රෛභාෂාවෙන් දියත් කිරීම.

**2008**

සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

ශ්‍රී ලංකාවේ 60 වන නිදහස් සංවත්සරයට සමගාමීව වෙබ් සහ ජංගම දුරකථන හරහා සාමාජික ශේෂයන් සහ තොරතුරු බෙදා හැරීම දියත් කිරීම.

**2011**

ද්විත්ව කේන්ද්‍රීය පිවිසුම් ලෙජර පද්ධතියක් සහිත සාමාජික වගකීම් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම.

සේ.අ.අ. දායක මුදල් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා මංගතව ගෙවීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු. ට්‍රිලියන 1 මට්ටම කරා ළඟා වීම.

**2012**

සේ.අ.අ. පනත සංශෝධනය කිරීම සහ 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත මගින් අංක 23 A වගන්තිය එකතු කිරීම.

සාමාජිකයින් 50 ට වැඩි සේවායෝජකයින් වෙනුවෙන් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේ.අ.අ. තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම.

**2013**

දායක මුදල් ගෙවීම පැහැර හැරීම් සහ අධිකරණ නඩු අධීක්ෂණය කිරීම සඳහා නව පරිගණකගත පද්ධතියක් හඳුන්වා දීම.

**2015**

සේ.අ.අ. 30% හිමිකම් පෑමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීම.

නිවාස හා වෛද්‍යමය අරමුණු සඳහා 30% ක පූර්ණ විශ්‍රාමික ප්‍රතිලාභ නිදහස් කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

විද්‍යුත් වාර්තා ගබඩාකරණ පහසුකම් ක්‍රියාත්මක කිරීම.

**2016**

මංගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත 100% ස්වයංක්‍රීය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

**2017**

දීප ව්‍යාප්ත මහජන බැංකු ශාඛා සමඟ ඒකාබද්ධ වෙමින් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය විමධ්‍යගත කිරීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු. ට්‍රිලියන 2 මට්ටම කරා ළඟා වීම.

**2019**


850 800 750 700 650 600 550 500 450

# මූල්‍ය තොරතුරු - 2019

දායක මුදල් ලැබීම්
රු. බිලියන
157.2

සාමාජිකයින් වෙත
ගෙවූ වාර්ෂික පොළී
අනුපාතය
9.25 %

දළ ආදායම
රු. බිලියන
259.0

අරමුදලේ වටිනාකම
රු. බිලියන
2,540.4

සාමාන්‍ය ආයෝජන මත
ප්‍රතිලාභ අනුපාතිකය
10.69 %

ප්‍රතිලාභ ගෙවීම්
රු. බිලියන
126.3

මෙහෙයුම් වියදම
රු. බිලියන
1.6

සාමාජික ගිණුම් ශේෂ මත
ගෙවන ලද පොළිය
රු. බිලියන
210.4

ශුද්ධ දායක මුදල්
රු. බිලියන
30.9

වාර්ෂික බදු වියදම
රු. බිලියන
35.0

මෙහෙයුම් වියදම් මුළු
ආදායමේ
ප්‍රතිශතයක් ලෙස
0.61 %

ශුද්ධ ආදායම
රු. බිලියන
222.8


69.928
31.012

රූප සටහන 01

## අරමුදලේ වර්ධනය




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ වත්කම්(රු.බි) | 1,665 | 1,841 | 2,066 | 2,289 | 2,540 |
| වර්ධන අනුපාතිකය (දකුණු අක්ෂය) (සියයට) | 12.0 | 10.6 | 12.2 | 10.8 | 11.0 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 02

## දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු.බි) | 102.5 | 118.3 | 133.4 | 145.0 | 157.2 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු.බි) | 77.8 | 108.4 | 117.5 | 108.0 | 126.3 |
| ශුද්ධ දායක මුදල් (රු.බි) | 24.7 | 9.9 | 15.9 | 37.0 | 30.9 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 03

## සාමාජික ගිණුම් සංඛ්‍යාව




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| දායක මුදල් ගෙවන (මිලියන) | 2.6 | 2.6 | 2.8 | 2.9 | 2.9 |
| දායක මුදල් නොගෙවන (මිලියන) | 14.3 | 14.7 | 15.3 | 15.9 | 16.5 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 04

## ආයෝජන කළඹෙහි සංයුතිය




| සංයුතිය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත් (සියයට) | 92.7 | 93.1 | 91.3 | 92.2 | 93.8 |
| කොටස් (සියයට) | 5.5 | 4.6 | 4.2 | 3.3 | 3.0 |
| ණයකර සහ වෙනත් (සියයට) | 1.8 | 2.3 | 4.5 | 4.5 | 3.2 |

රජයේ සුරැකුම්පත් | කොටස් | ණයකර සහ වෙනත්

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 05

## සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභ




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| දළ ආයෝජන ආදායම (රු.බි.) | 171.5 | 192.9 | 222.6 | 222.4 | 259.0 |
| දළ ආයෝජන මත ප්‍රතිලාභ (දකුණු අක්ෂය) (සියයට) | 11.3 | 11.4 | 11.8 | 10.4 | 10.7 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 06

## සාමාජික ගිණුම්වල වර්ෂ අවසාන ශේෂ මත ගෙවූ පොලිය




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පොලී ගෙවීම් (රු. බිලියන) | 154.2 | 171.6 | 191.2 | 194.6 | 210.4 |
| පොලී අනුපාතිකය (දකුණු අක්ෂය) (සියයට) | 10.5 | 10.5 | 10.5 | 9.5 | 9.25 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 07

## සේ.අ.අ. සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොලී අනුපාතික




මූලය :සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
වාර්ෂික වාර්තාව - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව



610.46M
577.18M
501.44M
490.92M
430.60M
384.78M
331.19M
192.95M
103.69M
75.15M

# මෙහෙයුම් තොරතුරු 2019

### 2019 වසර තුළ කරනු ලැබූ ආයෝජන

- භාණ්ඩාගාර බැඳුම්කර - රු.බි. 373.8
- භාණ්ඩාගාර බිල්පත් - රු.බි. 7.6
- සාංගමික ණයකර - රු.බි. 3.3
- ස්ථාවර තැන්පතු - රු.බි. 46.0

### 2019 අවසන් වන විට :

- සාමාජික ගිණුම් - මිලියන 19.4
- සක්‍රිය සාමාජික ගිණුම් - මිලියන 2.9
- සේවායෝජකයින් - 94,171
- ජාතික හැඳුනුම්පතේ නමට අනුව නැවත ලියාපදිංචි වූ සාමාජිකයින් - මිලියන 1.98
- නිවාස ණය ඇප සහතික නිකුත් කළ සාමාජිකයින් ගණන - 10,022

### විශ්‍රාමික ප්‍රතිලාභ :

- වටිනාකම - රු. බිලියන 126.3
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 241,581

### පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ :

- වටිනාකම - රු. බිලියන 15.2
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - රු. මිලියන 29,646

### විද්‍යුත් දායක මුදල් ක්‍රමය :

- ලියාපදිංචි සේවායෝජකයින් - 9,267 (2019 අවසන් වනවිට)
- සක්‍රිය සාමාජික ගිණුම් වලින් සියයට 79ක්
- මුළු මාසික සේ.අ.අ. දායකත්වයෙන් සියයට 88ක්

### සේවායෝජක, සාමාජික සහ වෙනත් පාර්ශවකරුවන්ගේ විමසීම් :

- පැමිණීම් - 156,898
- ලිපි - 84,550
- දුරකථන ඇමතුම් - 77,310
- විද්‍යුත් තැපැල් - 8,713

### දැනුම්වත් කිරීමේ වැඩසටහන් :

- ප්‍රධාන වැඩසටහන් - 02
- ජංගම සේවා - 16

### කම්කරු දෙපාර්තමේන්තුව :

- සාමාජික ගැටලු නිරාකරණය වෙනුවෙන් : දිවයින පුරා ජංගම සේවා පැවැත්වීම, අත් පත්‍රිකා බෙදීම, විවිධ වැඩසටහන් පැවැත්වීම
- දැනුම්වත් කිරීමේ වැඩසටහන් : රූපවාහිනී දැන්වීම්, ගුවන්විදුලි දැන්වීම්

1

# ආර්ථික සමාලෝචනය - 2019

## 1.1 ආර්ථික වර්ධනය හා සාර්ව ආර්ථික තත්ත්වය

ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වර්ෂයේ දී වාර්තා කළ සියයට 3.3 ක වර්ධන වේගයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 2.3 ක අඩු වර්ධනයක් වාර්තා කළේය. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 57.4 ක් නියෝජනය වන සේවා අංශය, 2018 වසරේ වර්තා වූ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 2.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී. පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් මන්දගාමී වූ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් අඩාල වීම හේතුවෙන් සේවා අංශය අඩු වර්ධන වේගයක් වාර්තා කළේය. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 26.4 ක් නියෝජනය වන කර්මාන්ත අංශය, පසුගිය වසරේ වාර්තා කරන ලද සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 2.7 ක වර්ධනයක් වාර්තා කළේය. ඉදිකිරීම් සහ පතල් හා කැනීම්, රෙදිපිළි ඇගලුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන සහ ආහාර උප අංශයන්හි දක්නට ලැබුණු හිතකර වර්ධනය කර්මාන්ත අංශයේ වර්ධනයට දායක විය. මේ අතර, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7.0 ක් නියෝජනය වන කෘෂිකාර්මික අංශය දැඩි අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන්, 2018 වසරේ දී වාර්තා කළ සියයට 6.5 ට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 0.6 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.

## 1.2 උද්ධමනය සහ පොලී අනුපාත

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද. (CCPI), 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2018 වසර අවසානයේ පැවති සියයට 2.8 ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට සියයට 4.8 දක්වා වර්ධනය විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය මෙම වසර තුළ දී වැඩි

රූප සටහන 08
මූර්ත ද.දේ.නි.යෙහි වාර්ෂික වර්ධනය




මූලය : වාර්ෂික වාර්තාව - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 09
වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය
(කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද : 2013=100)




මූලය : වාර්ෂික වාර්තාව - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් මිල ඉහළ යෑම් පෙන්නුම් කළ ආහාර කාණ්ඩයේ හැසිරීම බොහෝ විට පිළිබිඹු කරන ලදී. 2019 වසරේ ජූනි සහ අගෝස්තු මාස තුළ යම්තාක් දුරකට අඩු වීමට පෙර, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් මනිනු ලබන උද්ධමනය, ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2019 පෙබරවාරි මස වනවිට සියයට 6.2 දක්වා වැඩි විය. ඉන් අනතුරුව, අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දේශීය ආහාර සැපයුම අඩාල වීම නිසා, වසරේ දෙවන භාගය දක්වා උද්ධමනය සියයට 5.0 ක් පමණ මට්ටමක පැවතුණි. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද. (NCPI), 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2018 දෙසැම්බර් මාසයේ පැවති සියයට 0.4 ට සාපේක්ෂව 2019 දෙසැම්බර් මාසය වනවිට සියයට 6.2 දක්වා වේගවත් විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ආහාර කාණ්ඩය සඳහා ඉහළ බර තැබීම සහ ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සාපේක්ෂව ජාතික පාරිභෝගික මිල දර්ශකය ඉහළ ගියේය.

මේ අතර, උද්ධමනයේ යටිදැර ප්‍රවණතා පිළිබිඹු කරන මූලික උද්ධමනය 2019 වසරේ දී පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2018 වසරේ වාර්තා කළ සියයට 3.1 ක අගය හා සාපේක්ෂව 2019 දෙසැම්බර් මාසය අවසානයේ සියයට 4.8 ක් විය. ජාතික පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2018 අවසන් වනවිට සියයට 3.1 ක් වූ අතර, එය 2019 අවසන් වනවිට සියයට 5.2 දක්වා ඉහළ ගියේය.

## 1.3. මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

මන්දගාමී ආර්ථික ක්‍රියාකාරීත්වය, අඩු උද්ධමනය හා හිතකර උද්ධමන අපේක්ෂා හා පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනයේ පහළ යෑම මධ්‍යයේ ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසර තුළ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය. දේශීය මුදල් වෙළෙඳපොළ තුළ පැවති

රූප සටහන 10
වාණිජ බැංකු ණය හා තැන්පතු අනුපාතික




මූලය : වාර්ෂික වාර්තාව - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව

අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය පියවා ගැනීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 මාර්තු මාසයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය තවදුරටත් සියයට 1.00 කින් අඩු කරන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමේ හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළෙඳපොළට ඉදිරි මාර්ගෝපදේශයන් සැපයීමෙන් අනතුරුව, 2019 මැයි මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙලින්, සියයට 7.50 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50 බැගින් අඩු කළේය. ඉන් පසුව අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් පදනම් අංක 50 කින්, පිළිවෙලින් සියයට 7.00 සහ සියයට 8.00 දක්වා අඩු කළේය. වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ යෑමේ දැඩි මන්දගාමී තත්ත්වයන් පෙන්නුම් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීමට සිදු විය. මීට අමතරව, තැන්පතු මත පිරිනමන ඉහළ පොලී අනුපාතික වෙළෙඳපොළ පොලී අනුපාතික පහත හෙළීමට බාධාවක් වූ බැවින් තැන්පතු පොලී අනුපාතික මත උපරිම සීමාවන් පැනවීමට මහ බැංකුවට සිදු විය.

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබිඹු කරමින්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය

(AWCMR) 2018 වසර අවසානයේ පැවති සියයට 8.95 සිට 2019 වසර අවසානය වනවිට සියයට 7.45 දක්වා පදනම් අංක 150 කින් අඩු විය. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතු වලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) 2019 අප්‍රේල් මාසය අවසානයේ දී පැවති සියයට 8.97 සිට 2019 අවසන් වන විට පදනම් අංක 77 කින් සියයට 8.20 ක් දක්වා පහළ ගියේය. 2019 සැප්තැම්බර් මාසයේ දී ණය පොලී අනුපාතික සඳහා උපරිම සීමා පැනවීමත් සමඟ එතෙක් මන්දගාමීව සිදු වූ වාණිජ බැංකු පොලී අනුපාතික පහළ යෑම, සැළකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2018 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන් හට ලබා දෙන කෙටිකාලීන ණය හා අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම්ව සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය 2018 වසර අවසන් වනවිට වාර්තා වූ සියයට 12.09 සිට 2019 වසර අවසන් වන විට පදනම් අංක 235 කින් සියයට 9.74 ක් දක්වා අඩු විය. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවතින සමස්ත ණය හා අත්තිකාරම් මත පදනම්ව ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ණය අනුපාතිකය 2019 දී පදනම් අංක 81 කින් සියයට 13.59 ක් දක්වා පහළ ගියේය.

රාජ්‍ය ආදායම පහත වැටීම සහ රජයේ වියදම් වැඩිවීම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග අරමුණු කරගත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය 2019 දී සැලකිය යුතු අභියෝගයන්ට ලක් විය. 2019 වසර සඳහා වන රජයේ අයවැය 2019 අප්‍රේල් 5 වන දින සම්මත කරන ලද අතර, ඒ අනුව අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2018 දී වාර්තා කළ සියයට 5.3 ක හිඟයට සාපේක්ෂව සිට 2019 දී අයවැය හිඟය සියයට 4.4 දක්වා අඩු කිරීමට අරමුණු කෙරිණ. කෙසේ වෙතත්, 2019 වසරේ දී අයවැය හිඟය සියයට 6.8 ක් දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් මෝටර් වාහන ආනයන මත අයකරන නිෂ්පාදන බදු වලින් ලද ආදායම අඩු වීම, එකතු කළ අගය මත බද්ද, සෙස් සහ වරාය හා ගුවන්තොටුපොළ බදු අඩුවීම හේතුවෙන් රජයේ ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 13.4 සිට 2019 වසරේ සියයට 12.6 ක් දක්වා අඩු විය. මේ අතර රජයේ සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් 2018 වසරේ පැවති සියයට 18.7 සිට 2019 වසරේදී සියයට 19.4 දක්වා වැඩි විය.

2019 වසරේ අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී රජය වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණි. ඒ අනුව, සමස්ත මූල්‍යන අවශ්‍යතාවයෙන් සියයට 69.1 ශුද්ධ දේශීය මූල්‍යනය මගින් සපුරා ඇති අතර, ඉතිරිය විදේශීය මූලාශ්‍රයන්ගෙන් සපුරා ඇත. නාමික වශයෙන් ගත් කළ, ශුද්ධ දේශීය මූල්‍යනය 2018 වසරේ පැවති රුපියල් බිලියන 437.2 ට සාපේක්ෂව 2019 වසර අවසානයේ රුපියල් බිලියන 702.4 ක් දක්වා සියයට 60.6 කින් ඉහළ ගියේය. ශුද්ධ දේශීය මූල්‍යකරණය තුළ, බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය සමස්ත ශුද්ධ දේශිය මූල්‍යනයේ ප්‍රතිශතයක් ලෙස 2018 පැවති සියයට 75.0 ට සාපේක්ෂව (රුපියල් බිලියන 327.8) 2019 වසරේ සියයට 72.5 ක් දක්වා අඩු විය (රුපියල් බිලියන 509.3). බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය, 2019 වසරේ දී සමස්ත දේශීය ණය ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 27.5 (රුපියල් බිලියන 193.1) වූ අතර, එය 2018 වසරේ දී සියයට 25.0 (රුපියල් බිලියන 190.5) ලෙස සටහන් විය.

## 1.4. වැටුප් හා විරැකියාව

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු රට තුළ පැවති මන්දගාමී ආර්ථික තත්ත්වය මත 2019 වසරේ සමස්ත සේවා වියුක්ති අනුපාතය 2018 පැවති සියයට 4.4 සිට 4.8 දක්වා ඉහළ ගිය අතර, එය 2010 වසරට පසු වාර්තා වූ ඉහළ ම අගයයි. ඒ අනුව, වසර තුළ දී ස්ත්‍රී මෙන්ම පුරුෂ සේවා වියුක්තිය ද ඉහළ ගියේය. 2019 වසරේ දී රාජ්‍ය, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික යන සියලු අංශවල නාමික වැටුප් ඉහළ ගියේය. රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2016 = 100)

සිංහල

වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2018 වසරට සාපේක්ෂව 2019 දී සියයට 4.7 කින් ඉහළ ගියේය. එමෙන්ම පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (1978 දෙසැම්බර් = 100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ද 2019 දී සියයට 2.9 කින් ඉහළ ගියේය. මේ අනුව, අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012 = 100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් 2018 වසරේ වාර්තා වූ සියයට 13.2 ක ඉහළ යෑමට සාපේක්ෂව 2019 වසර තුළ දී සියයට 6.2 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ රාජ්‍ය සහ අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ථ වැටුප් සුළු වශයෙන් ඉහළ ගිය අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ථ වැටුප් වල අඩු වීමක් පෙන්නුම් කළේය.

## 1.5. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සහ ඵලදා අනුපාතවල චලනයන්

ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තිය, අතිරික්ත ද්‍රවශීලතාවය, 2019 මාර්තු සහ ජූනි මාසවලදී නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වලින් ලද මුදල් සමග විදේශීය මූල්‍යන පහසුකම් පැවතීම සහ අඩු උද්ධමනකාරී තත්ත්වය පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික වර්ෂය තුළ දී සැලකිය යුතු පහළ යෑමක් පෙන්නුම් කළේය.

දින 91, දින 182 හා දින 364 ක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතික 2018 වසර අවසානයේ පැවති මට්ටම හා සැසඳීමේදී 2019 අවසානයේ, පිළිවෙලින් පදනම් අංක 250, පදනම් අංක 197, සහ පදනම් අංක 275 කින්, සියයට 7.51, සියයට 8.02 සහ සියයට 8.45 ක් දක්වා අඩු විය.

එමෙන්ම, 2019 වර්ෂය තුළ දී, කෙටිකාලීන හා මැදිකාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික පදනම් අංක

රූප සටහන 11
**රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය**




මූලය : වාර්ෂික වාර්තාව - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව

182-223 කින් පමණ අඩු වී ඇති අතර, ප්‍රාථමික වෙළෙඳපොළේ දිගුකාලීන කල්පිරීම් සහිත බැඳුම්කරවල ඵලදා අනුපාතික පදනම් අංක 131-200 ක පමණ අගයකින් අඩු වීමත් සමග ප්‍රාථමික වෙළෙඳපොළ තුළ සමස්ත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය.

රජය විසින් 2019 වර්ෂයේ පළමු භාගය තුළ දී කෙටි හා මැදිකාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, වසර 10-20 දක්වා වන දීර්ඝ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර වැඩි වශයෙන් 2019 වර්ෂයේ දෙවන භාගයේ දී නිකුත් කරන ලදී.

ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකවල පහළ යෑම පිළිබිඹු කරමින් 2019 වසර තුළ රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතියික වෙළෙඳපොළ ඵලදා වක්‍රය කෙටි හා මැදිකාලීන අනුපාතිකයන්හි වැඩි පහළ යෑම පිළිබිඹු කරමින් පහළට විතැන් විය.

## 1.6. සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ

2019 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළේ (CSE) ලැයිස්තුගත සමාගම් 15 ක් විසින් පෙර වසරේ වූ රුපියල් බිලියන 55.9 හා සැසඳීමේදී රුපියල් බිලියන 57.9 ක ආයතනික ණයකර වටිනාකමකින් යුතු ණයකර නිකුත් කිරීම් 30 ක් සිදු කර ඇති අතර, ණයකර ලැයිස්තුගත කළ සමාගම් 15 න් ආයතන 10 ක් බැංකු හා වෙනත් මූල්‍ය ආයතන විය. ස්ථාවර පොලී අනුපාත සහිත ණයකර 2018 පැවති සියයට 12.00 - 14.45

පරාසයට සාපේක්ෂව 2019 වසර තුළ දී සියයට 12.30 - 15.50 පරාසයක පැවතුණි.

## 1.7. කොළඹ කොටස් හුවමාරුව

2018 වසරේ දී වාර්තා වූ සියයට 5.0 ක පහත වැටීමට සාපේක්ෂව 2019 වසරේ දී සමස්ත කොටස් මිල දර්ශකය සියයට 1.3 කින් වර්ධනය වූ අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL 20), 2018 දී වාර්තා වූ සියයට 14.6ක පහත වැටීමට සාපේක්ෂව 2019 දී සියයට 6.3 කින් පහත වැටුණි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව සමස්ත කොටස් මිල දර්ශකයේ දර්ශණ අගය 5,200 මට්ටම දක්වා පහත වැටුනු අතර, එය සියයට 3.6 ක පහත වැටීමකි. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගය වන විට ජනාධිපතිවරණය ආශ්‍රිත ආයෝජනයන් තුළ ඇති වූ ධනාත්මක ආයෝජන ආකල්පයන් හේතුවෙන් කොටස් වෙළෙඳපොළ ක්‍රමානුකූලව වර්ධනය විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2018 වසරේ පැවති රුපියල් බිලියන 2,839.5 සිට 2019 වසර අවසානය වනවිට රුපියල් බිලියන 2,851.3 දක්වා සියයට 0.4 ක සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමස්ත වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2019 අග වනවිට සියයට 21.5 ක් විය. විදේශ අරමුදල් ගලා යාම් දෙවන වසරටත් අඛණ්ඩව සිදු වූ අතර, ශුද්ධ විදේශ ගලා යෑම් 2019 දී රුපියල් බිලියන 11.7 කි. 2019 වර්ෂය තුළ ප්‍රාථමික වෙළෙඳපොළේ මූලික මහජන නිකුතු නොතිබුණ ද හිමිකම් නිකුතු 18 ක් හරහා රුපියල් බිලියන 31.0 ක් සමාගම් විසින් රැස්කර ගන්නා ලදී.

රූප සටහන 12
**සමස්ත කොටස් මිල දර්ශකයෙහි සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයෙහි විචලනය**




මූලය : බ්ලූම්බර්ග් (Bloomberg)

2

# සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2019

## 2. හැඳින්වීම

2019 වසර අවසානයේ දී අරමුදලෙහි මුළු ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 2,540.4 ක් ලෙස වාර්තා වූ අතර, මෙය 2018 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,289.4 හා සැසඳීමේ දී සියයට 11.0 ක වර්ධනයකි. 2019 අවසන් වනවිට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 19.39 ක් විය. සක්‍රිය සාමාජික ගිණුම් ප්‍රමාණය 2019 වසර අවසන් වනවිට මිලියන 2.91 ක් විය. එය 2018 වසරේ මිලියන 2.85 සමඟ සසඳන විට සියයට 2.3 ක වර්ධනයක් වූ අතර, අක්‍රිය සාමාජික ගිණුම් සංඛ්‍යාව 2018 වසරේ වාර්තා වූ මිලියන 15.85 ට සාපේක්ෂව 2019 වසර අගවන විට මිලියන 16.45 ක් විය. ඒ අතර, දායක සේවායෝජකයින් සංඛ්‍යාව 2018 අවසන් වනවිට වාර්තා වූ 86,203 සිට 2019 අවසානයේ දී 94,171 දක්වා සියයට 9.2 කින් වර්ධනය විය.

## 2.1 සාමාජික දායකත්ව හා අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

2019 වසරේ දායක මුදල් ලැබීම් 2018 වසරේ දී පැවති රුපියල් බිලියන 145.0 සිට රුපියල් බිලියන 157.2 දක්වා සියයට 8.5 කින් වර්ධනය විය. 2019 වසරේ දී සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය උරුමකරුවන්ට ගෙවන ලද ප්‍රතිලාභ, සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් ද ඇතුළත්ව රුපියල් බිලියන 126.3 ක් වූ අතර, එය 2018 වසරේ ගෙවූ රුපියල් බිලියන 108.0 ට සාපේක්ෂව සියයට 17.0 ක වර්ධනයකි. 2019 දී සිදු කරන ලද මුළු මුදල් ආපසු ගෙවීම් සංඛ්‍යාව 241,581 ක් වූ අතර, එය 2018 දී වාර්තා වූ 241,190 ට සාපේක්ෂව සියයට 0.2 ක වැඩිවීමකි. ඒ අනුව, ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 37.0 ට සාපේක්ෂව රුපියල් බිලියන 30.9 දක්වා සියයට 16.4 ක අඩු වීමක් වාර්තා විය. පසුගිය වසරට සාපේක්ෂව, ශුද්ධ දායක මුදල්වල අඩු වීමට ප්‍රධානතම හේතුව වූයේ දායක මුදල් ලැබීමේ වර්ධනයේ අඩු වීමයි. මුළු සියයට 30 ප්‍රතිලාභ ගෙවීම රුපියල් බිලියන 15.2 ක් වූ අතර, අනෙකුත් මුළු ප්‍රතිලාභ ගෙවීම රුපියල් බිලියන 111.1 ක් විය. 2019 වසර අවසාන වනවිට සියයට 30 ප්‍රතිලාභ ගෙවීම්වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 88.3 ක් විය. විශ්‍රාම දිවියට එළඹීම හේතුවෙන් සාමාජිකයන් සඳහා රුපියල් බිලියන 87.5 ක ප්‍රතිලාභ 2019 වසරේ දී ගෙවූ අතර, එය 2018 වසරේ ගෙවූ රුපියල් බිලියන 74.2 ට සාපේක්ෂව සියයට 17.9 ක වැඩි වීමකි. විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වූ සාමාජිකාවන් සඳහා ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 7.0 ක් ලෙස 2018 වසරේ දී වාර්තා වූ අගයට සාපේක්ෂව 2019 වසරේ දී රුපියල් බිලියන 8.0 දක්වා සියයට 14.3 කින් ඉහළ ගොස් ඇත. සංඛ්‍යා සටහන 01 හි දැක්වෙන පරිදි ගෙවූ

**සංඛ්‍යා සටහන 1** **සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් සංයුතිය**

| ප්‍රතිලාභ ගෙවීම් සඳහා වූ පදනම | ප්‍රතිලාභ ගෙවීම් ඉල්ලුම්පත් ගණන (අ) | | ප්‍රතිලාභ ගෙවීම් වල මුළු එකතුව (අ) | |
|---|---|---|---|---|
| | ගණන | % | අගය (රු.මි.) | % |
| විශ්‍රාමික දිවියට එළඹීම | 96,991 | 56.6 | 87,518.7 | 70.6 |
| සියයට 30 ප්‍රතිලාභ ආපසු ගැනීම් | 31,466 | 18.3 | 15,142.6 | 12.2 |
| විවාහ හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම | 23,207 | 13.5 | 8,047.7 | 6.5 |
| සාමාජිකයාගේ මරණය | 5,955 | 3.5 | 3,911.6 | 3.2 |
| වෙනත් | 13,860 | 8.1 | 9,357.2 | 7.5 |
| එකතුව | 171,479 | 100.0 | 123,977.8 | 100.0 |

(අ) මුල් ප්‍රතිලාභ ගෙවීම් සහ සියයට 30 ගෙවීම් පමණක් මෙහි ඇතුළත් වේ.

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව

ප්‍රතිලාභ වලින් වැඩි කොටසක් විශ්‍රාමික දිවියට එළඹි සාමාජිකයන් සඳහා වූ අතර, දෙවැනි වැඩිම ප්‍රතිලාභ ගෙවීම් සිදුවී ඇත්තේ සියයට 30 ප්‍රතිලාභ සඳහාය.

### 2.2. සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන කළඹ

පසුගිය කාලපරිච්ඡේදවල ප්‍රවණතාවයන්ට අනුකූලව 2019 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) රුපියල් බිලියන 2,548.7 ලෙස වාර්තා වූ අතර, එය 2018 වසරේ පැවති රුපියල් බිලියන 2,298.8 ට සාපේක්ෂව සියයට 10.9 ක වර්ධනයකි.

2019 වසරේ දී ආයෝජන කළඹෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2019 වසරේ ඉපැයූ රුපියල් බිලියන 222.8 ක් වූ ශුද්ධ ආදායම සහ රුපියල් බිලියන 30.9 ක් වූ ශුද්ධ සාමාජික දායකත්වය වේ. සමස්ත ආයෝජන කළඹ රාජ්‍ය සුරැකුම්පත්, කොටස් වෙළෙඳපොළ ආයෝජන, සාංගමික ණයකර හා ස්ථාවර තැන්පතු ඇතුළු වෙනත් කෙටිකාලීන ආයෝජන වලින් සමන්විත වේ. රජයේ සුරැකුම්පත්වල

**සංඛ්‍යා සටහන 2** **ආයෝජන කළඹෙහි සංයුතිය**

| මූල්‍ය උපකරණ අයිතමය | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| රජයේ සුරැකුම්පත් | 1,487.0 | 1,650.4 | 1,818.6 | 2,119.2 | 2,390.4 |
| කොටස් ආයෝජන | 87.6 | 80.9 | 84.3 | 74.9 | 75.4 |
| සාංගමික ණයකර | 22.6 | 34.3 | 38.7 | 43.7 | 41.9 |
| ස්ථාවර තැන්පතු | - | - | 48.0 | 33.6 | 25.0 |
| භාරකාර සහතිකපත්, ප්‍රති විකුණුම් ගනුදෙනු සහ වෙනත් ආයෝජන | 7.0 | 6.6 | 2.7 | 27.4 | 16.0 |
| එකතුව | 1,604.2 | 1,772.2 | 1,992.4 | 2,298.8 | 2,548.7 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 13** **ආයෝජන කළඹෙහි සංයුතිය 2015 - 2019**




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ආයෝජනය සංකේන්ද්‍රණය වීම, 2018 වසරේ දී පැවති මුළු ආයෝජනවලින් සියයට 92.2 සිට 2019 අග වන විටදී සියයට 93.8 දක්වා ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන සංයුතිය 2018 වසරේ දී පැවති සියයට 3.3 සිට 2019 වසරේ දී සියයට 3.0 දක්වා පහත වැටුණි. තවද, ආයෝජන කළඹින් සියයට 1.6 ක් සාංගමික ණයකරවල ආයෝජනය කර ඇති අතර, සියයට 1.0 ක් කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. එක්දින ප්‍රති විකුණුම්, කාලීන ප්‍රති විකුණුම් යන නිත්‍ය තැන්පතු පහසුකම් ද ඇතුළත් මුළු ප්‍රති විකුණුම් ගනුදෙනු සමස්ත ආයෝජන කළඹෙන් සියයට 0.6 ක් ලෙස 2019 වසර අවසානයට ගණනය කර ඇත.

### 2.2.1 රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ

භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ 2018 වසර අවසානයේ දී රුපියල් බිලියන 2,119.2 ක් වූ අතර, එය 2019 වසර අවසානයේ දී රුපියල් බිලියන 2,390.4 දක්වා සියයට 12.8 කින් වර්ධනය විය. 2019 වසරේ දී රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙන් රුපියල් බිලියන 246.4 ක පොලී ආදායමක් උපයාගෙන ඇති අතර, මෙය සේවක අර්ථසාධක අරමුදලේ මුළු පොලී ආදායමෙන් සියයට 96.7 ක් වේ. රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය 2019 වසරේ දී සියයට 9.82 ක් ලෙස වාර්තා විය. සංඛ්‍යා සටහන 03 මගින් දක්වන කල්පිරීමේ ආකෘතියෙහි පරිදි සේවක අර්ථසාධක අරමුදලෙහි දිගුකාලීන ආයෝජන කෙරෙහි පවතින නැඹුරුතාවය පිළිබිඹු කරමින් රාජ්‍ය සුරැකුම්පත් කළඹෙන් සියයට 75 කට වඩා වැඩි ප්‍රමාණයක් වසර 5 කට වඩා වැඩි කාලයක් තුළ පරිනත වීමට නියමිත සුරැකුම්පත්වලින් සමන්විත වේ.

### 2.2.2 සමාගම් කොටස් කළඹ

සමාගම් කොටස් කළඹ, ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් වලින් සමන්විත වන අතර, එය 2018 වසර අවසානයට වූ රුපියල් බිලියන 74.9 ක වටිනාකමට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට රුපියල් බිලියන 75.4 දක්වා සියයට 0.7 කින් වර්ධනය වීඇත. වෙළෙඳපොළ පදනම මත අගය කරන ලද ලැයිස්තුගත සමාගම් කොටස් කළඹ 2018 වසර අවසානය වන විට රුපියල් බිලියන 64.9 ක වටිනාකමට සාපේක්ෂව 2019 වසර අවසානය

**සංඛ්‍යා සටහන 3** **රජයේ සුරැකුම්පත් කළඹෙහි කල්පිරීම් ආකෘතිය – 2019 වසර අවසානයට**

| කල්පිරීම | නාමික අගයට කල්පිරීමේ වටිනාකම (රුපියල් මිලියන) | දායකත්ව ප්‍රතිශතය | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 117,804.5 | 4.9 | 7.96 |
| වසර 1 - 2 | 174,652.7 | 7.3 | 8.74 |
| වසර 3 - 4 | 293,388.2 | 12.3 | 9.52 |
| වසර 5 ට වැඩි | 1,804,331.7 | 75.5 | 10.09 |
| **එකතුව** | **2,390,177.1** | **100.0** | **9.82** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 14
2019 වසර අවසානයේ පැවති ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය
(වෙළඳපොල අගයට - රු. මිලියන)




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

වන විට රුපියල් බිලියන 66.3 දක්වා සියයට 2.2 කින් වැඩි වී ඇති අතර, පිරිවැය පදනම මත අගය කරන ලද ලැයිස්තුගත නොවූ සමාගම් කොටස් කළඹ පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 9.9 ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට රුපියල් බිලියන 9.1 කින් එනම් සියයට 7.8 කින් අඩු වී ඇත. මෙම ලැයිස්තුගත නොකළ සමාගම් කොටස් කළඹෙහි අඩු වීමට හේතු වී ඇත්තේ ලාෆ් පවර් සමාගමෙහි (Laugfs Power Limited) ඡන්ද සහ නිර්ඡන්ද කොටස් ලැයිස්තුගත කිරීම සහ වැලිගම හොටෙල් ප්‍රොපටි (ප්‍රයිවට්) ලිමිටඩ් (Weligama Hotel Properties (pvt) Ltd) හි කොටස් විකිණීමයි. සේ.අ.අ. මගින් කොටස් ආයෝජන කළඹක් පවත්වාගෙන යන අතර, එහි බැංකු, මූල්‍ය හා රක්ෂණ, විවිධාංගීකරණ සමාගම්, හෝටල් සහ සංචාරක, විදුලි සංදේශ සහ ඉදිකිරීම් යන විවිධ ක්ෂේත්‍රයන් යටතේ කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත ප්‍රමුඛ සමාගම්හි කොටස් අඩංගු වේ. සේ.අ.අරමුදලෙහි කොටස් ආයෝජන කළඹෙහි සියයට 52 ක් බැංකු, මූල්‍ය හා රක්ෂණ ක්ෂේත්‍රයන්හි ආයෝජනය කර ඇත. 2019 වසරේ දී සේ.අ.අ. සමාගම් කොටස් කළඹ රුපියල් බිලියන 4.4 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

### 2.2.3 සාංගමික ණය කළඹ

සේවක අර්ථසාධක අරමුදල, ආයෝජන ශ්‍රේණියට අයත් සමාගම් සහ ආයතන විසින් නිකුත් කර ඇති සාංගමික ණයකර, සුරැකුම්පත් සහතික සහ උකස් සුරැකුම්පත් යනාදී ණය උපකරණයන්හි ආයෝජනය කර ඇත. ඒ අනුව, 2019 වසරේ දී සේ.අ.අ. ඉහළ ආයෝජන ශ්‍රේණියට අයත් බැංකු ආයතන විසින් නිකුත් කරනු ලැබූ සාංගමික ණයකර නිකුතු තුනක (03) ක රුපියල් මිලියන 3,255.5 ක මුදලක් ආයෝජනය කරන ලදී. අරමුදලෙහි සාංගමික ණය කළඹ 2019 දෙසැම්බර් අග වන විට පොත් අගය රුපියල් බිලියන 41.9 ක් වූ අතර, එය මුළු ආයෝජන කළඹෙන් සියයට 1.6 ක් විය. අරමුදල සාංගමික ණය කළඹෙන් උපයන ලද පොලී ආදායම රුපියල් මිලියන 5,043.4 ක් වූ අතර, සාංගමික ණය කළඹ මත වූ සාමාන්‍ය වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය වසර තුළ දී සියයට 11.59 ක් විය.

### 2.2.4 ප්‍රතිවිකුණුම් ගනුදෙනු

අරමුදලේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා දෛනික අතිරේක අරමුදල් ප්‍රති විකුණුම්වල සහ මහ බැංකුවේ විවෘත වෙළඳපොළ ක්‍රියාකාරකම් කවුළුව තුළ ආයෝජනය කරනු ලබයි. 2018 වසරේ දී ඉපැයූ රුපියල් මිලියන 685.3 ට සාපේක්ෂව, 2019 වසරේ දී රුපියල් මිලියන 1,171.5 ක පොලී ආදායමක් ප්‍රති විකුණුම් ගනුදෙනු මඟින් උපයා ගන්නා ලදී.

### 2.2.5. ස්ථාවර තැන්පතු

මුදල් මණ්ඩලයේ විශේෂ අනුමැතිය මත සේ.අ.අ. විසින් එහි අරමුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල වසරක උපරිම පරිනත කාලයකට යටත්ව රාජ්‍ය බැංකු තුනක ආයෝජනය කරන ලදී. ඒ අනුව, 2019 වසර අවසානයට මුළු ආයෝජන කළඹින් 1.0 ක ප්‍රතිශතයක් වන රුපියල් බිලියන 25.0 ක මුදලක් ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස පැවති අතර, රුපියල් මිලියන 2,104.0 ක ස්ථාවර තැන්පතු පොලී ආදායමක් 2019 වසර තුළ දී උපයා ගන්නා ලදී.

### 2.2.6 අරමුදලේ මුළු ආයෝජන ආදායම

අරමුදල විසින් 2019 වසරේ දී රුපියල් බිලියන 259.0 ක මුළු ආයෝජන ආදායමක් උපයා ගත් අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 16.5 ක වැඩි වීමකි (සංඛ්‍යා සටහන 04). පොලී ආදායම අරමුදලේ ප්‍රධානතම ආදායම වූ අතර, එය 2018 වසරේ වූ රුපියල් බිලියන 229.4 සිට 2019 වසරේ දී රුපියල් බිලියන 254.7 දක්වා සියයට 11.0 කින් වර්ධනය විය. තවද, ප්‍රාග්ධන

**සංඛ්‍යා සටහන 4** **අරමුදලේ ආයෝජන ආදායම**

| ආදායම් මූලාශ්‍රය | 2018 | 2019 | වර්ධනය (%) |
|---|---|---|---|
| | වටිනාකම (රු.මිලියන) | වටිනාකම (රු.මිලියන) | |
| පොලිය | 229,446.0 | 254,681.0 | 11.0 |
| ලාභාංශ | 3,887.6 | 6,247.5 | 60.7 |
| උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ) | 7 .2 | 0.1 | (98.0) |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | (10,901.3) | (1,890.0) | 82.7 |
| මූල්‍ය ආයෝජන හානිකරණ | 0.6 | 0.3 | (46.0) |
| **එකතුව** | **222,440.1** | **259,038.9** | **16.5** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ලාභ සහ ලාභාංශ යන දෙකම ඇතුළත් වන කොටස් කළඹෙන් උපයන ලද උපලබ්ධි ආදායම 2018 වසරේ දී රුපියල් මිලියන 3,894.8 ක් වූ අතර, එය 2019 වසරේ දී රුපියල් මිලියන 6,247.6 ක් ලෙස සටහන් විය.

## 2.3 සේ.අ.අ. අවදානම් කළමනාකරණය සඳහා පාලන රාමුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අරමුදලේ භාරකරු ලෙස සේ.අ.අ. හි අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව, සේ.අ.අ. හි අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් පාලන ව්‍යුහයේ අනිවාර්ය අංගයක් ලෙස සැලකෙන අතර, සේ.අ.අ. හි ක්‍රියාකාරකම් ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ක්‍රියාකාරකම් වලට අදාළ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කෙරෙහි අවධානය යොමු කරයි. සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වල අවසාන තීරණ ගැනීමේ අධිකාරිය වශයෙන් මුදල් මණ්ඩලය අරමුදලෙහි ආයෝජන කටයුතු සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් සපයන අතර අරමුදල කළමනාකරණය කළ යුතු අවදානම් අභිරුචිය සහ අවදානම් දැරිය හැකි මට්ටම් වැනි සමස්ත අවදානම් පරාමිතීන් නියම කරනු ලබයි. මුදල් මණ්ඩලය සේ.අ.අ. හි අවදානම් කළමනාකරණ ව්‍යුහයේ පාලනය ශක්තිමත් කිරීම සඳහා එම කාර්යයන් ස්ථාපිත කිරීමෙහි අධීක්ෂණය, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (BROC) සහ සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව (EIOC) යන ඉහළ මට්ටමේ කමිටු දෙක හරහා සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (BROC) සතු වන අතර අරමුදල් කළමනාකරණ කටයුතුවලට අදාළ ඉහළම මට්ටමේ අධීක්ෂණ කටයුතු සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව (EIOC) මගින් සිදු කරනු ලබයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි (EIOC) කාර්යභාරය වන්නේ අරමුදල කළමනාකරණය සඳහා උපායමාර්ගික හා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් ලබා දීමෙන් සේ.අ.අ. හි ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීමයි. තවද, සේ.අ. අරමුදල් කළමනාකරණ කටයුතු වල එදිනෙදා ආයෝජන තීරණ ගැනීමේ කාර්යයට අදාළ බලතල දෙපාර්තමේන්තු මට්ටමේ කමිටුවක් වන සේ.අ.අ. ආයෝජන කමිටුවට (EIC) පවරා ඇත. සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ අංශයේ මැදි

කාර්යාලය, ප්‍රථම පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස දෛනික මෙහෙයුම් වල අවදානම අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (IPS), උපායමාර්ගික වත්කම් විභජනයන් (SAA) සහ ආයෝජන මාර්ගෝපදේශයන්හි (IG) දී ඇති පරාමිතීන්ට අනුකූලව ආයෝජන කටයුතුවල පූර්ව හා පසු අනුකූලතාවයන් අධීක්ෂණය කරනු ලැබේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව දෙවන පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරන අතර ස්වාධීන ක්‍රියාවලියක් තුළින් සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම හරහා ආයෝජන පාලන ක්‍රියාවලිය සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැපයීමේ වගකීම දරයි. ඒ අනුව, යාවත්කාලීන කළ වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුකූලව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (IPS), උපායමාර්ගික වත්කම් විභජනයන් (SAA) සහ ආයෝජන මාර්ගෝපදේශයන්හි (IG) සංශෝධනය කිරීම සහ යාවත්කාලීන කිරීම තුළින්, අදාළ ප්‍රතිපත්තිමය උපදෙස් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලට අදාළ මාර්ගෝපදේශ සැපයීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබේ. එමගින්, පවත්නා වැඩ ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් පවත්වා ගනිමින් ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියට වැඩි ස්වාධීනත්වයක් ලබා දී ඇත. තෙවන පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අවදානම් සහතිකයක් සපයනු ලබයි.

තවද, සමස්ත සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වලට අදාළ මූල්‍යමය නොවන අවදානම් තීව්‍ර කිරීම සහ විසඳීම සඳහා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (NFRMC) ලෙස වෙනම කමිටුවක් හරහා විශේෂ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. ඒ අනුව, මූල්‍යමය නොවන අවදානම් හඳුනා ගැනීම සහ සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග තීරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වරින්වර සමාලෝචනයන් පවත්වනු ලැබේ.

## 2.4 අරමුදලේ මෙහෙයුම් වියදම්

2018 වසරේ දී රුපියල් මිලියන 1,505.3 සිට 2019 වසරේ දී රුපියල් මිලියන 1,581.8 ක් දක්වා සියයට

**සංඛ්‍යා සටහන 5** — **අරමුදලේ මෙහෙයුම් වියදම්**

| අයිතමය | සේ.අ.අ. දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව | | | කම්කරු දෙපාර්තමේන්තුව | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 (රු. මිලියන) | 2019 (රු. මිලියන) | වෙනස (%) | 2018 (රු. මිලියන) | 2019 (රු. මිලියන) | වෙනස (%) | 2018 (රු. මිලියන) | 2019 (රු. මිලියන) | වෙනස (%) |
| සේවක වියදම් | 559 | 632 | 13.1 | 408 | 431 | 5.6 | 967 | 1,063 | 9.9 |
| පරිපාලන වියදම් | 284 | 235 | (17.3) | 186 | 215 | 15.6 | 470 | 450 | (4.3) |
| වෙනත් වියදම් | 59 | 60 | 1.7 | 9 | 9 | - | 68 | 69 | 1.5 |
| **එකතුව** | **902** | **927** | **2.8** | **603** | **655** | **8.6** | **1,505** | **1,582** | **5.1** |
| මුළු වියදම්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.41 | 0.36 | | 0.27 | 0.25 | | 0.68 | 0.61 | |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

5.1 කින් මෙහෙයුම් වියදම් ඉහළ යාමට සේවක වියදම්වල ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා ඇත. කෙසේ වෙතත්, දළ ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් මුළු මෙහෙයුම් වියදම 2018 වසරේ දී පැවති සියයට 0.68 ට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 0.61 දක්වා පහළ වැටී ඇත (සංඛ්‍යා සටහන 5).

## 2.5 බදු වියදම්

2018 අප්‍රේල් මස පළමු දින සිට ක්‍රියාත්මක වූ 2017 අංක 24 දරන නව දේශීය ආදායම් බදු පනත හඳුන්වාදීමත් සමඟ අරමුදලෙහි ආදායම් බදු අනුපාතය සියයට 10 සිට සියයට 14 දක්වා ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදලෙහි ආදායම් බදු වියදම පෙර වසර හා සැසඳීමේ දී රුපියල් බිලියන 4.2 කින් වැඩි විය. මීට අමතරව, පෙර පැවති ආදායම් බදු පනත යටතේ දළ ආදායමක් ලෙස හඳුනාගත් භාණ්ඩාගාර බැඳුම්කර පොලී මත සියයට 10 ක් වූ රඳවා ගැනීමේ බදු, 2018 අප්‍රේල් මස පළමු දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලී ආදායම් ලෙස හඳුනාගැනීම අහෝසි කර ඇත.

## 2.6 සාමාජික ගිණුම් ශේෂ හා ගෙවූ පොලිය

2019 වසරේ දී සමස්ත සාමාජික ගිණුම් ශේෂයන් 2018 වසරට සාපේක්ෂව සියයට 10.8 ක අගයකින් ඉහළ දමමින්, රුපියල් බිලියන 210.4 ක මුදලක් සාමාජිකයන් අතර පොලී ලෙස බෙදා දුන් අතර, සාමාජික ගිණුම් ශේෂ 2018 වසරේ පැවති රුපියල් බිලියන 2,254.2 ට සාපේක්ෂව 2019 වසරේ දී රුපියල් බිලියන 2,497.6 ක් දක්වා වර්ධනය විය. මෑත වසර වලදී පොලී අනුපාත වෙනස්වන වාතාවරණයක් පැවතිය ද 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වසර අවසානයේ පැවති සාමාජික ශේෂ මත සියයට 9.25 ක පොලී අනුපාතයක් ප්‍රකාශ කිරීමට අරමුදලට හැකි විය. එය 2018 වසරට සාපේක්ෂව සියයට 0.25 ක සුළු අඩු වීමකි.

රූප සටහන 15
සාමාජික ගිණුම් ශේෂ සහ ගෙවූ පොලිය




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.7 නිවාස ණය ඇපකර පහසුකම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා සමූපකාර ග්‍රාමීය බැංකුව යනාදී සහභාගිත්ව ණය දෙන ආයතන වලින් සාමාජිකයන්ට නිවාස ණයක් ලබා ගැනීමේ අරමුණින් 1988 වසරේ දී හඳුන්වා දුන් නිවාස ණය ක්‍රමය 2019 වසරේ දී ද, තවදුරටත් ක්‍රියාත්මක විය. නිවාස ණය ක්‍රමය යටතේ සේවක අර්ථසාධක අරමුදල මගින් 2019 වසර තුළ දී රුපියල් මිලියන 5,097 ක් වූ නිවාස ණය

සංඛ්‍යා සටහන 6 — සාමාජිකයන් වෙත ලබා දුන් නිවාස ණය ඇපකර පහසුකම

| වසර | ශේෂ සහතිකපත් | අනුමත කරන ලද නිවාස ණය මුදල (රුපියල් මිලියන) | සහභාගීත්ව ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 | 10,036 | 4.974 | 2,759 |
| 2019* | 10,022 | 5,097 | 3,164 |

*තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතිකපත් 10,022 ක ප්‍රමාණයක් ණය ලබා දෙන ආයතන වෙත ලබා දෙන ලදී. තවද, 2019 වසරේ දී 2018 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,164 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම්වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

## 2.8 නීතිය බලගැන්වීම

සේ.අ.අ. පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2019 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල විසින් නව සේවායෝජකයන් 8,973 දෙනෙක් හා නව සේවානියුක්තිකයන් 37,297 දෙනෙක්, සියලු පළාත් ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2019 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙන් සියයට 40 කට වැඩි සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් වූ අතර, උතුරු සහ නැගෙනහිර පළාත් වලින් ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන් ගණන සියයට 11.3 ක් විය.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. ඒ අනුව, දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල විසින් පිළිවෙලින් රුපියල් මිලියන 6,839 ක් හා රුපියල් මිලියන 5,231 ක් පියවා ගැනීම සඳහා මුල් නිවේදන 19,616 ක් ද, රතු නිවේදන 13,735 ක් ද නිකුත් කර ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන යවා, දින 28 ක් ඇතුළත හිඟ මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 4,235 කට එරෙහිව සිදු කළ නඩු පැවරීම තුළින් රුපියල් මිලියන 547 ක් අයකර ගෙන ඇත.

**සංඛ්‍යා සටහන 7** **නීතිය බලගැන්වීම**

| විස්තරය | | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| නව ලියාපදිංචි කිරීම | සේවායෝජකයන් | 7,213 | 6,736 | 7,134 | 7,710 | 9,243 | 8,973 |
| | සේවානියුක්තිකයන් | 296,056 | 48,007 | 34,264 | 280,079 | 37,662 | 37,297 |
| පළාත් අනුව සේවායෝජකයන් ලියාපදිංචි කිරීම (ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන්ගේ ප්‍රතිශතයක් ලෙස) | බස්නාහිර | 65.0 | 50.0 | 50.0 | 50.4 | 43.0 | 42.8 |
| | උතුරු සහ නැගෙනහිර | 3.0 | 7.0 | 6.5 | 6.3 | 15.0 | 11.3 |
| | අනෙකුත් | 32.0 | 43.0 | 43.5 | 43.3 | 42.0 | 45.9 |
| මුල් නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 12,132 | 9,015 | 10,074 | 10,888 | 13,653 | 19,616 |
| | පියවාගත් මුදල (රු.මි.) | 6,280 | 4,018 | 4,464 | 5,876 | 4,316 | 6,839 |
| රතු නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 13,578 | 5,670 | 6,508 | 6,613 | 8,364 | 13,735 |
| | පියවාගත් මුදල (රු.මි.) | 1,121 | 2,864 | 3,454 | 3,775 | 3,320 | 5,231 |
| නඩු පැවරීම | නඩු සංඛ්‍යාව | 3,397 | 6,458 | 2,622 | 3,019 | 2,831 | 4,235 |
| | අයකරගත් මුදල (රු.මි.) | 6,126 | 1,308 | 855 | 1,093 | 1,710 | 547 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් අංශය, කම්කරු දෙපාර්තමේන්තුව

## 2.9 සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

සේ.අ.අ. විසින්, වඩාත් කාර්යක්ෂම සේවාවක්, සේවකයින් සහ සේවායෝජකයින් හට ලබා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සහ අත්වැල් බඳවා ගනිමින් පුද්ගලයින් නැවත ලියාපදිංචි කිරීම සඳහා, 2010 වසරේ ආරම්භ කළ විශේෂ ව්‍යාපෘතිය, 2019 වසර තුළ දී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ජාතික හැඳුනුම්පත් තොරතුරු එක්රැස් කර, ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (Unique Identification Number) ලෙස භාවිතා කිරීමට හැකිවන ආකාරයට පහසුකම් සපයන අතර, මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (Member Centric Database) සකස් කරන ලදී. මෙම වැඩසටහන සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව යන දෙඅංශයේම සාමාජික සාමාජිකාවන්ට සේවයක් සැපයීම සඳහා ඵලදායී ලෙස සාමාජිකයන්ගේ තොරතුරු වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වේ.

2019 වසර අවසාන වනවිට ක්‍රියාකාරී සාමාජිකයින් මිලියන 1.98 කට ආසන්න සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමාන දායක මුදල් ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 81 ක් (ගිණුම් මිලියන 1.62) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ තොරතුරු තහවුරු කරමින් පවතී. තවද, නව සාමාජිකයන්ගේ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කිරීම සඳහා පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර, ඒ සඳහා සෑම මසකදීම පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රියාවලියක් ද පවත්වා ගෙන යනු ලැබේ. තවද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු (පු.ලි.දෙ.) දත්ත ගබඩාවට ප්‍රවේශය ලබා ගැනීමෙන් නැවත ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පු.ලි.දෙ. සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

## 2.10. විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම

කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් තුළ වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ සහ අදාළ සාමාජික දත්ත වාර්තා සැපයීමේ පහසුකම් සහිත විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. මූලිකව, මෙම ක්‍රමය ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වූ අතර, 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත හරහා මේ සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදනයන් ස්ථාපිත කරන ලදී. එකී ප්‍රතිපාදනයන් අනුව, සේවකයින් පනහකට වැඩි සේවායෝජකයින් සඳහා සිය සේවක අර්ථසාධක දායක මුදල් වාර්තා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සැපයීම අනිවාර්ය වේ. විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය තුළ පරිවර්තනීය වෙනසක් සිදු කරමින් 2011 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මංගත ගෙවීම් ක්‍රමය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් එක්රැස් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. එමගින් සේවායෝජකයින් මෙම ක්‍රමය සමඟ සම්බන්ධවීමේ වර්ධනීය වෙනසක් සිදු වූ අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ද වඩාත් කාර්යක්ෂම විය. එමෙන්ම, සමස්ත ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රියාදාමයන් ද මේ සමඟ වඩාත් පහසු විය. 2016 වසරේ දී, විද්‍යුත් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය එහි විශිෂ්ට තාක්ෂණික ජයග්‍රහණයක් සනිටුහන් කරමින් නියෝජිත වාණිජ බැංකු හරහා මංගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත ස්වයංකෘතව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මේ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු අටක් නියෝජිත බැංකු ලෙස දැනට සේ.අ.අ.

ගෙවීම් කරනු ලබන සිය ගනුදෙනුකරුවන් වෙත පහසුකම් සළසනු ලබයි. ඒ අතරින්, වාණිජ බැංකු හතරක් මංගත දත්ත සත්‍යාපනයක් සහිත ස්වයංක්‍රීයතව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය භාවිතයෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සහ ඒ තුළින් සේවක අර්ථසාධක අරමුදලෙහි සියලුම පාර්ශවකරුවන් හට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. ඒ අනුව, ආසන්න වශයෙන් සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 79 ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 8,540 සිට 9,267 දක්වා 2019 වසර තුළ දී වැඩි වූ අතර, අදාළ මාසික දායක මුදල් ලැබීම් සමස්ත දායක මුදලෙන් සියයට 88 ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි.

තවද, සේ.අ.අ. ගෙවීම සඳහා නව ගෙවුම් ක්‍රම හඳුන්වා දීමේ අරමුණින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා විද්‍යුත් දත්ත වාර්තා සැපයීමට හැකි වන සේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමටත්, අදාළ ගෙවීම් ඕනෑම වාණිජ බැංකුවක් හරහා ලංකා ක්ලියර් ආයතනයෙහි විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) භාවිතයෙන් සිදු කිරීමටත් හැකිවන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

## 2.11 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය, ආරම්භයේ සිට ප්‍රතිලාභ ලබන්නන් අතර ඉතා ජනප්‍රිය වූ අතර, ඒ යටතේ 155,000 ඉක්මවූ ප්‍රතිලාභීන් වෙත රුපියල් බිලියන 88.3 ක මුදලක් 2019 වසර අග වනවිට ගෙවන ලදී. එසේම 2019 වසර තුළ දී, ප්‍රතිලාභීන් 29,646 ක් වෙත රුපියල් බිලියන 15.2 ක් නිදහස් කර ඇත.

## 2.12 සේ.අ.අ. ජංගම සේවා වැඩසටහන් හා දැනුම්වත් කිරීමේ වැඩමුළු

සේ.අ.අරමුදලේ සාමාජිකයින් හට එහි සේවාවන් වඩාත් පහසුව ලබා ගැනීමේ හා මහජනතාව තුළ සේ.අ.අ. සම්බන්ධ කටයුතු පිළිබඳව ඇති දැනුම්වත්භාවය වැඩි කිරීමේ අරමුණු පෙරදැරිව 2019 වසරේ දී ද සේ.අ.අ. ජංගම සේවා වැඩසටහන් හා දැනුම්වත් කිරීමේ වැඩමුළු පවත්වන්නට යෙදුනි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ ඇති සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් ලබාගත හැකි සේවාවන් තමන් පදිංචි ප්‍රදේශයේ දී හෝ රැකියාව කරන ස්ථානයේ දී හෝ ලබා ගැනීමට හැකියාව සළසා දීම සේ.අ.අ. ජංගම සේවා වැඩසටහනක් පැවැත්වීම මගින් අපේක්ෂා කෙරේ. ශේෂ පත්‍ර නිකුත් කිරීම, සාමාජික ගිණුම් තොරතුරු සංශෝධනය කිරීම, නැවත ලියාපදිංචි කිරීමේ සේවාවන්, විද්‍යුත් දායක මුදල් යොමු කිරීමේ කටයුතු, මාර්ගගත ගිණුම් පිරික්සුම සඳහා ලියාපදිංචි කිරීමේ මූලික කටයුතු හා සේ.අ.අ. සම්බන්ධ සියලුම විමසීම් කටයුතු මෙහිදී සිදු කර ගැනීමේ හැකියාව පවතී.

2019 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් ජංගම සේවා වැඩසටහන් 16 ක් ද ප්‍රධාන පෙළේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 02 ක් ද පවත්වන්නට කටයුතු කරන ලද අතර, ඉන් ජංගම සේවා වැඩසටහන් කිහිපයක්ම කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා ඒකාබද්ධව පැවැත්වීම මගින් සේ.අ.අ. සාමාජිකයින් වෙනුවෙන් මෙන්ම අනෙකුත් මහජනතාව වෙත ද ඉහළ සේවාවක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

ඒ අතරම අනෙකුත් රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු ද, පෞද්ගලික අංශයේ ආයතන විසින් ද සංවිධානය කරනු ලැබූ ජංගම සේවා වැඩසටහන් සඳහා සහභාගීවන ලෙස කරන ලද ඉල්ලීම්වලට අනුව එම වැඩසටහන්වලදී ද පැමිණෙන මහජනතාව වෙත සේ.අ.අ. සම්බන්ධ සේවාවන් ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

ප්‍රධාන පෙළේ ජංගම සේවා වැඩසටහනක් පැවැත්වීමට පෙර ඒ සඳහා දායකත්වය දක්වන අනෙකුත් පාර්ශයන්, එනම් ආයතන ප්‍රධානීන්, පරිපාලන නිලධාරීන් හා වැඩ සටහන සම්බන්ධීකරණ නිලධාරීන් හට පවත්වන ජංගම සේවා පූර්ව දැනුම්වත් කිරීමේ වැඩසටහන මගින් අදාළ දිනයේ දී පවත්වන්නට යෙදෙන ජංගම සේවාවේදී සේවාවන් ලබා ගැනීමට පැමිණෙන සාමාජිකයින් හට නිරවුල් හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

තවදුරටත්, පවත්වන්නට යෙදෙන ජංගම සේවාව හා එමගින් ලබා ගත හැකි සේවාවන් මෙන්ම එයට සහභාගි වීමේ දී රැගෙන ආ යුතු ලිපි ලේඛන පිළිබඳව පූර්ව ප්‍රචාරණ වැඩ පිළිවෙලක් පෝස්ටර්, අත්පත්‍රිකා, දැන්වීම් පුවරු හා විද්‍යුත් ලිපි යනාදී ක්‍රම ඔස්සේ පැවැත්වීම මගින් ද ජංගම සේවාවේ ඵලදායීතාවය වැඩි කර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.

### 2.13 අනෙකුත් සේවාවන්

සේවක අර්ථසාධක අරමුදල සිය සාමාජිකයන්ට කාර්යක්ෂම සහ ඵලදායී ලෙස සේවා සැපයීම සඳහා කටයුතු කරයි. වර්තමානයේ වේගයෙන් වර්ධනය වන වටපිටාවක් තුළ සාමාජිකයන් විශිෂ්ට සේවා සැපයුමක් අපේක්ෂා කරති. මේ අනුව, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය අභියෝගාත්මක වටපිටාවක් මධ්‍යයේ වුවද සාර්ථක ලෙස තම සේවාවන් ලබා දෙන ලදී. 2019 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවාදායක පැමිණීම 156,898 ක් වාර්තා වූ අතර, දුරකථන ඇමතුම් හරහා පුද්ගලයින් 77,310 දෙනෙක් ද ඊමේල් හරහා සාමාජිකයින් 8,713 දෙනෙක් ද විමසීම් කර ඇත. තවද, 2019 වසරේ දී සාමාජිකයින්, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත ලිපි 84,550 ක් යොමු කර ඇත.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වෙත තැපැල් මගින් සහ දෙපාර්තමේන්තුවට පැමිණ භාර දෙන සාමාජිකයන් මගින් සාමාජික අංක යටතේ සංශෝධන සිදු කිරීම සඳහා ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබේ. 2019 වර්ෂය තුළ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ආසන්න වශයෙන් සාමාජික අංක යටතේ සංශෝධන 72,313 ක් පමණ සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල් සාමාජික අංක යටතේ සිදු කරනු ලබන සංශෝධන, සාමාජික අංක යටතේ සඳහන් නම්/හැඳුනුම්පත් අංක සංශෝධනය කිරීම හා සාමාජික අංක යටතේ බැර වී ඇති දායක මුදල් සංශෝධනය කිරීම වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට යටතේ වර්ග කළ හැක. 2019 වර්ෂය තුළ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් නම්/හැඳුනුම්පත් අංක සංශෝධන 67,083 ක් හා ගිණුම් සංශෝධන 5,230 ක් සිදු කර ඇත. තවද, 'සී' වාර්තා පරිලෝකන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ සාමාජික අංක යටතේ සංශෝධන සිදු කිරීමේ හැකියාව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ද ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2019 වර්ෂය තුළ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කාර්යාල විසින් යොමු කරන ලද සාමාජික අංකයන්ට අදාළ සංශෝධන 12,944 ක් පමණ සිදු කර ඇත.

### 2.14 අනෙකුත් කාර්යයන්

තවද, සේ.අ.අ. විසින් එහි ආයෝජන උපායමාර්ග සහ රාමුව සමාලෝචනය සහ නැවත පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය ලෝක බැංකුවේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ සිදු කරමින් පවතී. තවදුරටත්, සේ.අ.අ. ට පුළුල් තොරතුරු තාක්ෂණික විසඳුම් ක්‍රියාවට

නැංවීම සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලෝක බැංකුව විසින් ලබා දෙනු ලබයි. මෙය පෙරදැරි කොටගෙන ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන හරහා ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය (BPR) මෙහෙයවන ලදී.



‘ඇ’ කොටස

# මූලය ප්‍රකාශන

# සේවක අර්ථසාධක අරමුදල
## ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019 | | | 2018 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පොලී ආදායම් | 5 | 254,680,982 | - | 254,680,982 | 229,446,025 |
| ලාභාංශ ආදායම් | 6 | 6,247,497 | - | 6,247,497 | 3,887,578 |
| මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ | 7 | 137 | - | 137 | 7,216 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභය | 8 | (1,890,010) | - | (1,890,010) | (10,901,286) |
| මූල්‍ය වත්කම් හානිකරණය | 9 | 316 | - | 316 | 585 |
| **ආයෝජන ආදායම්** | | **259,038,922** | **-** | **259,038,922** | **222,440,118** |
| වෙනත් ආදායම් | 10 | 277,363 | 6,421 | 283,784 | 402,979 |
| **දළ ආදායම** | | **259,316,285** | **6,421** | **259,322,706** | **222,843,097** |
| මෙහෙයුම් වියදම් | 11 | (927,257) | (654,541) | (1,581,798) | (1,505,337) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | | **258,389,028** | **(648,120)** | **257,740,908** | **221,337,760** |
| ආදායම් බදු වියදම් | 12 | (34,964,552) | - | (34,964,552) | (30,720,357) |
| **වර්ෂයේ මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **223,424,476** | **(648,120)** | **222,776,356** | **190,617,403** |
| **ඉදිරියට ගෙන එන ලද රඳවා ගත් ලාභ** | | | | 159,475 | 268,002 |
| ආරම්භක ශේෂ ගැළපීම (සටහන 24.5) | | | | - | 2,202,948 |
| ගළපන ලද ආරම්භක රඳවාගත් ලාභ | | | | **159,475** | **2,470,950** |
| ලැයිස්තුගත නොකළ කොටස් විකිණීමෙන් ලැබූ ප්‍රාග්ධන ලාභ | | | | 90,000 | - |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | **223,025,831** | **193,088,353** |
| **ලාභ බෙදාහැරීම**<br>අඩු කළා : වර්ෂය තුළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී | | | | (4,762,437) | (4,296,117) |
| එකතු/(අඩු) කළා : ලාභ සම කිරීමේ සංචිත අරමුදලෙන්/(අරමුදලට) මාරු කිරීම | | | | (7,700,000) | 6,000,000 |
| 2019.12.31 දිනට සාමාජික ශේෂ මත පොලිය - 9.25% (2018 - 9.50%) | | | | (210,434,282) | (194,632,761) |
| **ඉදිරි වර්ෂය සඳහා ගෙනයන ලද ශේෂය** | | | | **129,112** | **159,475** |

පිටු අංක 50 සිට 100 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

.....................................................

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව
දිනය : 2020 පෙබරවාරි 26

..................

ඒ.ජී.යූ. තිලකරත්න
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

# සේවක අර්ථසාධක අරමුදල
# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | | 222,776,356 | 190,617,403 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම මත ශුද්ධ ලාභය/(අලාභය) | 13 | (7,249) | - |
| **කාලපරිච්ඡේදය සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම** | | **222,769,107** | **190,617,403** |

පිටු අංක 50 සිට 100 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

.........................................

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

.........................

ඒ.ජී.යූ. තිලකරත්න
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2020 පෙබරවාරි 26

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 14 | 270,886 | 286,150 |
| අස්පෘශ්‍ය වත්කම් | 15 | 3,618 | 4,220 |
| ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | 16 | 9,502,643 | 9,914,892 |
| ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | 17 | 65,907,115 | 64,937,663 |
| ක්‍රමක්ෂය පිරිවැයට ණය සාධන පත්‍ර | 18 | 2,473,311,184 | 2,223,978,499 |
| තොගය | | 10,646 | 10,020 |
| ලැබිය යුතු පොලී | | 531,207 | 783,109 |
| ලැබිය යුතු දායක මුදල් | | 13,468,914 | 12,574,614 |
| වෙනත් ජංගම වත්කම් | 19 | 628,308 | 1,057,336 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | 3,167,118 | 3,419,043 |
| | | **2,566,801,639** | **2,316,965,546** |
| **වගකීම්** | 21 | 3,598 | 3,677 |
| ගෙවිය යුතු ගිණුම් | | 285,576 | 249,485 |
| උපචිත වියදම් | 22 | 26,074,006 | 27,351,459 |
| වෙනත් ජංගම වගකීම් | | **26,363,180** | **27,604,621** |
| | | **2,540,438,459** | **2,289,360,925** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | |
| නියෝජනය කරනු ලබන්නේ, | 23 | 2,497,609,596 | 2,254,194,450 |
| සාමාජික ශේෂ | | | |
| | 24 | 42,699,751 | 35,007,000 |
| සංචිත | | 129,112 | 159,475 |
| රඳවාගත් ලාභ | | **42,828,863** | **35,166,475** |
| අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම | | **2,540,438,459** | **2,289,360,925** |

පිටු අංක 50 සිට 100 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

........................................

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

..........................

ඒ.ජී.යූ. තිලකරත්න
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2020 පෙබරවාරි 26

# සේවක අර්ථසාධක අරමුදල
# ලැබීම් හා ගෙවීම් ගිණුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019 | | | 2018 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | 3,419,078 | 77,256 | 3,496,334 | 3,331,637 |
| මුළු ලැබීම් | 25 | 405,609,727 | 640,660 | 406,250,387 | 353,088,148 |
| මුළු ගෙවීම් | 26 | (405,861,651) | (672,697) | (406,534,348) | (352,923,451) |
| වසර අවසාන මුදල් ශේෂය | | **3,167,154** | **45,219** | **3,212,373** | **3,496,334** |

පිටු අංක 50 සිට 100 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

.................................................. ....................

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ.ජී.යූ. තිලකරත්න
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2020 පෙබරවාරි 26

# සේවක අර්ථසාධක අරමුදල
## ආයෝජන ප්‍රකාශනය

| ආයෝජන කාණ්ඩය | සටහන | මුහුණත අගය<br>රු.000 | පිරිවැය<br>රු.000 | සාධාරණ අගය<br>රු.000 | ක්‍රමක්ෂය අගය<br>රු.000 | පොත් අගය<br>රු.000 |
|---|---|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 18.1.1 | 2,381,927,053 | 2,262,943,811 | 2,455,954,830 | 2,382,459,525 | 2,382,459,525 |
| භාණ්ඩාගාර බිල්පත් | 18.1.2 | 8,250,000 | 7,586,701 | 7,908,078 | 7,941,165 | 7,941,165 |
| සාංගමික ණයකර | 18.2/18.6 | 40,871,549 | 40,876,549 | 40,401,187 | 41,844,551 | 41,841,330 |
| භාරකාර සහතිකපත් | 18.3 | 424,395 | 263,750 | 406,532 | 406,532 | 406,518 |
| ප්‍රති විකුණුම් | 18.4 | 15,600,000 | 15,600,000 | 15,630,972 | 15,630,972 | 15,630,972 |
| ස්ථාවර තැන්පතු | 18.5 | 25,000,000 | 25,000,000 | 25,031,914 | 25,031,914 | 25,031,674 |
| ලැයිස්තුගත කොටස් | 16.1/17.1 | - | 83,695,978 | 66,268,769 | 83,695,978 | 66,268,769 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 16.2 | - | 9,640,989 | 9,140,989 | 9,640,989 | 9,140,989 |
| | | **2,472,072,997** | **2,445,607,779** | **2,620,743,271** | **2,566,651,626** | **2,548,720,942** |
| **2018 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 18.1.1 | 2,110,854,987 | 1,970,722,277 | 2,017,224,894 | 2,084,497,740 | 2,084,497,740 |
| භාණ්ඩාගාර බිල්පත් | 18.1.2 | 36,321,220 | 33,398,583 | 34,413,982 | 34,733,240 | 34,733,240 |
| සාංගමික ණයකර | 18.2/18.6 | 42,962,299 | 42,962,502 | 41,989,973 | 43,658,095 | 43,654,523 |
| භාරකාර සහතිකපත් | 18.3 | 1,230,857 | 831,235 | 1,132,594 | 1,132,594 | 1,132,558 |
| ප්‍රති විකුණුම් | 18.4 | 26,325,000 | 26,325,000 | 26,350,903 | 26,350,903 | 26,350,903 |
| ස්ථාවර තැන්පතු | 18.5 | 32,500,000 | 32,500,000 | 33,609,718 | 33,609,718 | 33,609,534 |
| ලැයිස්තුගත කොටස් | 17 | - | 80,467,243 | 64,937,663 | 80,467,243 | 64,937,663 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 16.2 | - | 10,414,892 | 9,914,892 | 10,414,892 | 9,914,892 |
| | | **2,250,194,363** | **2,197,621,733** | **2,229,574,618** | **2,314,864,426** | **2,298,831,054** |

පිටු අංක 50 සිට 100 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

............................................................
මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

............................................................
ජේ.ජී.යූ. තිලකරත්න
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2020 පෙබරවාරි 26

# සේවක අර්ථසාධක අරමුදල
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| ආයෝජන මගින් ලද පොලී | 241,250,083 | 198,799,665 |
| කොටස්වලින් ලද ලාභාංශ | 5,474,453 | 3,045,185 |
| අධිභාර සහ වෙනත් ආදායම් | 282,880 | 402,031 |
| ලැබිය යුතු දෑ වලින් අයකර ගැනීම් | 376,876 | 4,897,839 |
| මෙහෙයුම් වියදම් සඳහා ගෙවීම් | (1,214,420) | (1,197,440) |
| අත්තිකාරම් ගෙවීම් | (5,061) | (3,220) |
| සැපයුම්කරුවන්ට හා අනෙකුත් ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් | (3,389,714) | (4,226,687) |
| **මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **242,775,097** | **201,717,372** |
| බදු ගෙවීම් | (36,180,154) | (5,437,603) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | **206,594,943** | **196,279,770** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | (2,350,205,044) | (1,039,650,828) |
| ආයෝජන කල්පිරීම් | 2,111,474,111 | 805,119,460 |
| මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද ආදායම | 999,116 | - |
| දේපළ පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (31,105) | (39,606) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | **(237,762,922)** | **(234,570,974)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල්** | | |
| ලද දායක මුදල් | 157,247,216 | 144,996,456 |
| පොදු තැන්පතු ගිණුම - කම්කරු දෙපාර්තමේන්තුව | 44,228 | 14,301 |
| සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම් | (126,330,170) | (106,497,162) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **30,961,274** | **38,513,595** |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්** | **(206,705)** | **222,391** |
| වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ | 3,419,078 | 3,273,943 |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපුම් වලට පෙර** | **3,212,373** | **3,496,334** |
| ගැළපීම් : | | |
| කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය | (45,219) | (77,256) |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)** | **3,167,154** | **3,419,078** |
| **සටහන අ** | | |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය | | |
| අතැති මුදල් | 20 | 20 |
| මාර්ගස්ථ මුදල් | 156,334 | - |
| බැංකුවේ ඇති මුදල් | 3,010,800 | 3,419,058 |
| | **3,167,154** | **3,419,078** |
| (-) හානිකරණ සඳහා වෙන්කිරීම් | (36) | (35) |
| | **3,167,118** | **3,419,043** |

## සේවක අර්ථසාධක අරමුදල
## හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයන්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සාමාජික ශේෂය රු.000 | ගොඩනැගිලි සංචිත අරමුදල රු.000 | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල රු.000 | ලාභ සම කිරීමේ සංචිත අරමුදල රු.000 | පොදු සංචිත අරමුදල රු.000 | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත රු.000 | රඳවාගත් ලාභ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|---|---|
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,020,782,471** | **3,157,000** | **350,000** | **30,850,000** | **6,650,000** | **4,241,946** | **268,002** | **2,066,299,419** |
| SLFRS 09 අනුගත වීමේ සිදුවන බලපෑම (සටහන 34.2) | - | - | - | - | - | (4,241,946) | 2,206,626 | (2,035,320) |
| SLFRS 09 යටතේ ගලපන ලද ආරම්භක ශේෂ | **2,020,782,471** | **3,157,000** | **350,000** | **30,850,000** | **6,650,000** | **-** | **2,474,628** | **2,064,264,098** |
| රඳවා ගත් ලාභයට ආරම්භක ශේෂ ගැළපීම - කම්කරු දෙපාර්තමේන්තුව. | - | - | - | - | - | - | (3,678) | (3,678) |
| ගලපන ලද ආරම්භක ශේෂ | **2,020,782,471** | **3,157,000** | **350,000** | **30,850,000** | **6,650,000** | **-** | **2,470,950** | **2,064,260,420** |
| 2018 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 190,617,403 | 190,617,403 |
| 2018 වසරේ ශුද්ධ දායක මුදල් | 38,779,219 | - | - | - | - | - | - | 38,779,219 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2018 | - | - | - | - | - | - | (4,296,117) | (4,296,117) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2018 : 9.50%) | 194,632,761 | - | - | - | - | - | (194,632,761) | - |
| ලාභ සම කිරීමේ සංචිතයට මාරු කිරීම | - | - | - | (6,000,000) | - | - | 6,000,000 | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,254,194,451** | **3,157,000** | **350,000** | **24,850,000** | **6,650,000** | **-** | **159,475** | **2,289,360,926** |
| 2019 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 222,776,356 | 222,776,356 |
| ලැයිස්තුගත නොකළ කොටස් විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලාභ | - | - | - | - | - | - | 90,000 | 90,000 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස් වීම මත ශුද්ධ ලාභය/(අලාභය) | - | - | - | - | - | (7,249) | - | (7,249) |
| 2019 වසරේ ශුද්ධ දායක මුදල් | 32,980,863 | - | - | - | - | - | - | 32,980,863 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2019 | - | - | - | - | - | - | (4,762,437) | (4,762,437) |
| මෙහෙයුම් සාමාජික පොලී (2019 - 9.25%) | 210,434,282 | - | - | - | - | - | (210,434,282) | - |
| ලාභ සම කිරීමේ සංචිතයට මාරු කිරීම | - | - | - | 7,700,000 | - | - | (7,700,000) | - |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,497,609,596** | **3,157,000** | **350,000** | **32,550,000** | **6,650,000** | **(7,249)** | **129,112** | **2,540,438,459** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

සේවක අර්ථසාධක අරමුදල (''සේ.අ.අ.'' හෝ ''අරමුදල'') යනු 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය දායකත්ව විශ්‍රාම වැඩසටහනකි. අරමුදලේ පොදු පරිපාලක ලෙස කම්කරු කොමසාරිස්වරයා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, යුතුකම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ. පනත මගින් මුදල් මණ්ඩලයට පවරා ඇති බලතල, යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පහසුකම් සපයනු ලබයි.

## 2. ගිණුම්කරණ පදනම

### 2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සහ 1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇත.

1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ 5 (1) (ඌ) සහ (ඒ) වගන්ති යටතේ, මුදල් මණ්ඩලය විසින් අරමුදලට අදාළව පොදු ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර, පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ.

අ) ආදායම් හා වියදම් ප්‍රකාශනය,

ආ) වත්කම් හා වගකීම් ප්‍රකාශනය,

ඇ) ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය හා

ඈ) එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශනය

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ ප්‍රතිපාදන වලට අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ.

### 2.3 මුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමැතිය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2020 පෙබරවාරි 26 වන දින මුදල් මණ්ඩලය විසින් බලය පවරන ලදී.

### 2.4 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් හඳුනාගත් සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

### 2.5 ක්‍රියාකාරී හා වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

අරමුදලේ ක්‍රියාකාරී හා වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් අරමුදලේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

### 2.6 ප්‍රමාණාත්මකභාවය, හිලව් කිරිම සහ ඉපැයීම භාවිතය

ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

වැටයීම

වෙනත් විදියකින් සඳහන් කර නොමැති විට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් ආසන්නතම රුපියල් දහස් වලට වටයා ඇත.

### 2.7 විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයට සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම්, වියදම් අගයන් සහ අසම්භාව්‍ය වගකීම් වලට අදාළ හෙළිදරව් කිරීම් සඳහා බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන මුදල් මණ්ඩලය විසින් සිදු කර ඇත. එම විනිශ්චයන් සහ ඇස්තමේන්තු අතීත අත්දැකීම් සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි පිළිගත හැකි අපේක්ෂාවන් ද ඇතුළුව අනෙකුත් සාධක මත පදනම් වේ. මේ නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, විනිශ්චයන් හා ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා බලපවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරීත්වය විසින් සලකා බලන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරීත්වය විසින් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමක දී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලීමට අරමුදල සතුව සම්පත් පවතින බවට තහවුරු විය. එම නිසා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

මීට අමතරව පහත සඳහන් අනාවරණයන් සඳහා විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගන්නා ලදී.

- මූල්‍ය සාධන පත්‍ර අගය කිරීම
- වත්කම් හානිකරණය
- දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම
- වගකීම් සඳහා වෙන්කිරීම

### 2.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී වාර්තා කරන දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා ඇත. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම් හා අදාළ අනාවරණයන් සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ආදායම් හා වියදම් හඳුනාගැනීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස මැනීමට හැකි වන විට අයභාරය හඳුනා ගැනේ. ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ නිශ්චිත ආදායම් අයිතමයක ඉපයීම සහ දරන ලද පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය මත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය විසින් අරමුදල කළමනාකරණය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අරමුදලෙහි වියදම ලෙස අය කරනු ලබයි.

#### 3.1.1. පොලී ආදායම

ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ, සියලුම පොලී දරන මූල්‍ය සාධන පත්‍ර සඳහා පොලී ආදායම උපචිත පදනම යටතේ සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් හඳුනා ගනු ලැබේ. පොලී ආදායම තුළ පොලී අනුපාතික ආදායම් හා මූල්‍ය උපකරණයන්හි වට්ටම් හෝ අධි මිල මත ක්‍රමක්ෂය වන ලාභ හෝ අලාභ ඇතුළත්ය.

#### 3.1.2. ලාභාංශ

අරමුදලට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම ඉදිරිපත් කර ඇත්තේ නැවත අයකරගත නොහැකි රඳවාගත් බදු රහිතවය.

### 3.1.3. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති ආයෝජන විකිණීම මත ලාභ

ලැයිස්තුගත කොටස් විකිණීමෙන් උපලබ්ධි වූ වෙළඳ ලාභ, ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති ආයෝජන විකිණීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන අතර, ඒවා ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ඍජු ආදායම් තුළ ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් විකිණීම තුළින් ලද ආදායම් ලෙස ඉදිරිපත් කර ඇත.

### 3.1.4. වෙනත් විස්තිරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන ආයෝජන ඉවත්කිරීමෙන් ලද ලාභ

වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන ඉවත්කිරීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන්නේ සාධාරණ අගය තුළින් වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස වර්ගීකරණය කරන ලද කොටස් ආයෝජන වලින් උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ වන අතර, එය ඍජුවම රඳවාගත් ලාභ වලට මාරු වන අතර, ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රතිචක්‍රීකරණ බලපෑමක් වාර්තා නොවේ.

### 3.1.5. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමේ වෙනස්වීම්වල ලැයිස්තුගත කොටස් ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීම මත වන උපලබ්ධි නොවූ ලාභ අන්තර්ගත වන අතර, එය ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන සාධාරණ අගයට අගය කිරීම මගින් ඇති වූ ලාභ හෝ අලාභ යටතේ දක්වා ඇත.

### 3.1.6. වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ

වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජනයන් හි සාධාරණ අගයෙහි වෙනස්වීම්වල ලැයිස්තුගත නොකළ කොටස් මත වන උපලබ්ධි නොවූ ලාභ අන්තර්ගතවන අතර, එවැනි ලාභ හෝ අලාභ ඇත්නම් වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීම මත ලාභ හෝ අලාභ ලෙස ඉදිරිපත් කෙරේ.

### 3.1.7. සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම් තුළ අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශයේ සියලුම කාර්ය මණ්ඩල සඳහා වැය වූ වියදම් වේ. අරමුදල විසින් වෙනත් විශ්‍රාම අරමුදලක් හෝ වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් පවත්වාගෙන නොයයි.

3.1.8. ආදායම් බදු

බදු අය කිරීමේ බලාධිකාරය වෙතින් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන අගය මත වත්මන් හා පෙර වර්ෂය සඳහා පවත්නා බදු වත්කම් සහ වගකීම් මනිනු ලබයි. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති, වාර්තා කරන දිනය වන විට බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවා වේ.

2006 අංක 10 දරණ දේශීය ආදායම්පනත අනුව අරමුදල 2018 මාර්තු 31 දින දක්වා 10% අනුපාතයට ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. 2018 අප්‍රේල් 01 සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අනුව, අරමුදල 14% ක ආදායම් බදු ගෙවීමට බැඳී සිටී.

සේවක අර්ථසාධක අරමුදල 2006 සැප්තැම්බර් 01 දින සිට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ආයෝජන කළඹ බදු පසු බර තැබූ සාමාන්‍ය පිරිවැයට තක්සේරු කිරීමට හා පසුව ක්‍රමක්ෂය කිරීමට ගිණුම්කරන ප්‍රතිපත්ති වෙනස් කරන ලද බැවින් ක්‍රමක්ෂය ලාභ බදු අඩු කිරීමෙන් පසුව දක්වා ඇත.

ඒ අනුව, ක්‍රමක්ෂය ලාභ හා බදු වියදම පිළිබඳ වඩාත් සාධාරණ අදහසක් ලබා ගැනීම සඳහා වසර තුළ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපයූ ආදායමට අදාළ රඳවා ගැනීමේ බදු මත ක්‍රමක්ෂය ලාභ ගිණුමට නැවත එකතු කර ඇත. කෙසේ වෙතත්, නව දේශීය ආදායම් පනත යටතේ රජයේ සුරැකුම්පත් සඳහා රඳවා ගැනීමේ බදු අහෝසි කිරීම හේතුවෙන්, 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, රඳවා ගැනීමේ බදු ක්‍රමක්ෂය කිරීම සලකා බලනු නොලැබේ.

## 3.2 වත්කම්

3.2.1. මූල්‍ය උපකරණ

3.2.1.1. **මූලික හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසු අගය කිරීම.**

සේ.අ.අ. එහි මූල්‍ය වත්කම් පහත දැක්වෙන මිනුම් කාණ්ඩවලට වර්ග කරයි

i. සාධාරණ අගයට මැනිය යුතු (වෙනත් විස්තීරණ ආදායම් මගින් හෝ ලාභ හෝ අලාභ මගින්) සහ

ii. ක්‍රමක්ෂය පිරිවැයට මැනිය යුතු

වර්ගීකරණය රඳාපවතින්නේ මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන සේ.අ.අ. හි ව්‍යාපාරික ආකෘතිය සහ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම් කොන්දේසි මතය.

i. ක්‍රමක්ෂය පිරිවැය මත මනින මූල්‍ය වත්කම්

<u>ණය උපකරණ</u>

මූලිකවම සාමාජිකයන් හට ඇති වගකීම් ගැලපීම සඳහා අත්පත් කරගෙන ඇති ණය උපකරණවල ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ, එම ආයෝජනයන් හි,

නිශ්චිත දිනයන්හි ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය මත පොලිය පමණක් නියෝජනයවන මුදල් ප්‍රවාහයන්වලට තුඩු දෙන ගිවිසුම් කොන්දේසි තිබීම.

සහ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තිබීම මතයි.

මෙම ණය උපකරණ මුලින් සාධාරණ අගය සහ සෘජුවම ආයෝජනය කළ හැකි ගනුදෙනු පිරිවැයට හඳුනාගන්නා අතර, පසුව ක්‍රමක්ෂය පිරිවැය මත අගය කරනු ලැබේ. ණය හානිකරණය මැනීම පදනම් වී ඇත්තේ සටහන 3.2.1.2 හි විස්තර කර ඇති පරිදි අදියර තුනක අපේක්ෂිත ණය පාඩු ආකෘතිය මතය.

ii. වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

ණය උපකරණ

ණය උපකරණවල ආයෝජන වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන්නේ එම ආයෝජනයන්හි,

නිශ්චිත දිනයන්හි ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය මත පොලිය පමණක් නියෝජනයවන මුදල් ප්‍රවාහයන්වලට තුඩු දෙන ගිවිසුම් කොන්දේසි තිබීම.

සහ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකින්ම අරමුණු සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තිබීම මතයි.

මෙම ණය උපකරණ මුලින් සාධාරණ අගයට හා ගනුදෙනු පිරිවැයට හඳුනාගන්නා අතර, පසුව සාධාරණ අගයට මනිනු ලැබේ. සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ, හිමිකම්හි වෙනමම අංගයක් තුළ ඇතුළත් වේ. හානිකරණ අලාභ හෝ ආපසු ලියා හැරීම් පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ, ලාභ හා අලාභ තුළින් හඳුනාගනී. ඉවත් කිරීමේ දී වෙනත් විස්තීර්ණ ආදායම් හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, හිමිකම් වලින් ආදායම් ප්‍රකාශයනට නැවත වර්ගිකරණය කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්වල මෙන්ම ණය හානිකරණය මැනීම අදියර තුනක අපේක්ෂිත ණය පාඩු ආකෘතිය මත පදනම්ව ඇත. අපේක්ෂිත ණය අලාභ ආකෘතිය පහත සටහන 3.2.1.2 මූල්‍ය වත්කම් හානිකරණය හි දක්වා ඇත.

ස්කන්ධ සාධන පත්‍ර

විකිණීම සඳහා නොවන හෝ SLFRS 03 ව්‍යවහාර වන ව්‍යාපාර සංයෝජනයක අත්පත්කර ගන්නා විසින් අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාවක් ලෙස හඳුනා නොගන්නා ස්කන්ධ සාධන පත්‍ර ආයෝජන කළමනාකරණය විසින් ආපසු හැරවිය නොහැකි තීරණයක් ඇතිවිට විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට අනුව මනිනු ලැබේ. කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මැනීමට, වෙනස් ආපසු හැරවිය නොහැකි තීරණයක් ගෙන නැති විටදී, එම ආයෝජන ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මනින ආයෝජන ලෙස සලකනු ලබයි.

වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇති වටිනාකම් පසුව ලාභ හෝ අලාභ වලට මාරු කරනු නොලැබේ. එවැනි ආයෝජනවල ලාභාංශ, ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී.

**iii. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මනිනු ලබන අයිතම**

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමක් ඇති අයිතම සමන්විත වන්නේ;

1. වෙළෙඳාම සඳහා තබා ඇති අයිතම

ප්‍රධාන වශයෙන් එය නුදුරු කාලයේ දී විකිණීම හෝ ප්‍රති මිලදී ගැනීමේ අරමුණ ඇතිව අත්පත් කර ඇත්නම් හෝ දරා ඇත්නම් හෝ එක්ව කළමනාකරණය කෙරෙන සහ මෑතකදී කෙටිකාලීන ලාභ ලැබීම් සත්‍ය රටාවක් පිළිබඳව සාක්ෂි ඇති හඳුනාගත් මූල්‍ය සාධන පත්‍ර කළඹක කොටසක් වේ නම් හෝ සඵල ඉදිරි රැකුම් සම්බන්ධතාවයක් නැති ව්‍යුත්පන්නයක් වන්නේ නම් හෝ එය වෙළෙඳාම සඳහා තබා ඇති මූල්‍ය උපකරණයක් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

වෙළෙඳ ව්‍යුත්පන්නයන් සහ වෙළෙඳ සුරැකුම්පත් වෙළෙඳාම සඳහා තබා ඇති අයිතම ලෙස වර්ගීකරණය කරන අතර ඒවා සාධාරණ අගයට හඳුනාගනු ලබයි.

2. මූලික හඳුනාගැනීමේ දී ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට නිශ්චිතව නම් කරන ලද අයිතම.

මූලික හඳුනාගැනීමේ දී, ලාභය හෝ අලාභය තුළින් මූල්‍ය උපකරණ සාධාරණ අගයට මැනීමට නම් කළ හැකිය. එසේ කරන්නේ නම් ඒවා වෙනත් පදනම් මත වත්කම් හෝ වගකීම් මැනීමේ දී වෙනත් අන්දමකින් පැන නැගිය හැකි මැනීමේ හෝ හඳුනා ගැනීමේ අසංගතතා (ගිණුම්කරණ අයෝග්‍ය) ඉවත් කිරීම හෝ සෑහෙන දුරට අඩු කර ගත යුතු වේ.

3. මුල් මුදල හා පොලී ගෙවීම් පමණක් නියෝජනය නොකරන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය සාධන පත්‍ර.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය උපකරණ මුලින් සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. පසුව, ඒවා සාධාරණ අගයට මනිනු ලබන අතර, ලාභයන් හෝ අලාභයන් පැන නගින විට ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

මූල්‍ය වත්කමක් සාධාරණ අගයට මනිනු ලබන විට, ණය අවදානම් වෙනස්වීම්වලට හේතු වන සාධාරණ වටිනාකමේ විචලනයන් නියෝජනය කරමින්, පාර්ශවකරුගේ ණය සුදුසුකම් පිළිබිඹු කිරීම සඳහා ණය තක්සේරුකරණ ගැලපුමක් ඇතුළත් කෙරේ.

**මූල්‍ය උපකරණ සඳහා ඇති ව්‍යුත්පන්නයන් සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය**

මූල්‍ය උපකරණ සඳහා ඇති ව්‍යුත්පන්නයන් යනු නිශ්චය කරන ලද මිලකට,දර්ශකයකට හෝ වෙනත් විචල්‍යකට හෝ ඒවායෙන් කිහිපයකට අනුව එහි වටිනාකම තීරණය වන ගිවිසුමකි. මේවා ගිවිසුම් (swaps) ඉදිරි ගනුදෙනු (forward rate agreements) අනාගත ගනුදෙනු (futures) සහ විකල්ප ගිවිසුම් (options) වලින් සමන්විත වේ.

ඵලදායී ඉදිරි රැකුම් සම්බන්ධතාවයක කොටසක් ලෙස ඉදිරි රැකුම් ව්‍යුත්පන්නයක් වර්ගීකරණය කර ඇති විටදී හැර අනෙකුත් සියලුම අවස්ථාවලදී ව්‍යුත්පන්නයන් ශේෂ පත්‍රයේ සාධාරණ අගයට හඳුනා ගන්නා අතර වෙළෙඳ ව්‍යුත්පන්නයන් ලෙස වර්ගීකරණය කරනු ලබයි. ව්‍යුත්පන්නයන්ගේ ධාරණ වටිනාකම ගිවිසුමේ කාලය පුරාවට සාධාරණ අගයට නැවත මනිනු ලැබේ. සාධාරණ අගය ධන අගයක් ගන්නා විට ව්‍යුත්පන්නයන් වත්කම් ලෙසත් සෘණ අගයක් ගන්නා විට වගකීම් ලෙසත් හඳුනා ගැනේ.

### 3.2.1.2. මූල්‍ය වත්කම් හානිකරණය

සේ.අ.අ. විසින් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ (ECLs) මැනීම සඳහා අදියර තුනක ප්‍රවේශයක් යොදා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට තීරණය කරන සහ ක්‍රමක්ෂය පිරිවැයට නිරූපණය කරන ණය උපකරණ,
- ණය බැඳීම්, සහ
- මූල්‍ය ඇපවීම් ගිවිසුම්

කොටස් ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ හඳුනාගෙන නැත.

මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත සඳහන් අදියර තුන යටතේ සලකනු ලබයි.

අදියර 1 - මාස 12 අපේක්ෂිත ණය අලාභ

මූලික හඳුනා ගැනීමේ දින සිට ණය අවදානම සැලකිය යුතු අන්දමට වැඩිවී නොමැති අස්තිත්ත්වයන් සහ ආරම්භයේ සිටම ණය හානිකරණය නොවූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලය තුළ අපේක්ෂිත ණය අලාභයේ කොටස ඉදිරි මාස 12 තුළ සිදුවන ණය පැහැර හැරීමේ සම්භාවිතා සිද්ධි හරහා හඳුනා ගැනේ.

සැලකිය යුතු ලෙස ණය හානිකරණයට ලක් නොවූ ගනුදෙනුකරුවන්ගෙන්, සේ.අ.අ. විසින් මාස 12 ක අපේක්ෂිත ණය අලාභ තීරණය කරනු ලබයි.

අදියර 2 - ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය - ණය හානිකරණය නොකළ.

මූලික හඳුනා ගැනීමේ දින සිට, ණය අවදානම සැලකිය යුතු අන්දමට වැඩි වී ඇති නමුත් ආරම්භයේ සිටම ණය හානිකරණය නොවූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය (මූල්‍ය වත්කමෙහි ඉතිරි ආයු කාලය පිළිබිඹු කරමින්) හඳුනා ගැනේ.

සේ.අ.අ. හි ප්‍රතිපත්තිවලට අනුකූලව, BBB - ශ්‍රේණියට වඩා පහළින් ශ්‍රේණිගත කර

ඇති ආයෝජන, පහළ ආයෝජන ශ්‍රේණියක ආයෝජන ලෙස සලකනු ලබන අතර, එම ආයෝජන සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක්වී ඇතැයි සලකයි. එවැනි ආයෝජන ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා සලකනු ලැබේ.

තවද, ඉහළ ආයෝජන ශ්‍රේණිගත කිරීම් තුළ සිදුවන විචලනයන් මගින් ණය අවදානම සැලකිය යුතු ලෙස පිරිහීමට ලක්වේ. මුල්වරට හඳුනා ගැනීමේ සිට බාහිර ණය ශ්‍රේණිගත කිරීම් 02 ක් පහත වැටී ඇති ප්‍රති පාර්ශවයන්ගේ ආයෝජන සැලකිය යුතු පිරිහීම මැනීමට භාජනය වේ.

සෙසවරී උපකරණ සඳහා සැලකිය යුතු පිරිහීම අර්ථ දැක්වෙන්නේ ප්‍රති පාර්ශවයේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම්වල 04 ක් පහළ වැටී ඇති විටදීය.

අදියර 3 - ජීව කාලයේ අපෙක්ෂිත ණය අලාභය  - ණය හානිකරණය කළ.

යම් අස්තිත්ත්වයන්ගේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයක පිරිහීමකට බලපාන සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදු වූ විට අදාළ හානිකරණය තක්සේරු කෙරේ. ණය හානිකරණ වූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය හඳුනාග න්නා අතර, පොලී ආදායම ගණනය කරනු ලබන්නේ ධාරණ අගයට වඩා ක්‍රමක්ෂය පිරිවැයට (ශුද්ධ වෙන්කිරීම්) එලදායී පොලී අනුපාතය යෙදීමෙනි.

**හානිකරණ මට්ටම තීරණය කිරීම**

සෑම වාර්තා කරන දිනයකදීම, සේ.අ.අ. විසින් මූලික හඳුනා ගත් දින සිට වාර්තා කරන දින දක්වා අපේක්ෂිත ජීව කාලය තුළ දී පැහැර හැරීමේ අවදානම සංසන්දනය කරමින් අස්තිත්ත්වයන්ගේ ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් ඇතිදැයි තක්සේරු කරනු ලබයි. මේ සඳහා සේ.අ.අ. විසින් අනවශ්‍ය පිරිවැයක් හෝ වෑයමක් නොමැතිව ලබාගත හැකි සාධාරණ හා අනුමත කළ හැකි තොරතුරු යොදා ගනී. මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ ඉදිරි දැක්මක් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් වේ.

සේ.අ.අ. විසින් අස්තිත්ත්වයන් හි ණය අවදානම තනි තනි ලෙස හෝ සාමූහික පදනමින් වැඩිවී ඇත්දැයි තක්සේරු කරනු ලැබේ. හානිකරණය පිළිබඳව සාමූහික විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා මූල්‍ය උපකරණ හවුල් ණය අවදානම් ලක්ෂණ මත පදනම්ව, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, මූලික හඳුනා ගැනීමේ දිනය, කල්පිරීමේ කාලය, ණය ගැනුම්කරුගේ අංශය සහ අනෙකුත් අදාළ සාධක සාලකිල්ලට ගනිමින් තක්සේරු කරනු ලබයි.

**අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම.**

අපේක්ෂිත ණය අලාභය අපක්ෂපාතී හා බරිත සම්භාවී ඇස්තමේන්තුගත අපේක්ෂිත අලාභය මඟින් ව්‍යුත්පන්න කර ඇති අතර, ඒවා පහත පරිදි ගණනය කරනු ලබයි.

- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා නොකළ මූල්‍ය වත්කම්: සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද මූල්‍ය වත්කම් වල අපේක්ෂිත ආයුකාලය පුරා ඇති සියලුම මුදල් හිඟයන්ගේ වර්තමාන වටිනාකමයි. මුදල් හිඟයේ වෙනස වනුයේ ගිවිසුම් වලට අනුව සේ.අ.අ. ට ලැබීමට නියමිත මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනසයි.

- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා කළ මූල්‍ය වත්කම්: දළ ධාරණ අගය සහ සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අතර වෙනසයි.

- ලබා නොගත් ණය බැඳීම්: බැඳීම් පැහැර හැරියහොත් සේ.අ.අ. ට ගෙවීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ට ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනසෙහි වර්තමාන අගයයි.

- මූල්‍ය ඇපකාර ගිවිසුම්: හිමිකරුට ප්‍රතිපූරණය කිරීම සඳහා අපේක්ෂිත ගෙවීම් වලින් සේ.අ.අ. අයකර ගැනීමට අපේක්ෂා කරන මුදල අඩු කරගත් පසු ලැබෙන අගයයි.

සේ.අ.අ. විසින් ඉදිරි දැක්මක් සහිත තොරතුරු යොදාගෙන අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා සටහන 30 හි මූල්‍ය වත්කම් අංශයේ ණය ගුණාත්මකභාවය බලන්න.

අපේක්ෂිත ණය අලාභයන් ආදායම් ප්‍රකාශනයේ අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම යටතේ හඳුනාගනී. වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණයන්හි අපේක්ෂිත ණය අලාභය මැනීම සඳහා පදනම් වී ඇත්තේ, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් සඳහා භාවිතා කරන අදියර තුනේ ප්‍රවේශය වේ. සේ.අ.අ. අඩු කරන ලද වෙන් කිරීම්, ලාභ අලාභ ගිණුම යටතේ හඳුනා ගන්නා අතර, අනුරූප වටිනාකම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගනිමින්, සේ.අ.අ. ශේෂපත්‍රයේ සඳහන් වත්කමේ ධාරණ අගයේ අඩු කිරීමක් සිදු නොකරයි.

### 3.2.1.3. මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ ප්‍රති හඳුනාගැනීම

සේ.අ.අ. අස්තිත්ත්වය සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදන වලට පාර්ශවකරුවෙක් වූ අවස්ථාවලදී පමණක් මූල්‍ය වත්කමක්/මූල්‍ය වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි. සාමාන්‍යයෙන් මෙය වෙළෙඳ දිනට සිදු කරනු ලබයි. ණය සහ ලැබිය යුතු දේ හඳුනාගනු ලබන්නේ ණය ගැනුම්කරුවන්ට මුදල් පියවූ විටදීය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේ දී සාධාරණ අගයට හඳුනා ගනී. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේ දී සාධාරණ

අගයට හඳුනා ගන්නා අතර ඍජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය ද එයට එකතු කරනු ලැබේ.

මුදල් ප්‍රවාහයක ගිවිසුම්ගත අයිතිය අවසන් වූ විට හෝ ගනුදෙනුවකදී මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරීමක දී සේ.අ.අ. විසින් මූල්‍ය වත්කම ප්‍රති හඳුනාගනී. මාරු කරන ලද මූල්‍ය වත්කමක් හේතුවෙන් නිර්මාණය වූ හෝ රඳවාගත් පොලිය, සේ.අ.අ. විසින් වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

සේ.අ.අ. විසින් මූල්‍ය වගකීමක් ශේෂපත්‍රයේ ප්‍රතිහඳුනාගනු ලබන්නේ ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර ඇති බැඳීම විසර්ජනය කිරීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන්ය.

### 3.2.1.4. හිලව් කිරීම

හිලව්කිරීමට නෛතික අයිතියක් ඇතිවිට හෝ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අදහසක් ඇතිවිට හෝ වත්කම උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන විට දී පමණක් සේ.අ.අ. විසින්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ශුද්ධ අගය මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කරයි.

### 3.2.1.5. වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

එක් එක් වාර්තාකරණ දිනයේ දී කරන ලද උපකල්පන එම දිනයේ දී වඩාත් උචිත ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වාසනීයව මිනුම් කර ඇති බව සහතික කර ගැනීම සඳහා සේ.අ.අ. හි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇතත්, තත්‍ය අගයන් එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ පාදකව පවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ දී සහ බලපාන ඕනෑම අනාගත කාලපරිච්ඡේදයක් තුළ දී හඳුනා ගැනේ.

විනිශ්චය, ඇස්තමේන්තු හා උපකල්පන මත පදනම් වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

**සාධාරණ අගය මැනීම**

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගනුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවකදී මිනුම්ගත කරන ලද දිනට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල් හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි.

මූල්‍ය වත්කමක් හෝ වගකීමක් වර්ගීකරණය කිරීමෙන් පසු එය සාධාරණ අගයට මනිනු ලබන විටදී හැකි සෑම අවස්ථාවකදීම සේ.සේ.අ. ට පිවිසිය හැකි වඩාත්ම වාසි සහගත සක්‍රිය වෙළෙඳ පොළ මගින් ඉදිරිපත් කළ ලංසු හෝ පිරිනැමීමේ මිල අනුව සාධාරණ අගය මනිනු ලැබේ. ණය අවදානම සඳහා වන ගැලපීමක් ද, සුදුසු පරිදි සාධාරණ අගයට ඇතුළත් කරනු ලබයි.

ශුද්ධ විවෘත තත්ත්වයක් වන සක්‍රීය වෙළෙඳපොළක ලැයිස්තුගත කර ඇති මූල්‍ය වගකීමක හෝ මූල්‍ය වත්කමක සාධාරණ අගය පිළිවෙලින් එහි පිරිනැමීමේ මිල හෝ ලංසු මිල, අදාළ උපකරණයේ රඳවා තබා ඇති නිකුත් කරන ලද ඒකක ගණනින් ගුණ කළ විට ලබාගත හැක.

යම් වත්කමක් හෝ වගකීමක් සඳහා සක්‍රිය වෙළෙඳපොළක් නොපවතින අවස්ථාවලදී අදාළ සාධාරණ අගයට එළඹීම සඳහා සේ.අ.අ. විසින් අතේ දුරින් වන ගනුදෙනු වලදී භාවිතා කරන ලද ගනුදෙනු මිල, වට්ටම් කළ මුදල් ප්‍රවාහ විශ්ලේෂණ, විකල්ප මිලකරණ ආකෘති, වෙනත් තක්සේරුකරණ ක්‍රම, වාර්තාකරණ දිනයේ දී පවතින වෙළෙඳපොළ තත්ත්වයන් සහ අවදානම, පාදක කරගත් තක්සේරුකරණ ක්‍රමයක් භාවිතා කරනු ලබයි. එසේ යොදාගත් තක්සේරුකරණ ක්‍රමවේදය මගින් සාධාරණ අගය තක්සේරු කරන විටදී වෙළෙඳපොළ යෙදවුම් උපරිම ලෙස භාවිතා කරන අතර ආයතන විශේෂිත වූ යෙදවුම් මත අවම විශ්වාසයක් තබයි.

### 3.2.2. දේපළ, පිරියත හා උපකරණ

#### හඳුනාගැනීම

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සිදු වේ.

#### මැනීම

ආරම්භයේ දී සියලුම දේපළ පිරියත හා උපකරණ එහි පිරිවැයට අගය කරනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට ඍජුව දායක වන වියදම් හා පසුව දරන පිරිවැය (''පසුකාලීන පිරිවැය'' යටතේ පැහැදිලි කර ඇති ආකාරයට), පිරිවැයට ඇතුළත් වේ. උපකරණයක ක්‍රියාකාරීත්වයට අවශ්‍යව මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

#### පිරිවැය ආකෘතිය

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයට, ශුද්ධ සමුච්චිත ක්ෂය වීම් වලට හා සමුච්චිත හානිකරණ අලාභ වලටය. වත්කමක ධාරණ අගය, ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි වන විට ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා කපා හරිනු ලබයි (කරුණාකර සටහන 3.2.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය සටහන බලන්න).

#### පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටසක් කාලානුරූපීව ප්‍රතිස්ථාපනය කළ යුතු විටදී, අරමුදල විසින් ප්‍රතිස්ථාපනය කළ කොටස් පොත් වලින් ඉවත් කරන අතර, නව කොටස එයට සම්බන්ධ ආයු කාලය අනුව හඳුනා ගෙන ඒ අනුව ක්ෂය කරනු ලැබේ. ඉදිරියට යන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ඒවා දරණ ආකාරය අනුව ලාභය හෝ අලාභයට අය කරනු ලැබේ.

**ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතිමයක් විකිණීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ එය භාවිතයෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති නම් ඉවත් කරනු ලැබේ. වත්කමක් ඉවත් කිරීම මත හඳුනාගත් කුමන හෝ ලාභයක් හෝ අලාභයක් එම වත්කම ඉවත් කළ කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ තුළ ඇතුළත් වේ.

**ක්ෂය**

වත්කමෙහි ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම සිදු කරයි. වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කරන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව දී හෝ තමන් විසින්ම ඉදිකළ වත්කමක් සම්බන්ධයෙන් වන විට එම වත්කම සම්පූර්ණ කළ විට හා භාවිතය සඳහා සූදානම් අවස්ථාවේ සිටය. වත්කම විකුණා දැමීම සඳහා තබා ගන්නා වත්කම් ලෙස වර්ගීකරණය කළ දිනය හෝ වත්කම ඉවත් කළ දිනය යන දෙකෙන් කලින් එළඹෙන දිනයේ දී වත්කමක් ක්ෂය කිරීම නවතා දමයි.

වත්කම් සඳහා ඇස්තමේන්තුගත ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| **වත්කම් වර්ගය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 02% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෝටර් රථ | 20% |
| පරිගණක උපාංග | 25% |
| (2016 දෙසැම්බර් 31 දිනට පෙර අත්පත් කරගත් වත්කම් | 50%) |
| වෙනත් | 20% |

අවශේෂ වටිනාකම්, ඵලදායී ජීවකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේ දී සමාලෝචනය කරන අතර, අවශ්‍ය විටදී ගැළපීම් සිදු කරනු ලැබේ.

**3.2.3. අස්පෘශ්‍ය වත්කම්**

මෘදුකාංග, සම්බන්ධිත දෘඩාංග වල සංකලිත කොටසක් නොවන විට, පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස එහි පිරිවැයට හඳුනා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසු අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පසු අගයට ඉදිරියට ගෙන යනු ලබන්නේ වත්කමෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 03 ක් ලෙස පදනම් කර ගනිමිනි. (2016.12.31 දිනට පෙර අත්පත් කරගත් මෘදුකාංග සඳහා වසර 02 කි.)

**3.2.4. තොගය**

තොග පවත්වාගෙන යනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට වන අතර, එය පරිභෝජන ද්‍රව්‍ය වලින් සමන්විත වේ.

### 3.2.5. ලැබිය යුතු මුදල්

හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කිරීමෙන් පසු අපේක්ෂිත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ දක්වා ඇත. සියලුම ලැබිය යුතු දෑ හානිකරණය වූවා ද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි තිබේ දැයි තක්සේරු කරනු ලැබේ.

### 3.2.6. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

අරමුදල විසින් සෑම කාලපරිච්ඡේදයක් අවසානයේ දීම යම් සිදුවීමක් හෝ වාතාවරණයෙහි සිදුවන වෙනස්වීමක් නිසා මූල්‍ය නොවන වත්කමක් හානිකරණය වී ඇති බවට ඇඟවීමක් තිබේ දැයි තක්සේරු කරනු ලැබේ. එවැනි හැඟවීමක් පවතින්නේ නම් ආපසු අයකර ගත හැකි අගය පිළිබඳ මූල්‍ය ඇස්තමේන්තුවක් අරමුදල විසින් කරනු ලබයි. එම ආපසු අයකර ගත හැකි අගයට වඩා එහි ධාරණ අගය වැඩි නම්, එම වත්කම හානිකරණය වූ බවට සලකා ආපසු අයකර ගත හැකි අගය දක්වා ලියාහරිනු ලැබේ.

## 3.3. වගකීම්

### 3.3.1. හිමිකම් නොපෑ ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ට හෝ අර්ථලාභින්ට ලබා දුන් නමුත් විවිධ හේතු මත ආපසු එවූ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ වසරකට වඩා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ නැවත ලබා දෙනතුරු හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට බැර කරන ලදී.

### 3.3.2. රඳවාගත් ප්‍රතිලාභ

රඳවාගත් ප්‍රතිලාභ යටතේ දක්වා ඇති අගයන් කම්කරු කොමසාරිස්වරයාගේ උපදෙස් මත රඳවාගත් ප්‍රතිලාභ වන අතර, ඔහු විසින් නැවත ඉල්ලා සිටින විට නිදහස් කරනු ලබයි. මෙවැනි බැර කිරීම් එම ගිණුමේ පවත්වාගෙන යනු ලබන්නේ එක් ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා පමණක් වන අතර, ඉන් පසුව හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට මාරු කරයි.

### 3.3.3. ඌන සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් (ආපසු ගෙවීම්)

ඌන සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් ගිණුමේ ශේෂයෙන් පෙන්වන්නේ කොටස් වශයෙන් කළ යුතු ප්‍රතිලාභ ගෙවීම් වේ.

### 3.3.4. ඌන සහ අතිරික්ත දායක මුදල් ගෙවීම් (දායක මුදල්)

සාමාජික ගිණුම්වලට බැර කෙරෙන තෙක් සාමාජික මුදල් ලැබීම් තාවකාලිකව වාර්තා කරනු ලබන ශේෂය මෙහි නිරූපනය වේ.

### 3.3.5. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අරමුදලට ප්‍රවර්ථන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක සහ එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලා යෑම අවශ්‍ය වීම හව්‍ය වන විටෙක සහ බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කළ හැකි විටෙක ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.3.6. වගකීම් හඳුනාගැනීම අත්හැරීම

හඳුනාගත් වගකීමක් අත්හරිනු ලබන්නේ එහි පැවැත්ම අහෝසි වන තත්ත්වයට පත් වූ විට වේ. එනම්, ගිවිසුමේ නිශ්චය කර ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුවය.

### 3.4. ආදායම් ප්‍රකාශනය

සේ.අ.අ. එහි ආදායම් ප්‍රකාශනය, ප්‍රකාශන දෙකක් යොදාගෙන පිළියෙල කරනු ලබයි. උදා: ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ විස්තීරණ ආදායම් හා වෙනත් විස්තීරණ ආදායම් පෙන්වීම සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.

### 3.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුගමනය කරමින් සෘජු ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරනු ලබයි. මුදල් හා මුදල් සමාන දෑ යන්නට අගය වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය හැකි තරමේ අවදානමකට භාජනය වන නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටිකාලීන ඉතා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජන ඇතුළත් වේ.

### 3.6. ලැබීම් හා ගෙවීම් ගිණුම

ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය තුළින් වර්ෂය තුළ මුදලින් වූ සියලුම ලැබීම් හා මුදලින් වූ සියලුම ගෙවීම් නිරූපණය කරයි.

## 4. සංසන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්ධන වර්ෂයේ තොරතුරු සමඟ සංසන්දනය කිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අවශ්‍ය අවස්ථාවන්හි දී සංශෝධනය කර ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 5 පොලී ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව රු.000 | එකතුව රු.000 | එකතුව රු.000 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය | 244,237,536 | - | 244,237,536 | 212,232,470 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලිය | 2,124,533 | - | 2,124,533 | 6,026,390 |
| සාංගමික ණය සුරැකුම්පත් මත පොලිය - ලැයිස්තුගත | 4,188,426 | - | 4,188,426 | 3,699,770 |
| සාංගමික ණය සුරැකුම්පත් මත පොලිය - ලැයිස්තුගත නොකළ | 798,429 | - | 798,429 | 1,283,769 |
| ස්ථාවර තැන්පතු මත පොලිය | 2,104,017 | - | 2,104,017 | 5,358,990 |
| භාරකාර සහතික මත පොලිය | 56,503 | - | 56,503 | 159,321 |
| ප්‍රති විකුණුම් මත පොලිය | 1,171,538 | - | 1,171,538 | 685,316 |
| | **254,680,982** | **-** | **254,680,982** | **229,446,025** |

සටහන 12 හි විස්තර කර ඇති පරිදි, 2018.03.31 දින සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවන ලද ක්‍රමක්ෂය කරන ලද රඳවා ගැනීමේ බදු (WHT) ආදායමට, හඳුනා ගැනීම සේවක අර්ථසාධක අරමුදල විසින් නතර කරන ලදී.

## 6 ලාභාංශ ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව රු.000 | එකතුව රු.000 | එකතුව රු.000 |
| ලැයිස්තුගත කළ ස්කන්ධ සුරැකුම්පත් වලින් ලද ලාභාංශ | 2,435,989 | - | 2,435,989 | 2,663,693 |
| ලැයිස්තුගත නොකළ ස්කන්ධ සුරැකුම්පත් වලින් ලද ලාභාංශ | 3,673,501 | - | 3,673,501 | 1,095,986 |
| ලැයිස්තුගත නොකළ වරණීය කොටස් වලින් ලද ලාභාංශ | 138,007 | - | 138,007 | 127,900 |
| | **6,247,497** | **-** | **6,247,497** | **3,887,578** |

## 7 මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව රු.000 | එකතුව රු.000 | එකතුව රු.000 |
| සාමාන්‍ය කොටස් විකුණුම් මත ලාභ - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | - | - | - | 7,216 |
| භාණ්ඩාගාර බිල්පත් විකුණුම් මත ලාභ | 137 | - | 137 | - |
| | **137** | **-** | **137** | **7,216** |

## 8 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව රු.000 | එකතුව රු.000 | එකතුව රු.000 |
| ලැයිස්තුගත ස්කන්ධ සුරැකුම්පත් | (1,890,010) | - | (1,890,010) | (10,901,286) |
| | **(1,890,010)** | **-** | **(1,890,010)** | **(10,901,286)** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 9 මූල්‍ය වත්කම් හානිකරණය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|
| **ඌණ/(අධි) හානිකරණ සඳහා වෙන්කිරීම්, (සටහන් 18 සහ 20)** | | |
| සාංගමික ණය සුරැකුම්පත් | (376) | (332) |
| භාරකාර සහතිකපත් | (22) | (91) |
| ස්ථාවර තැන්පතු | 57 | (159) |
| වරණීය කොටස් | 24 | (3) |
| බැංකු ශේෂය | 1 | (1) |
| | (316) | (585) |
| ඌණ/(අධි) හානිකරණ සඳහා වෙන්කිරීම්/හානිකරණ වියදම් | **(316)** | **(585)** |

SLFRS 09 හි දක්වා ඇති විධිවිධාන වලට අනුව හානිකරණ ආකෘතිය, දරන ලද අලාභ ආකෘතියේ සිට අපේක්ෂා කළ හැකි ණය අලාභ ආකෘතිය ලෙස වෙනස් කරන ලද විස්තරාත්මක තොරතුරු සටහන 30 හි දක්වා ඇත.

## 10 වෙනත් ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය<br>රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව<br>රු.000 | එකතුව<br>රු.000 | එකතුව<br>රු.000 |
| අධිභාර | 277,348 | - | 277,348 | 367,196 |
| ගාස්තු ආදායම් | - | - | - | 17,558 |
| වෙනත් ආදායම් | 15 | 6,421 | 6,436 | 18,225 |
| | **277,363** | **6,421** | **283,784** | **402,979** |

## 11 මෙහෙයුම් වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය<br>රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව<br>රු.000 | එකතුව<br>රු.000 | එකතුව<br>රු.000 |
| සේවක පිරිවැය | 631,843 | 430,755 | 1,062,598 | 967,371 |
| පරිපාලන පිරිවැය | 235,442 | 215,257 | 450,699 | 469,986 |
| වෙනත් වියදම් | 59,972 | 8,529 | 68,501 | 67,980 |
| | **927,257** | **654,541** | **1,581,798** | **1,505,337** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 12 ආදායම් බදු වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|
| වර්ෂයේ ලාභය මත ගෙවිය යුතු ආදායම් බදු (12.1) | 35,659,310 | 24,929,433 |
| පෙර වර්ෂයන්ට අදාළ ප්‍රතිපාදන ඌණ/(අධි) වෙන් කිරීම් | (694,758) | 917,466 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ක්‍රමක්ෂය කරන ලද රඳවා ගැනීමේ බදු | - | 4,873,458 |
| | **34,964,552** | **30,720,357** |

බදු වියදම

ප්‍රවර්ථන කාල පරිච්ඡේදයේ බදු වන ලාභය වෙනුවෙන් ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු මුදල සහ පෙර වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම් බදු වියදමට කරන ලද ගැලපීම්වලින් බදු වියදම සමන්විත වේ. ප්‍රවර්ථන වර්ෂයේ බදු වගකීම ගණනයට අදාල වන නීතීන්, නියෝගයන්, නිර්ණායකයන් මත ප්‍රවර්ථන වර්ෂය සඳහා වන බදු වියදම ගණනය කර තිබේ.

**අදාළ බදු නීති යටතේ යොදා ගනු ලබන වැදගත් ප්‍රතිපාදනවල සාරාංශය**

(අ) 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතට අනුව 2018 අප්‍රේල් මස පළමු වන දින සිට බලපැවැත්වෙන පරිදි 14% ක අනුපාතයකට යටත්ව ආදායම් බදු ගෙවිය යුතුය.

(ආ) අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම මත ගෙවන ලද රඳවා ගැනීම් බදු, එම බැඳුම්කරයේ මුළු ජීවිත කාලය පුරාම බදු වියදමක් ලෙස හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත්, නව දේශීය ආදායම් පනත අනුව රජයේ සුරැකුම්පත් සඳහා වන රඳවා ගැනීම් බදු අහෝසි කිරීම හේතුවෙන්, 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි රඳවා ගැනීම් ක්‍රමක්ෂය කර බදු වියදම් ලෙස හඳුනා ගැනීම කරනු නොලැබේ.

### 12.1 බදු පෙර ලාභය සහ බදු අයකළ හැකි ආදායම අතර සැසඳුම

| | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|
| ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභ) / ආයෝජන ආදායම | 257,740,908 | 222,440,118 |
| ගැලපුම්; | | |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී | - | (46,169,606) |
| ණයකර මත පොලිය | - | (1,091,830) |
| භාරකාර සහතිකපත් මත පොලිය | - | (52,220) |
| ස්ථාවර තැන්පතු මත පොලිය | - | (1,335,327) |
| ලාභාංශ ආදායම | (6,247,497) | (3,887,578) |
| කොටස් මත ප්‍රාග්ධන ලාභ | - | (7,214) |
| භාණ්ඩාගාර බිල්පත් මත වූ ප්‍රාග්ධන ලාභ | (137) | (2) |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ක්‍රමක්ෂය ලාභ | - | (2,617,453) |
| ණයකර මත ක්‍රමක්ෂය අලාභ | - | 41 |
| මූල්‍ය උපකරණ මත උපලබ්ධි නොවූ අලාභ/(ලාභ) - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | 1,890,010 | 10,901,286 |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් මත වූ හානිකරණ අලාභ | (316) | (585) |
| වෙනත් ආදායම් | - | 402,979 |
| ඉඩදෙනු නොලබන වියදම් | 1,326,391 | - |
| වෙනත් ආදායම ඉපයීමේ දී සිදු වූ වියදම් | - | (1,434) |
| බදු සඳහා ගලපන ලද ආදායම | 254,709,359 | 178,581,175 |
| අරමුදල සඳහා වර්තමාන බදු වියදම | | |
| 10% (2018.03.31 දක්වා) | - | 179,829 |
| 14% (2018.04.01 න් පසු) | 35,659,310 | 24,749,604 |
| | 35,659,310 | 24,929,433 |

## 13. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම් මත ශුද්ධ ලාභය/(අලාභය)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019<br>රු.000 | 2018<br>රු.000 |
|---|---|---|
| ලැයිස්තුගත කොටස් මත ලාභ/ (අලාභ) | (7,249) | - |
| | **(7,249)** | **-** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 14 දේපළ, පිරියත හා උපකරණ

### 14.1 මුදල් මණ්ඩලය සහ කම්කරු දෙපාර්තමේන්තුව :- 2019

| | පරිගණක උපකරණ | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | කාර්යාලයීය උපකරණ | රථවාහන | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට | 558,950 | 103,587 | 400,979 | 97,202 | 6,423 | 1,167,142 |
| වර්ෂය තුළ එකතුවීම් | 6,082 | 6,412 | 17,288 | - | - | 29,782 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| ගැළපීම් | - | - | - | - | - | - |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 565,032 | 109,999 | 418,267 | 97,202 | 6,423 | 1,196,924 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට | 467,845 | 80,259 | 272,662 | 56,093 | 4,132 | 880,992 |
| වාර්ෂික අය කිරීම් | 16,177 | 6,231 | 22,024 | - | 614 | 45,046 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| ගැළපීම් | - | - | - | - | - | - |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 484,022 | 86,490 | 294,686 | 56,093 | 4,746 | 926,038 |
| **ශුද්ධ පොත් අගය** | | | | | | |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 81,010 | 23,509 | 123,581 | 41,109 | 1,677 | 270,886 |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 91,105 | 23,328 | 128,317 | 41,109 | 2,291 | 286,150 |

මුදල් මණ්ඩලය සහ කම්කරු දෙපාර්තමේන්තුව :- 2018

| | පරිගණක උපකරණ | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | කාර්යාලයීය උපකරණ | රථවාහන | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට | 537,080 | 99,174 | 397,187 | 103,568 | 6,406 | 1,143,415 |
| වර්ෂය තුළ එකතුවීම් | 26,206 | 4,413 | 5,111 | - | 18 | 35,748 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| මාරු කිරීම්/ගැළපීම් | (4,336) | - | (1,319) | (6,366) | - | (12,021) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **558,950** | **103,587** | **400,979** | **97,202** | **6,423** | **1,167,142** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට | 457,691 | 71,520 | 251,759 | 60,295 | 3,478 | 844,743 |
| වාර්ෂික අය කිරීම් | 9,952 | 8,739 | 21,068 | - | 654 | 40,412 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| මාරු කිරීම්/ගැළපීම් | 203 | - | (165) | (4,202) | - | (4,163) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **467,845** | **80,259** | **272,662** | **56,093** | **4,132** | **880,992** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **91,105** | **23,328** | **128,317** | **41,109** | **2,291** | **286,150** |
| **2017 දෙසැම්බර් 31 දිනට** | **79,389** | **27,654** | **145,428** | **43,273** | **2,928** | **298,672** |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

දේපළ, පිරියත හා උපකරණ (සම්බන්ධවයි ....)

**14.2** **2019**

| | පරිගණක උපකරණ | | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | | කාර්යාලයීය උපකරණ | | රථවාහන | | වෙනත් | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැය** | | | | | | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට | 118,558 | 440,392 | 46,012 | 57,575 | 19,239 | 381,741 | - | 97,202 | 6,071 | 352 | 189,880 | 977,261 | 1,167,141 |
| වර්ෂය තුළ එකතුවීම් | 6,082 | - | 1,920 | 4,492 | 4,353 | 12,935 | - | - | - | - | 12,355 | 17,427 | 29,782 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගැළපීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **124,640** | **440,392** | **47,932** | **62,067** | **23,592** | **394,676** | **-** | **97,202** | **6,071** | **352** | **202,235** | **994,688** | **1,196,923** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට | 111,489 | 356,357 | 31,207 | 49,052 | 15,972 | 256,690 | - | 56,094 | 3,780 | 352 | 162,446 | 718,545 | 880,991 |
| වාර්ෂික අය කිරීම් | 2,240 | 13,937 | 3,597 | 2,634 | 1,969 | 20,055 | - | - | 614 | - | 8,420 | 36,626 | 45,046 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගැළපීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **113,729** | **370,294** | **34,804** | **51,686** | **17,941** | **276,745** | **-** | **56,094** | **4,394** | **352** | **170,866** | **755,171** | **926,037** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | **10,911** | **70,098** | **13,128** | **10,381** | **5,651** | **117,930** | **-** | **41,109** | **1,678** | **-** | **31,369** | **239,517** | **270,886** |
| 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **7,069** | **84,035** | **14,805** | **8,523** | **3,267** | **125,051** | **-** | **41,109** | **2,291** | **-** | **27,434** | **258,716** | **286,150** |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

දේපළ, පිරියත හා උපකරණ (සම්බන්ධවයි ....)

**14.2** **2018**

| | පරිගණක උපකරණ | | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | | කාර්යාලයීය උපකරණ | | රථවාහන | | වෙනත් | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්. | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැය** | | | | | | | | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට | 114,620 | 422,460 | 46,012 | 53,162 | 18,644 | 378,543 | - | 103,568 | 6,054 | 352 | 185,330 | 958,085 | 1,143,415 |
| වර්ෂය තුළ එකතුවීම් | 3,938 | 22,269 | - | 4,413 | 595 | 4,516 | - | - | 18 | - | 4,550 | 31,198 | 35,748 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගැළපීම් | - | (4,336) | - | - | - | (1,319) | - | (6,366) | - | - | - | (12,021) | (12,021) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **118,558** | **440,392** | **46,012** | **57,575** | **19,239** | **381,741** | **-** | **97,202** | **6,071** | **352** | **189,880** | **977,261** | **1,167,141** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට | 109,046 | 348,645 | 27,684 | 43,836 | 13,984 | 237,775 | - | 60,295 | 3,126 | 352 | 153,840 | 690,903 | 844,743 |
| වාර්ෂික අය කිරීම් | 2,442 | 7,510 | 3,523 | 5,216 | 1,988 | 19,080 | - | - | 654 | - | 8,606 | 31,805 | 40,412 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගැළපීම් | - | 203 | - | - | - | (165) | - | (4,202) | - | - | - | (4,163) | (4,163) |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **111,489** | **356,357** | **31,207** | **49,052** | **15,972** | **256,690** | **-** | **56,094** | **3,780** | **352** | **162,446** | **718,545** | **880,992** |
| 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **7,069** | **84,035** | **14,805** | **8,523** | **3,267** | **125,050** | **-** | **41,109** | **2,292** | **-** | **27,434** | **258,717** | **286,150** |
| 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **5,574** | **73,815** | **18,328** | **9,326** | **4,660** | **140,768** | **-** | **43,273** | **2,928** | **-** | **31,490** | **267,182** | **298,672** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**15. අස්පෘශ්‍ය වත්කම්**

| පරිගණක මෘදුකාංග | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | |
| ජනවාරි 01 දිනට | 34,242 | 4,626 | 38,868 | 33,866 |
| වර්ෂය තුළ දී අත්පත් කරගැනීම් | 1,348 | - | 1,348 | 5,002 |
| දෙසැම්බර් 31 දිනට | **35,590** | **4,626** | **40,216** | **38,868** |
| ක්‍රමක්ෂය | | | | |
| ජනවාරි 01 දිනට | 33,009 | 1,639 | 34,648 | 32,729 |
| වර්ෂය තුළ දී අත්පත් කරගැනීම් | 408 | 1,542 | 1,950 | 1,919 |
| දෙසැම්බර් 31 දිනට | **33,417** | **3,181** | **36,598** | **34,648** |
| ශුද්ධ පොත් අගය | | | | |
| ජනවාරි 01 දිනට | 1,233 | 2,987 | 4,220 | 1,137 |
| දෙසැම්බර් 31 දිනට | **2,173** | **1,445** | **3,618** | **4,220** |

**16 . ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට**

| දෙසැම්බර් 31 දිනට | **2019** | | **2018** | |
|---|---|---|---|---|
| | පිරිවැය | වෙළෙඳපොළ අගය | පිරිවැය | වෙළෙඳපොළ අගය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කොටස් ආයෝජනය | | | | |
| ලැයිස්තුගත කොටස් (සටහන 16.1) | 368,903 | 361,654 | - | - |
| ලැයිස්තුගත නොවූ කොටස් (සටහන 16.2) | 9,640,989 | 9,140,989 | 10,414,892 | 9,914,892 |
| මුළු ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | **10,009,892** | **9,502,643** | **10,414,892** | **9,914,892** |

ලැයිස්තුගත නොකළ කොටස් හි සාධාරණ අගය විශ්වාසනීය ලෙස ගණනය කළ නොහැකි වීම හේතුවෙන් එම කොටස් අඛණ්ඩව පිරිවැය මත හිණුම්ගත කර ඇති අතර, ඇස්තමේන්තුගත සාධාරණ අගයන් සටහන 31 හි වෙනම අනාවරණය කර ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට (සම්බන්ධයි...)**

**16.1** ලැයිස්තුගත කොටස්

| දෙසැම්බර් 31 දිනට | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | පිරිවැය | පොත් අගය | පිරිවැය | පොත් අගය |
| සමාගමේ නම | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ලාෆ් ගෑස් පවර් ලිමිටඩ් (ඡන්ද) | 281,261 | 289,489 | - | - |
| ලාෆ් ගෑස් පවර් ලිමිටඩ් (නිෂ්ඡන්ද) | 87,642 | 72,165 | - | - |
| | **368,903** | **361,654** | - | - |

**16.2** ලැයිස්තුගත නොකළ කොටස්

| දෙසැම්බර් 31 දිනට | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | පිරිවැය | පොත් අගය | පිරිවැය | පොත් අගය |
| සමාගමේ නම | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | 5,000,000 | 5,000,000 | 5,000,000 | 5,000,000 |
| කාර්ගිල්ස් බැංකුව | 495,000 | 495,000 | 495,000 | 495,000 |
| ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | 625 | 625 | 625 | 625 |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් | 500,000 | 0.1 | 500,000 | 0.1 |
| වැලිගම හොටෙල් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම | - | - | 405,000 | 405,000 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් - (ඡන්ද) | 62,282 | 62,282 | 62,282 | 62,282 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් - (නිෂ්ඡන්ද) | 19,407 | 19,407 | 19,407 | 19,407 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් - (ඡන්ද) | 448,820 | 448,820 | 448,820 | 448,820 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් - (නිෂ්ඡන්ද) | 139,855 | 139,855 | 139,855 | 139,855 |
| ලාෆ් ගෑස් පවර් ලිමිටඩ් - (ඡන්ද) | - | - | 281,261 | 281,261 |
| ලාෆ් ගෑස් පවර් ලිමිටඩ් - (නිෂ්ඡන්ද) | - | - | 87,642 | 87,642 |
| වෙස්ට් කොස්ට් පවර් පුද්ගලික සමාගම | 2,975,000 | 2,975,000 | 2,975,000 | 2,975,000 |
| | **9,640,989** | **9,140,989** | **10,414,892** | **9,914,892** |

ලාෆ් ගෑස් පී.එල්.සී. ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් සේ.අ. අරමුදල ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ්, ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ්, ලාෆ් ගෑස් පවර් ලිමිටඩ් හි කොටස්කරුවෙකු බවට පත්ව ඇත. ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් හි කොටස් 2019.10.30 වන දින කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කර තිබේ.

වැලිගම හොටෙල් ප්‍රොපර්ටීස් හි කොටස් 2019 වසරේ අප්‍රේල් මාසයේ දී එච්.පී.එල්. ප්‍රොපටීස් (වෙස්ට් ඒෂියා) පුද්ගලික සමාගම වෙත රු. මිලියන 495කට විකුණා දමන ලදී. ඒ හේතුවෙන් උපලබ්ධි වූ රුපියල් මිලියන 90 ක වටිනාකම රඳවා ගත් ලාභ සංචිතය වෙත මාරු කරන ලදී.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

17 ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට

| දෙසැම්බර් 31 දිනට | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | පිරිවැය<br>රු.000 | සාධාරණ අගය<br>රු.000 | පිරිවැය<br>රු.000 | සාධාරණ අගය<br>රු.000 |
| කොටස් වල ආයෝජනය | | | | |
| ලැයිස්තුගත වූ කොටස් (සටහන 17.1) | 83,327,075 | 65,907,115 | 80,467,243 | 64,937,663 |
| **මුළු ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට** | **83,327,075** | **65,907,115** | **80,467,243** | **64,937,663** |

17.1 ලැයිස්තුගත කොටස්

| දෙසැම්බර් 31 දිනට | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | පිරිවැය | සාධාරණ අගය | පිරිවැය | සාධාරණ අගය |
| සමාගමේ නම | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ඇක්සස් ඉංජිනියරින් පී.එල්.සී. | 448,736 | 446,427 | 448,736 | 288,744 |
| ඒ.සී.එල්. කේබල්ස් පී.එල්.සී. | 155,514 | 339,677 | 155,514 | 218,575 |
| ඒ.සී.එල්. ප්ලාස්ටික්ස් පී.එල්.සී. | 19,893 | 24,490 | 19,893 | 11,327 |
| එයිට්කන් ස්පෙන්ස් පී.එල්.සී. | 1,997,136 | 957,480 | 1,997,136 | 984,249 |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 1,710,207 | 853,693 | 1,710,207 | 850,543 |
| අමායා ලෙෂර් පී.එල්.සී. | 348,646 | 190,625 | 348,646 | 207,766 |
| ඒෂියන් හොටෙල්ස් සහ ප්‍රොපර්ටීස් පී.එල්.සී. | 3,273,782 | 1,832,617 | 3,273,782 | 1,941,216 |
| ආසිරි සර්ජිකල් හොස්පිටල් පී.එල්.සී. | 1,681 | 2,401 | 1,681 | 2,354 |
| බයිරහ ෆාර්ම්ස් පී.එල්.සී. (ඡන්ද) | 5,274 | 3,974 | 5,274 | 4,425 |
| බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 40,338 | 16,213 | 40,338 | 17,159 |
| බොගවන්තලාව ටී ස්ටේට්ස් පී.එල්.සී. | 1,463 | 850 | 1,463 | 776 |
| බ්‍රවුන්ස් සහ සමාගම පී.එල්.සී. | 1,799,560 | 504,076 | 1,799,560 | 421,792 |
| බ්‍රවුන්ස් කැපිටල් පී.එල්.සී. | - | - | 525 | 367 |
| බ්‍රවුන්ස් ඉන්වෙස්මන්ට් පී.එල්.සී. (ඡන්ද) | - | - | 3,690 | 3,957 |
| බුකිත් දාරා පී.එල්.සී. | 2,310,610 | 657,596 | 2,310,610 | 586,150 |
| සී.ඩබ්. මැකී පී.එල්.සී. | 12,644 | 6,288 | 12,644 | 6,149 |
| කාර්ගිල්ස් (සිලෝන්) පී.එල්.සී. | 1,372,001 | 1,622,615 | 1,372,001 | 1,681,467 |
| කාසන්ස් කම්බර්බැච් පී.එල්.සී. | 2,607,240 | 1,064,491 | 2,607,240 | 953,560 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් පී.එල්.සී. | 2,684,195 | 2,464,943 | 2,666,017 | 2,083,117 |
| සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පී.එල්.සී. | 1,005,585 | 366,513 | 1,005,585 | 318,358 |
| සිලෝන් ගාඩියන් ඉන්වෙස්මන්ට් ට්‍රස්ට් පී.එල්.සී. | 555,487 | 271,117 | 555,487 | 196,285 |
| සිලෝන් හොස්පිට්ල්ස් පී.එල්.සී. (ඡන්ද) | 106,534 | 84,005 | 106,534 | 76,574 |
| සිලෝන් හොස්පිට්ල්ස් පී.එල්.සී. (නිඡ්ඡන්ද) | 25,411 | 77,805 | 25,411 | 79,652 |
| සිලෝන් හොටෙල් කෝපරේෂන් පී.එල්.සී. | 711,243 | 253,928 | 711,243 | 258,232 |
| සිලෝන් ටී සර්විසස් පී.එල්.සී. | 1,082,639 | 906,902 | 1,082,639 | 977,901 |
| සිලෝන් තියටර්ස් පී.එල්.සී. | 1,086,557 | 1,292,183 | 1,086,557 | 1,310,631 |
| චෙමෙනෙක්ස් පී.එල්.සී. | 1,454 | 1,362 | 1,454 | 1,153 |
| චෙව්රොන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී. | 49,564 | 76,092 | 49,564 | 73,959 |
| සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී. (නිඡ්ඡන්ද) | 221,726 | 132,253 | 221,726 | 83,353 |
| සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී. (ඡන්ද) | 694,300 | 396,268 | 694,300 | 261,537 |
| කොළඹ නැව් තටාකාංගනය පී.එල්.සී. | 2,791,809 | 728,129 | 2,791,809 | 652,967 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 9,385,626 | 8,793,072 | 9,228,951 | 10,475,382 |
| ඩී.එෆ්.සී.සී. බැංක් පී.එල්.සී. | 3,395,968 | 2,239,511 | 3,395,968 | 2,266,317 |
| ඩයලොග් ආසියාටා පී.එල්.සී. | 2,255,649 | 2,920,316 | 1,742,543 | 1,825,950 |
| ඩීසල් සහ මෝටර් ඉංජිනියරින් පී.එල්.සී. | 1,625,690 | 564,883 | 1,625,690 | 606,367 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**17.1** ලැයිස්තුගත කොටස් (සම්බන්ධයි ...)

| සමාගමේ නම | පිරිවැය රු.000 | සාධාරණ අගය රු.000 | පිරිවැය රු.000 | සාධාරණ අගය රු.000 |
|---|---|---|---|---|
| ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පී.එල්.සී. | 866,679 | 641,532 | 866,679 | 649,169 |
| එක්ස්පෝ ලංකා හෝල්ඩින්ග්ස් පී.එල්.සී. (ඡන්ද) | 8,421 | 4,929 | 8,421 | 3,866 |
| ගාලදාරි හොටෙල්ස් ලංකා පී.එල්.සී. | 810,322 | 215,781 | 810,322 | 163,614 |
| හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. | 6,655,723 | 6,736,308 | 6,539,703 | 8,248,574 |
| හේකාර්බ් පී.එල්.සී. | 238,460 | 269,337 | 238,460 | 184,283 |
| හේලීස් ෆැබ්රික් පී.එල්.සී. | 213,592 | 99,179 | 213,592 | 50,421 |
| හේලීස් පී.එල්.සී. | 1,096,572 | 660,531 | 1,096,572 | 706,228 |
කොටස් මිල අවදානම : කොටස් මිල අවදානම යනු කොටස් මිල පහත යාම නිසා කොටස් ආයෝජන කළඹෙහි අගය අඩු වීමයි. මෙය කොටස් ආයෝජනයෙහි ආවේනික අවදානමක් වන අතර, ඉහළ අගයක් සහිත මූලික වශයෙන් ස්ථාවර කොටස්වල ආයෝජනය කිරීම මගින් එම අවදානම අවම කෙරේ. තවදුරටත්, ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹ විවිධ අංශ වලට විවිධාංගීකරණය කර ඇති අතර, කොටස් ආයෝජන කළඹ මුළු අරමුදලෙන් 3.8% ක ප්‍රමාණයක් වන නිසා සහ ආයෝජන කළඹ විටින් විට සහ අවශ්‍ය අවස්ථාවල දී යෝග්‍ය පරිදි ගැලපීම් කරන නිසා ආයෝජන කළඹ මත වෙළෙඳපොළ අවදානම ඉතා අඩුය.

**අවදානම් එක්තැන් කිරීම විශ්ලේෂණය - ආංශික වශයෙන් විශ්ලේෂණය කිරීම**

| | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | වටිනාකම | % | වටිනාකම | % |
| | රු.000 | | රු.000 | |
| මෝටර් රථ හා උපාංග | 98,635 | 0.12% | 98,635 | 0.12% |
| බැංකු | 30,234,542 | 36.12% | 27,950,692 | 34.74% |
| ප්‍රග්ධන භාණ්ඩ | 16,250,477 | 19.42% | 16,250,477 | 20.20% |
| කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සහ ඇගලුම් | 225,634 | 0.27% | 213,592 | 0.27% |
| පාරිභෝගික සේවා | 10,084,276 | 12.05% | 10,084,276 | 12.53% |
| විවිධාංගික සමාගම් - මූල්‍ය | 6,596,955 | 7.88% | 6,541,906 | 8.13% |
| විවිධාංගික සමාගම් | - | - | 4,214 | 0.01% |
| බලශක්ති | 2,427,634 | 2.90% | 2,427,634 | 3.02% |
| ආහාර සහ මූලික සිල්ලර වෙළෙඳාම | 2,458,558 | 2.94% | 2,458,558 | 3.06% |
| ආහාර, බීම හා දුම්කොළ | 7,265,575 | 8.68% | 7,265,575 | 9.03% |
| සෞඛ්‍ය සේවා උපකරණ හා සේවාවන් | 155,190 | 0.19% | 155,190 | 0.19% |
| ද්‍රව්‍ය | 2,768,161 | 3.31% | 2,768,161 | 3.44% |
| විදුලිබල හා බලශක්ති | 368,903 | 0.44% | - | - |
| මූර්ත දේපළ | 1,416 | 0.00% | 1,416 | 0.00% |
| සිල්ලර වෙළෙඳාම | 1,638,334 | 1.96% | 1,638,334 | 2.04% |
| විදුලි සංදේශ සේවා | 3,113,268 | 3.72% | 2,600,163 | 3.23% |
| ප්‍රවාහන | 8,421 | 0.01% | 8,421 | 0.01% |
| **එකතුව** | **83,695,978** | **100%** | **80,467,243** | **100%** |

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු සේවක අර්ථසාධක අරමුදලට එහි මූල්‍ය බැඳීම් හා වගකීම් අවශ්‍ය විටදී සපුරාලීමට ඇති නොහැකියාවයි. වසර තුළ දී අරමුදලේ ශුද්ධ දායකත්වය මසකට රුපියල් බිලියන 2.6 කට ආසන්න විය. තවදුරටත් පොලී හා කල්පිරීමේ ප්‍රතිෂ්ඨාව අරමුදලට අමතර මුදල් ප්‍රවාහ සපයනු ලබයි. සේවක අර්ථසාධක අරමුදල එක් දින ප්‍රති විකුණුම් වෙළෙඳපොළෙහි ක්‍රියාකාරී ණය සපයන්නෙකු වශයෙන් පොලී ආදායම් ඉපයීමට සහ අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවන් සපුරා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත.

ඊට අමතරව, අරමුදලේ විශාලත්වය සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළේ සංවර්ධනය වෙමින් පවතින අවධිය හේතුවෙන් අරමුදල වෙළෙඳපොළ ද්‍රවශීලතා අවදානමට මුහුණ දෙයි. විශේෂයෙන්, අරමුදල සැළකිය යුතු ප්‍රමාණයේ සුරැකුම්පත් බැහැරකරන විට, එය වෙළෙඳපොළේ මිලට අහිතකර ලෙස බලපායි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය තුළ සාමාන්‍ය හා හදිසි තත්ත්වයන් යටතේ වගකීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් හැකිතාක් දුරට පවත්වා ගැනීම සහතික කිරීම සඳහා වන පියවර අන්තර්ගත වන අතර, එමගින් පිළිගත නොහැකි මට්ටමේ අලාභ හෝ අරමුදලේ කීර්තිනාමයට හානි වීමේ අවදානම වළක්වනු ලබයි.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**ද්‍රවශීලතා අවදානම (සම්බන්ධයි . . .)**

තවද, අරමුදල මගින් ද්‍රවශීලතා අරමුණ වෙනුවෙන් විවිධ පරිණත කාල සහිත හා ඉතා ඉහළ ද්‍රවශීලතාවක් සහිත උපකරණයන් ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යාම හරහා සමස්ත අරමුදලේ ද්‍රවශීලතා අවදානම ඉතා අවම මට්ටමක පවතින බව සැලකිය හැක. ආයෝජන කළඹේ කල්පිරීමේ පැතිකඩ සටහන් අංක 32 හි දක්වා ඇත.

**මෙහෙයුම් අවදානම**

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවූ හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගල හා පද්ධති හෝ බාහිර සිදුවීම් මගින් ඇතිවන අලාභයන් නිසා ඇතිවන අවදානමයි. අරමුදලේ සාමාජික ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ සියළුම ගනුදෙනු කේන්ද්‍රීයව වාර්තාකරණ පද්ධතියකින් වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියේ ක්‍රියාවලීන් වැඩි වශයෙන් ඒකාබද්ධ කිරීමට පහසුකම් සලසමින්, අඩු හස්ත මැදිහත්වීමක් සමඟ සැලකිය යුතු මෙහෙයුම් කාර්යක්ෂමතාවක් හා දත්තවල ඉහළ නිරවද්‍යතාවක් වෙත පත්ව ඇත. නවීන තාක්ෂණික භාවිතයන්ට ගැළපෙන පරිදි පොදු ලෙජරය හා භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇත.

තවද, අරමුදලට අදාළ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කරනුයේ ගනුදෙනු සඳහා නිශ්චිත අධිකාරිය ලත් මට්ටම්, මෙහෙයුම් අත්පොත් පවත්වා ගැනීම, මුරපද ආරක්ෂණය මගින් තොරතුරු වලට ප්‍රවේශය සීමා කිරීම, වෙන් වූ ආයෝජන කළමනාකරණ ඒකකයක් පවත්වාගෙන යාම සහ මෙහෙයුම් අවදානම ලේඛනගත කිරීම වැනි දෑ මගිනි. අරමුදලේ මෙහෙයුම් අවදානම තවදුරටත් අවම කර ඇත්තේ සාමාජික ගිණුම් පවත්වා ගැනීමට මංගත තත්කාලීන උපස්ථ (online real-time backup) පද්ධතියක් පවත්වා ගැනීමෙන් වන අතර, අරමුදල සම්බන්ධ කාර්යයන් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට සමත්ව ඇත. මීට අමතරව, අනපේක්ෂිත අවස්ථාවල දී සාමාන්‍ය පරිදි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා උපක්‍රමික සැලැස්ම වසරක් පාසා සමාලෝචනය කරයි. මෙහෙයුම් කටයුතු අභ්‍යන්තර විගණනයකට යටත්වන අතර, එම විගණන සොයා ගැනීම් අඛණ්ඩව සාකච්ඡා කරනු ලැබේ. තවද, බාහිර සේවා සැපයුම්කරුවකු විසින් තත්කාලීන වලංගුකරණය හා සේවක අර්ථසාධක අරමුදල් ගනුදෙනුවල සත්‍යාපනය සිදු කරන අතර දුර්වලතා මාසිකව සාකච්ඡා කරනු ලැබේ.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)**

**30 හානිකරණ තක්සේරුවට යටත් වූ මූල්‍ය ආයෝජන මත හානිකරණ අලාභ**

SLFRS 09 ට අනුගත වීමේ දී සේවක අර්ථසාධක අරමුදල, LKAS 39 යටතේ දරා ඇති අලාභ ආකෘතිය මත පදනම්ව ගණනය කළ හානිකරණය වෙනුවට ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව අපේක්ෂිත ණය අලාභ ආකෘතිය භාවිතා කරමින් තීර්ණය කළ හානිකරණය දක්වයි. ඒ අනුව, පහත දැක්වෙන මූල්‍ය උපකරණ අපේක්ෂිත ණය අලාභ ආකෘතිය භාවිතා කරමින් වූ හානිකරණ වෙන්කිරීම් වලට යටත් වේ.

I හිමිකම් කොටස් වල ආයෝජනයන් හැර, වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද සියලුම මූල්‍ය වත්කම්.

II ක්‍රමක්ෂය කළ පිරිවැයට මිනුම් කරන ලද සියලුම මූල්‍ය වත්කම්

ඒ අනුව, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, සාංගමික ණය සුරැකුම්පත්, භාරකාර සහතිකපත්, ප්‍රති විකුණුම්, ස්ථාවර තැන්පතු සහ බැංකු ශේෂයන් හානිකරණ වෙන් කිරීම් සඳහා සලකනු ලබයි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වැනි රාජ්‍ය සුරැකුම්පත් හානිකරණයට හේතු නොවේ. මන්ද, රටේ පරමාධිපත්‍ය, ගනුදෙනුකාර පාර්ශවය වන අතර, මෙම උපකරණ මනිනු ලබන්නේ රුපියල් අගයන් මතය.

**ක්‍රමවේදයන්**
අතීත අලාභයන් සැලකිල්ලට ගනිමින් අපේක්ෂිත ණය අලාභ ආකෘතියන් (ECL) ගොඩනැගීමේ හැකියාවක් පවතින නමුත් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට අතීත අලාභයන් පිළිබඳව අත්දැකීමක් නොමැත. එහිදී සේවක අර්ථසාධක අරමුදල, බාහිර ප්‍රවාහයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද අලාභ සංඛ්‍යාලේඛන සැලකිල්ලට ගනී. උදා: ප්‍රසිද්ධියේ ලබාගත හැකි බ්ලූම්බර්ග් තොරතුරු.

සේවක අර්ථසාධක අරමුදල විසින් බ්ලූම්බර්ග් මගින් ප්‍රකාශයට පත් කරන ලද ණය පැහැර හැරීම්වල සම්භාවිතාවයට එරෙහිව නිකුත් කරන්නාගේ ශ්‍රේණිගත කිරීම් ගළපන අතර, එහිදී පහත සඳහන් වෙනස්කිරීම් සලකා බලයි.

**I ණය පැහැර හැරීමේ සම්භාවිතා වක්‍රය හරහා වෙනස්වීම (TTC PD)**
බ්ලූම්බර්ග් හානි සංඛ්‍යා මගින් TTC PD පෙන්නුම් කරන අතර, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාග මනය පදනම් පරිවර්තන ප්‍රවේශයට අනුකූලව සිදු කළ ආර්ථික සාධක ගැලපීම් යොදා ගනිමින්, එය (TTC PD ) නියමිත කොටසට නියමිත වේලාවට (PiT) පරිවර්තනය කරනු ලබයි.

**II ණය පැහැර හැරීමේ සම්භාවිතා ආකෘතියේ ආයු කාලය**
බ්ලූම්බර්ග් ණය පැහැර හැරීමේ සම්භාවිතාවය මගින් සැලකිය යුතු ලෙස පිරිහී ඇති ආයෝජන වල මාස 12 ක අපේක්ෂිත ණය අලාභය ඉදිරිපත් කරයි. මාස 12 ක ණය පැහැර හැරීමේ සම්භාවිතාවය භාවිතා කරමින් තක්සේරු කළ ණය පැහැර හැරීමේ සම්භාවිතාවේ වක්‍රය මත පදනම්ව සේවක අර්ථසාධක අරමුදල ණය පැහැර හැරීමේ සම්භාවිතා ආයුකාලය සලකා බලයි.

**III ණය පැහැර හැරීම් අවධානමේ සැලකිය යුතු පිරිහීම නිර්ණය කිරීම**
සේවක අර්ථසාධක අරමුදල විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ආයෝජන හා ආයෝජන නොවන ශ්‍රේණි නිර්වචන මත පදනම්ව ණය ගෙවීම් පැහැර හැරීම පිළිබඳ අවධානම සැලකිය යුතු ලෙස තීරණය කරයි. සාමාන්‍යයෙන් "BBB-" වලට පහළින් වූ ශ්‍රේණිගත කිරීම් ආයෝජන නොවන ශ්‍රේණියේ ආයෝජන ලෙස සලකයි. මේ අනුව, සේවක අර්ථසාධක අරමුදල විසින් මෙවැනි ආයෝජන, ණය පැහැර හැරීමේ අවධානමේ සැලකිය යුතු පිරිහීමක් සිදු වීමක් ලෙස සලකයි. මෙවැනි ආයෝජන සඳහා සේවක අර්ථසාධක අරමුදල විසින් එහි ආයු කාලයටම අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සිදු කරයි.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**30** හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

ගෝලීය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සාමාන්‍යයෙන් පිළිගත් ශ්‍රේණිගත කිරීම් විශ්ලේෂණය කිරීම පහත පරිදි වේ.

| ICRA ණය ශ්‍රේණිගත කිරීම් | ෆිට්ච් ණය ශ්‍රේණිගත කිරීම් | මූඩිස් ශ්‍රේණිගත කිරීම් | බ්ලූම්බර්ග් අවුරුද්දක ණය ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | ණය පැහැර හැරීම පිළිබඳ සම්භාවිතාව ඉහළ සීමාව |
| AAA | AAA | Aaa | IG-1 | 0.00% |
| AA+ | AA+ | Aa1 | IG-2 | 0.00% |
| AA | AA | Aa2 | IG-3 | 0.01% |
| AA- | AA- | Aa3 | IG-4 | 0.02% |
| A+ | A+ | A1 | IG-5 | 0.03% |
| A | A | A2 | IG-6 | 0.05% |
| A- | A- | A3 | IG-7 | 0.10% |
| BBB+ | BBB+ | Baa1 | IG-8 | 0.17% |
| BBB | BBB | Baa2 | IG-9 | 0.30% |
| BBB- | BBB- | Baa3 | IG-10 | 0.52% |
| BB+ | BB+ | Ba1 | HY-1 | 0.88% |
| BB | BB | Ba2 | HY-2 | 1.50% |
| BB- | BB- | Ba3 | HY-3 | 2.40% |
| B+ | B+ | B1 | HY-4 | 4.00% |
| B | B | B2 | HY-5 | 6.00% |
| B- | B- | B3 | HY-6 | 10.00% |
| | CCC | Caa1 | DS-1 | 15.00% |
| | CCC | Caa2 | DS-2 | 22.00% |
| | CCC | Caa3 | DS-3 | 30.00% |
| | CCC | Ca | DS-4 | 50.00% |
| | DDD | C | DS-5 | 100.00% |
| | D | / | DDD | පැහැර හැරීම් |

IG-1 – IG-10: මාස 12 (ආයෝජන ශ්‍රේණි)

HY-1 – DDD: ජීවිතකාලය 1 (ආයෝජන නොවන ශ්‍රේණි)

IV පාඩු ලබා දී ඇති පැහැර හැරීම (LGD)

(LGD) අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීම සඳහා, 2018 දෙසැම්බර් 31 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද SLFRS 09 සම්මත කර ගැනීම පිළිබඳ උපදේශන පත්‍රයට අනුකූලව පහත දැක්වෙන LGD/අලාභ අනුපාත සේවක අර්ථසාධක අරමුදල විසින් සලකා බලයි.

a. දේශීය මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රතිවිකුණුම් 0%
b. අනෙකුත් සියලුම දේශීය මුදල් මූල්‍ය උපකරණ 45%

V අපේක්ෂිත ආර්ථික අලාභ නිර්ණය කිරීම සඳහා සේ.අ.අ. පෙර නිමි ලක්ෂය ලෙස වසර මැද එනම් මාස 06 ක් යොදා ගන්නා අතර, එහිදී පෙරනිමි සිද්ධීන් වර්ෂයේ ප්‍රථම භාගයේ දී හෝ අවසාන භාගයේ දී උත්පාදනය වේ යැයි සලකා බලයි.

VI ආර්ථික සාධක ගැලපුම ගණනය කරනු ලැබුවේ අතීතයේ සිට පුරෝකථනය කරන ලද සහ 2010 සිට 2023 දක්වා පුරෝකථනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධන අනුපාත සංඛ්‍යා ලේඛන වලින් ලබා ගැනීමෙනි.

VII මූල්‍ය ආයෝජන

අ. පහත දැක්වෙන නිකුත් කරන්නන්/ප්‍රතිපාර්ශව සඳහා ණය ශ්‍රේණිගත කිරීමේ දත්ත සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නොමැත. එබැවින් බාහිර ණය ශ්‍රේණිගත කිරීම් පහත ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා ලදී.

ආ. වක්‍රය සවිකිරීමේ ව්‍යායාමය සඳහා බහු ඒජන්සි සඳහා අපි ෆිච්, මෝඩිස්, අයිසීආර්ඒ විසින් සලකා බැලූ ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක පරාමිතීන් ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සලකා බැලූ බව සඳහන් කලෙමු. වක්‍රය සවිකිරීමේ ව්‍යායාමය සිදු කරන විට ඉහළට/පහළට ක්‍රමාංකනය කිරීම අවශ්‍ය නොවේ.

ඇ. ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ආයෝජන සඳහා ශ්‍රී ලංකා ස්වෛරී ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව එකම බලසීමාවක් තුළ සිදු නොකරයි. ණය අවදානමේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් නොකරන අතර, එම නිසා සේ.අ.අ. මාස 12 සඳහා අපේක්ෂිත ණය අලාභ සැලකීමේ දී AAA හි හොඳම අවස්ථාව ලබාගනී.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

**30.1** ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇති වර්ෂය සඳහා මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ ගාස්තු පහත වගු වලින් දැක්වේ.

2019.12.31

| | | මට්ටම 1 | | මට්ටම 2 | | මට්ටම 3 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **රු.000** | **සටහන** | **තනි** | **සාමූහික** | **තනි** | **සාමූහික** | | |
| බැංකු මුදල් | 9 | 1 | - | - | - | - | 1 |
| | | | | | | | - |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම | 9 | (317) | - | - | - | - | (317) |
| **මුළු හානිකරණ අලාභ** | | (316) | - | - | - | - | (316) |

| 2019.12.31<br>රු.000 | සුවිශේෂී | සාමූහික (තනි තනිව සැලකිය යුතු නොවූ නිරාවරණ) | සාමූහික සිදුව ඇති නමුත් තවමත් හඳුනාගෙන නොමැති) | එකතුව |
|---|---|---|---|---|
| බැංකු ශේෂ සඳහා ණය අලාභ වියදම් | 1 | - | - | 1 |
| | 1 | - | | 1 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ සඳහා ණය පාඩු වියදම් | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | (376) | - | - | (376) |
| භාරකාර සහතිකපත් | (22) | - | - | (22) |
| ස්ථාවර තැන්පතු | 57 | - | - | 57 |
| මනාප කොටස් | 24 | - | - | 24 |
| | (317) | - | - | (317) |
| ශේෂ පත්‍ර අයිතම එකතුව | (316) | - | - | (316) |
| කපාහල ශේෂ පත්‍ර අයිතම | - | - | - | - |
| **එකතුව** | **(316)** | **-** | **-** | **(316)** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

**ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම**

ණය ගුණාත්මකභාවය සහ බාහිර ණය ශ්‍රේණිගත කිරීම් මත LKAS සඳහා ණය අවදානමට උපරිම නිරාවරණය වීම පහත වගුවේ දැක්වේ. දළ හානිකරණ දීමනා ඉදිරිපත් කර ඇත. අරමුදලේ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය සටහන් 30 විස්තර කර ඇති අතර තනි හෝ සාමූහික LKAS මත දීමනා ගණනය කරන්නේ ද යන්න පිළිබඳ ප්‍රතිපත්ති සටහන් 30 හි දක්වා ඇත.

| | **2019.12.31** | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මට්ටම 1 සාමූහික | | මට්ටම 2 සාමූහික | | මට්ටම 3 | | එකතුව | |
| | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL |
| රු.000 | | | | | | | | |
| බාහිර ශ්‍රේණිගත කිරීමේ ශ්‍රේණිය | | | | | | | | |
| AAA | - | - | - | - | - | - | - | - |
| AA+ | 33,844,401 | 319 | - | - | - | - | 33,844,401 | 319 |
| AA | 5,869,694 | 106 | - | - | - | - | 5,869,694 | 106 |
| AA- | 10,639,602 | 383 | - | - | - | - | 10,639,602 | 383 |
| A+ | 6,612,668 | 453 | - | - | - | - | 6,612,668 | 453 |
| A | 4,747,213 | 616 | - | - | - | - | 4,747,213 | 616 |
| A- | 5,349,040 | 1,277 | - | - | - | - | 5,349,040 | 1,277 |
| BBB+ | 110,176 | 50 | - | - | - | - | 110,176 | 50 |
| BBB | - | - | - | - | - | - | - | - |
| BBB- | - | - | - | - | - | - | - | - |
| BB+ | 110,203 | 271 | | | | | 110,203 | 271 |
| **එකතුව** | **67,282,996** | **3,475** | **-** | **-** | **-** | **-** | **67,282,996** | **3,475** |

| | **2019.01.01** | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මට්ටම 1 සාමූහික | | මට්ටම 2 සාමූහික | | මට්ටම 3 | | එකතුව | |
| | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL |
| රු.000 | | | | | | | | |
| බාහිර ශ්‍රේණිගත කිරීමේ ශ්‍රේණිය | | | | | | | | |
| AAA | 15,629,090 | 7 | - | - | - | - | 15,629,090 | 7 |
| AA+ | 26,790,934 | 228 | - | - | - | - | 26,790,934 | 228 |
| AA | 5,869,264 | 96 | - | - | - | - | 5,869,264 | 96 |
| AA- | 11,037,343 | 360 | - | - | - | - | 11,037,343 | 360 |
| A+ | 7,480,074 | 467 | - | - | - | - | 7,480,074 | 467 |
| A | 4,661,712 | 546 | - | - | - | - | 4,661,712 | 546 |
| A- | 6,358,735 | 1,373 | - | - | - | - | 6,358,735 | 1,373 |
| BBB+ | - | - | - | - | - | - | - | - |
| BBB | - | - | - | - | - | - | - | - |
| BBB- | 573,254 | 714 | - | - | - | - | 573,254 | 714 |
| **එකතුව** | **78,400,407** | **3,792** | **-** | **-** | **-** | **-** | **78,400,407** | **3,792** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

**30.2 ණය ගුණාත්මක විශ්ලේෂණය**

බාහිර ණය වර්ගීකරණ පද්ධතිය පිළිබඳව 2019.12.31 දිනට SLFRS 09 යටතේ විශ්ලේෂණය කරන ලද දළ ශේෂයන් පහත වගුවේ දැක්වෙන අතර, එය සටහන 34.6 හි විස්තර කර ඇත.

| 2019 දෙසැම්බර් 31 | අතීතයේ නියමිත හෝ හානිකරණය නොවූ | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු.000 | **AAA** | **AA+** | **AA** | **AA-** | **A+** | **A** | **A-** | **BBB+** | **BBB** | **BBB-** | **BB+** | එකතුව |
| ආයෝජන වටිනාකම් | | | | | | | | | | | | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | - | 8,812,488 | 5,869,694 | 10,233,069 | 6,612,668 | 4,747,213 | 4,335,860 | 110,176 | - | - | 110,203 | 40,831,370 |
| භාරකාර සහතිකපත් | - | - | - | 406,532 | - | - | - | - | - | - | - | 406,532 |
| ස්ථාවර තැන්පතු | - | 25,031,913 | - | - | - | - | - | - | - | - | - | 25,031,913 |
| මනාප කොටස් | - | - | - | - | - | - | 1,013,181 | - | - | - | - | 1,013,181 |
| බැංකු ශේෂය | - | 2,360,964 | - | 633,548 | 15,951 | - | 337 | - | - | - | - | 3,010,800 |
| | **-** | **36,205,366** | **5,869,694** | **11,273,150** | **6,628,618** | **4,747,213** | **5,349,377** | **110,176** | **-** | **-** | **110,203** | **70,293,796** |
| | | | | | - | | | | | | | |
| ECL වෙන්කිරීම් | | | | | | | | | | | | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | - | 79 | 106 | 368 | 454 | 616 | 1,039 | 50 | - | - | 271 | 2,983 |
| භාරකාර සහතිකපත් | - | - | - | 14 | - | - | - | - | - | - | - | 14 |
| ස්ථාවර තැන්පතු | - | 240 | - | - | - | - | - | - | - | - | - | 240 |
| මනාප කොටස් | - | - | - | - | - | - | 238 | - | - | - | - | 238 |
| බැංකු ශේෂය | - | 23 | - | 12 | 1 | - | - | - | - | - | - | 36 |
| එකතුව | **-** | **341** | **106** | **395** | **455** | **616** | **1,277** | **50** | **-** | **-** | **271** | **3,511** |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

| 2019 ජනවාරි 01 | අතීතයේ නියමිත හෝ හානිකරණය නොවූ | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු.000 | **AAA** | **AA+** | **AA** | **AA-** | **A+** | **A** | **A-** | **BBB+** | **BBB** | **BBB-** | **BB+** | එකතුව |
| ආයෝජන වටිනාකම් | | | | | | | | | | | | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 2,526,568 | 6,283,739 | 5,869,264 | 9,904,749 | 7,480,074 | 4,661,712 | 5,353,462 | - | - | 573,254 | - | 42,652,822 |
| භාරකාර සහතිකපත් | - | - | - | 1,132,594 | - | - | - | - | - | - | - | 1,132,594 |
| ස්ථාවර තැන්පතු | 13,102,522 | 20,507,196 | - | - | - | - | - | - | - | - | - | 33,609,718 |
| මනාප කොටස් | - | - | - | - | - | - | 1,005,273 | - | - | - | - | 1,005,273 |
| බැංකු ශේෂය | - | 2,833,377 | 581,962 | - | 3,718 | - | - | - | - | - | - | 3,419,057 |
| | **15,629,090** | **29,624,312** | **6,451,226** | **11,037,343** | **7,483,792** | **4,661,712** | **6,358,735** | **-** | **-** | **573,254** | **-** | **81,819,464** |
| | | | | | - | | | | | | | |
| ECL වෙන්කිරීම් | | | | | | | | | | | | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ මැනීම | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 1 | 51 | 96 | 324 | 467 | 546 | 1,159 | - | - | 714 | - | 3,359 |
| භාරකාර සහතිකපත් | - | - | - | 36 | - | - | - | - | - | - | - | 36 |
| ස්ථාවර තැන්පතු | 6 | 177 | - | - | - | - | - | - | - | - | - | 183 |
| මනාප කොටස් | - | - | - | - | - | - | 214 | - | - | - | - | 214 |
| බැංකු ශේෂය | - | 25 | 10 | - | 0.24 | - | - | - | - | - | - | 35 |
| එකතුව | **7** | **253** | **106** | **360** | **467** | **546** | **1,373** | **-** | **-** | **714** | **-** | **3,827** |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**31 ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ තක්සේරු කිරීම**

ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ වල ඇස්තමේන්තුගත ගාස්තු අගයන් පහත පරිදි වේ.

| ආයෝජන | පදනම | කොටස් ගණන | මිලදී ගැණුම් පිරිවැය | 2019 කොටසක සාධාරණ අගය | 2019 සාධාරණ අගය | 2018 කොටසක සාධාරණ අගය | 2018 සාධාරණ අගය |
|---|---|---|---|---|---|---|---|
| | | | රු.000 | රු. | රු.000 | රු. | රු.000 |
| කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 500,000,000 | 5,000,000 | 10.47 | 5,235,000 | 10.58 | 5,287,959 |
| කාර්ගිල්ස් බැංකුව | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 44,000,000 | 495,000 | 12.48 | 549,120 | 12.68 | 557,725 |
| වැලිගම හොටෙල් ප්‍රොපටීස් පුද්ගලික සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 45,000,000 | 405,000 | - | - | 2.09 | 93,839 |
| වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 29,750,000 | 2,975,000 | 560.88 | 16,686,180 | 496.61 | 14,774,143 |
| ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ලාභාංශ තක්සේරු ආකෘතිය | 62,500 | 625 | 86.43 | 5,402 | 66.04 | 4,127.40 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් (ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 57,897,800 | 62,282 | 2.71 | 156,903 | 1.08 | 62,281.56 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් (නිඡ්ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 18,041,300 | 19,407 | 2.71 | 48,892 | 1.08 | 19,407.31 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් (ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 57,897,800 | 448,820 | 9.33 | 540,186 | 7.75 | 448,820.06 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් (නිඡ්ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 18,041,300 | 139,855 | 9.33 | 168,325 | 7.75 | 139,855.01 |
| මුළු එකතුව | | | **9,545,989** | | **23,390,009** | | **21,388,157** |

ලබාගත හැකි තොරතුරු සීමා කිරීම හේතුවෙන්, ෆිච් රේටිංග්ස් (FR) ශ්‍රේණිගත කිරීම හැර සෙසු ලැයිස්තුගත නොකළ කොටස් උපකරණවල ගාස්තු වටිනාකම තක්සේරු කිරීමට ශුද්ධ වත්කම් ආකෘතිය භාවිතා කරන ලදී. FR විසින් ලාභාංශ අඛණ්ඩව ගෙවා ඇති අතර, එබැවින් FR හි සාධාරණ වටිනාකම තක්සේරු කිරීම සඳහා ලාභාංශ වර්ධන ආකෘතිය භාවිතා කරන ලදී. ඇස්තමේන්තුගත කිරීම් සඳහා එක් එක් සමාගමේ නවතම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් උපුටා ගන්නා ලදී.

ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ ඉහත ඇස්තමේන්තුගත සාධාරණ අගයන්හි සටහන් කර ඇත්නම්, අනෙක් විස්තීරණ ආදායමට සහ ආයෝජන නැවත ඇගයීමේ සංචිතයට ඇති බලපෑම පහත පරිදි වේ.

**මූල්‍ය ප්‍රකාශන බලපෑම සමස්තයක් ලෙස**

| | 2018 | 2019 |
|---|---|---|
| පිරිවැය | 9,545,989 | 9,545,989 |
| ඇස්තමේන්තුගත සාධාරණ අගය | 21,388,157 | 23,390,009 |
| ශුද්ධ වත්කම්වලට ඇති බලපෑම | 11,842,168 | 13,844,020 |
| සාධාරණ අගයන් වෙනස් කිරීම කෙරෙහි FVOCI වෙත වූ බලපෑම | | 2,001,851 |
| වර්ෂය තුළ විකුණන ලද කොටස්වල සාධාරණ වටිනාකම | | 93,839 |
| | | **2,095,691** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**32.** කළඹේ කල්පිරීමේ පැතිකඩ වර්ගීකරණය

2019 දෙසැම්බර් 31 දිනට

(රු. මිලියන)

| ආයෝජන පංතිය | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2031 | 2032 | 2033 | 2034 | 2035 | 2039 | 2041 | 2043 | 2044 | 2045 | අර්ථ දක්වා නැත | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සුරැකුම්පත් මැනීම | | | | | | | | | | | | | | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 109,903 | 74,653 | 101,716 | 191,255 | 105,610 | 202,001 | 207,334 | 90,094 | 333,704 | 159,587 | 71,313 | 70,362 | 69,458 | 214,180 | 109,401 | 107,120 | 14,074 | 29,314 | 22,824 | 93,062 | 5,494 | - | 2,382,460 |
| සාංගමික ණයකර | 7,451 | 10,645 | 350 | 9,544 | 1,117 | 6,604 | 4,094 | - | 1,025 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 40,831 |
| භාණ්ඩාගාර බිල්පත් | 7,941 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 7,941 |
| භාරකාර සහතිකපත් | 407 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 407 |
| ස්ථාවර තැන්පතු | 25,032 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 25,032 |
| ප්‍රතිමිලදී ගැණුම් | 15,631 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 15,631 |
| මනාප කොටස් | 1,013 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,013 |
| FVTPL හි මනිනු ලබන කොටස් උපකරණ ලැයිස්තුගත කොටස් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 65,907 | 65,907 |
| FVOCI හි මනිනු ලබන කොටස් උපකරණ ලැයිස්තුගත නොකළ කොටස් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 9,141 | 9,141 |
| ලැයිස්තුගත කොටස් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 362 | 362 |
| මුළු එකතුව | **167,377** | **85,299** | **102,066** | **200,800** | **106,727** | **208,605** | **211,429** | **90,094** | **334,729** | **159,587** | **71,313** | **70,362** | **69,458** | **214,180** | **109,401** | **107,120** | **14,074** | **29,314** | **22,824** | **93,062** | **5,494** | **75,410** | **2,548,724** |

| | |
|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සුරැකුම්පත් හානි කිරීම සඳහා ප්‍රතිපාදන | (3) |
| භාතිකරණයේ කළඹ වටිනාකම | **2,548,721** |

‘ඈ’ කොටස

# විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LEW/B/EPF/FA/2019/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 05th October 2020

කම්කරු කොමසාරිස් ජනරාල්,

කම්කරු දෙපාර්තමේන්තුව

අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවක අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

සේවක අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලැබීම් ගෙවීම් ගිණුම, ආයෝජන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 07 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශවල වසර 18 ක් වූ කාලයක් ඇතුළත අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, සෘජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් ශේෂ ලෙස එකතුව රු.මිලියන 10,764 ක් සහ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් එකතුව රු.මිලියන 568 ක් වූ නමුත් මෙම අයිතම හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එක් බැංකු ගිණුමකට අදාළ මුදල් පොත අනුව සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 1,681,817,523 ක් වුවද 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී එම මුදල් පොතේ ශේෂය රු. 1,659,712,768 ක් ලෙස ඇතුළත් කර තිබූ අතර මේ අනුව රු.22,104,755 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

තාක්ෂණික කරුණක් මත ගිණුම්කරණ මෘදුකාංගය 2019 මුල් කාර්තුවේ අක්‍රිය වීම නිසා දත්ත වාර්තා කිරීමේදී වූ මගහැරීමකින් මෙම වෙනස ඇතිවූ බවත් එය 2020 වර්ෂයේදී ගැලපීම් කිරීමට කටයුතු කරන බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) සාමාජික අරමුදල තුල ඇතුලත් ගිණුම් 7 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.මිලියන 89,707 ක් වුවද එම ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු. මිලියන 64,291 ක් වූයෙන් රු. මිලියන 25,416 ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් ඒ සඳහා සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් බාණ්ඩ 04 ක 2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.918,035,505 ක් වුවද, ක්ෂය වෙන්කිරීම සඳහා වූ උපලේඛනයේ එම පිරිවැය රු.574,401,532 ක් වූ බැවින් රු. 343,633,973 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) ස්ථාවර වත්කම් බාණ්ඩ 04 ක් සම්බන්ධයෙන් 2009 සිට 2013 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ මිලදී ගැනීම්, ස්ථාවර වත්කම් ලේඛනයේ නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. ඒ හේතුවෙන් රු.308,804,794 ක් වූ ස්ථාවර වත්කම් වෙන වෙනම දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 වන වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂවල වැරදි නිවැරදි කිරීමේ දී පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක සංඛ්‍යා නිවැරදි කිරීම (restate) සිදුකළ යුතු වුවද ඊට පටහැනිව රු.170,391,828 ක් වූ නාමික බදු සහ රඳවාගැනීමේ බදුවලට (Notional tax and withholding tax) අදාල පෙර වර්ෂවල ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගලපා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කල යුතු වුවත් එසේ සිදු නොකර 2019 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබූ රු. 76,656,104 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ), (ඇ) සහ (උ) යන නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) අරමුදලේ සාමාජික අරමුදල තුල කම්කරු කොමසාරිස් නමින් ගිණුමක දීර්ඝ කාලයක සිට පවත්වාගෙන එන සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන තිබූ 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,711 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමක රඳවා තිබූ රු.මිලියන 398 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 30,435 ක ශේෂයක් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 860 ක් ද ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 1,843 ක් ද ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු. මිලියන 784 ක් ද සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සාමාජිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබූ ඡායාරූප හා ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු Quick Cam Camera 12ක්, 2019 වර්ෂයේදී රු.1,725,375 ක් වැයකර මිලදීගෙන තිබූ Quick Cam Camera 50 ක් හා 2018 වර්ෂයේදී රු. 3,261,600 ක් වැය කර මිලදීගෙන තිබූ Laptop පරිගණක 24 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට බෙදා නොහැර ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) සාමාජිකයන්ට තම ගිණුමේ ශේෂය පිරික්සීම සඳහා KIOSK යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ලංකාව පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 30 ක ස්ථාපිත කර තිබූ KIOSK යන්ත්‍ර සම්බන්ධයෙන් 2019 වර්ෂයේ දී සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී යන්ත්‍ර 27 ක් අක්‍රියව පැවති අතර ඉන් යන්ත්‍ර 5 ක් සවි කරන ලද මුල් කාලයේ සිටම විවිධ හේතු මත අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍ර EWIS ආයතනය විසින් බොහෝ වාර ගණනක් අලුත්වැඩියා කර තිබුණද නිතරම අක්‍රිය වීම හේතුවෙන් සාමාජිකයන්ට තම ශේෂය විමසීම සිදු කිරීමට නොහැකි වී තිබුණි. නිවැරදි ඇගයීම් ක්‍රියාවලියකින් තොරව මිලදීගෙන තිබීම, යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන් (user manual) හා විධිමත් පුහුණුවක් ලබාදී

නොතිබීම, අඛණ්ඩව ප්‍රගතිය ඇගයීමක් සිදු නොකිරීම, යන්ත්‍රයේ භාරකාරිත්ය හා වගකීම නිසි අධිකාරියකට පවරා නොතිබීම සහ නිවැරදි ස්ථාන වල සවිකර නොතිබීම (නැවත ලියාපදිංචි කර ඇති සාමාජික සංඛ්‍යාව සලකා බලා නොතිබීම) යනාදි කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබුණි. එසේම සවිකරන ලද දින සිට වර්ෂ 5 ක් වත් ගතවීමට පෙර මෙලෙස යන්ත්‍ර භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම අරමුදලට අලාභයක් වී තිබුණි.

(ඇ) සාමාජිකයින්ගේ දායක මුදල් සම්බන්ධයෙන් 2012 වර්ෂයේ දී සියයට 11.5 ක ප්‍රතිශතයකින් ගෙවන ලද ප්‍රතිලාභ අනුපාතය 2014 වර්ෂය වන විට සියයට 10.5 දක්වා පහළ ගොස් තිබුණි. 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නොකඩවා එම අනුපාතය පවත්වාගෙන ගොස් තිබුණු අතර 2019 වර්ෂයේදී එම අනුපාතය සියයට 9.25 දක්වා පහළ ගොස් තිබුණි.

මේ සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත යටතේ 2018 අප්‍රේල් 01 දින සිට අරමුදලේ ආදායම් බදු අනුපාතය සියයට 10 සිට සියයට 14 දක්වා ඉහළ යාමත් බදුකරණ ආදායම ගණනය කිරීමේ පදනම වෙනස් වීමත් සැලකිය යුතු ලෙස බලපා ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති විසින් කෙටුම්පත් වාර්තාව සඳහා ලබා දුන් පිළිතුරු මගින් විගණනයට දන්වා තිබුණි.

(ඉ) සාමාජිකයන් ලෙස පෙනී සිටිමින් ව්‍යාජ පුද්ගලයන් විසින් ප්‍රතිලාභ මුදල් නිදහස් කරගෙන තිබූ අවස්ථා 64 ක් හඳුනාගෙන තිබූ අතර එයින් අවස්ථා 61 ක් වෙනුවෙන් 2004 නොවැම්බර් 04 සිට 2020 පෙබරවාරි 20 දක්වා අරමුදලට වැය බරක් වන ලෙස රු. 52,316,484 ක් ගෙවා තිබූ අතර අවස්ථා 3 කට අදාළව රු.3,393,727 ක මුදලක් තවදුරටත් ගෙවීමට පැවතුණි. එම අවස්ථා සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට හා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වුවහොත් ඔවුනට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කර තිබුණු අන්තර්ජාලය හරහා ගිණුම් ශේෂය පිරික්සීමේ පහසුකම සම්බන්ධයෙන් විධිමත් පරිදි ප්‍රචාරණ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් එම ක්‍රමය සාමාජිකයන් අතර ජනප්‍රිය වී නොතිබුණි. එසේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සාමාජිකයන්ගේ ගිණුම් ශේෂය පිරික්සීම සඳහා සවිකරන ලද KIOSK යන්ත්‍ර ද වැඩි ප්‍රමාණයක් අක්‍රීයව පැවතීමෙන් එම යන්ත්‍ර භාවිතයෙන් ගිණුම් ශේෂය දැනගැනීමේ පහසුකම ද අපේක්ෂා කල පරිදි සාමාජිකයන්ට ලැබී නොතිබුණි. ඒ අනුව මිලියන 2.6 ක් පමණ වන සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයන්ට තම ගිණුම් ශේෂය විමසීමට කඩිනම් හා පහසු ක්‍රමයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති